## ප්‍රාථමික කර්මාන්ත සහ
## සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

# කාර්ය සාධන වාර්තාව
# 2018


**1 වන මහල**

**සෙත්සිරිපාය අදියර II**

**බත්තරමුල්ල**

**දුරකථන :011 2887349 – 51**

**විද්‍යුත් තැපැල :msesecretary@sltnet.lk**

# පටුන


| | | |
|---|---|---|
| අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර | | iv |
| අමාත්‍යාංශයේ කාර්යයන් | | V |
| අමාත්‍යාංශය යටතේ ඇති අංශ, ව්‍යවස්ථාපිත ආයතන හා දෙපාර්තමේන්තු | | Vi |
| අමාත්‍යාංශයේ සංවිධාන සටහන | | Vii |
| හැඳින්වීම | | Viii – x |
| භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 2018 | | |
| 01 | සමාජ සවිබලගැන්වීම් අංශය | 1 – 21 |
| 1.1 | පාලන අංශය | |
| 1.2 | ගිණුම් අංශය | |
| 1.3 | අභ්‍යන්තර විගණන අංශය | |
| 1.4 | පර්යේෂණ, සංඛ්‍යාලේඛන හා සැලසුම් අංශය | |
| 1.5 | මානව සම්පත් සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය | |
| 1.6 | සමෘද්ධි සංවර්ධන අංශය | |
| 02 | ග්‍රාම සංවර්ධන, අභ්‍යාස හා පර්යේෂණ ආයතනය | 22 – 25 |
| 03 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 26 – 45 |
| 04 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 46 – 58 |
| 05 | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | 59 – 63 |
| 06 | ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සුභසාධන අංශය | 64 – 83 |
| 07 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 84 – 92 |
| 08 | කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතිය | 93 - 95 |
| 09 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 96-103 |

# දැක්ම

වසර 2030 වන විට දිළිඳු බවින් තොර අයිතිවාසිකම් සුරක්ෂිත ශ්‍රී ලංකාවක්

# මෙහෙවර

සමාජ සවිබලගැන්වීම සහ සුබසාධනය සඳහා නායකත්වය සපයමින් අවාසි සහගත පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම, සමාජ වැඩ අධ්‍යාපනය පිළිබඳ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම, අවිධිමත් අංශයේ රැකියා නියුක්තිකයන්ට සමාජ ආරක්ෂණය සැපයීම, ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රජා සහභාගීත්වය ශක්තිමත් කිරීම, වැඩිහිටියන් සහ ආබාධ සහිත පුද්ගලයන් ඇතුළු ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම්වල සුබසාධනය ඉහළ නැංවීම සහ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ අපනයන කෘෂිකර්ම අංශයෙන් විදේශ විනිමය ඉපැයීම ඉහළ නැංවීම.

# අමාත්‍යාංශයේ කාර්යයන්

(2018.12.28අංක 2013/33 සහ 2019.01.16 අංක 2106/9දරණ අති විශේෂ ගැසට් පත්‍රඅනුව)

1. ග්‍රාමීය ජනදිවිය සවිබල ගැන්වීම පිණිස ක්‍රමෝපායන් හඳුන්වා දීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට මූලාධාර සම්පාදනය කිරීම.
2. ජීවනෝපාය සංවර්ධනය තුළින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා සුදුසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. ග්‍රාමීය සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
4. ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
5. සමෘද්ධි සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
6. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ දුබලතාවයන් හඳුනාගැනීම හා පුනරුත්ථාපනය සිදු කිරීම.
7. මහජන ආධාර යෝජනා ක්‍රමය සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
8. ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා සහ තැලිසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබා දීම.
9. පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.
10. ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අවශ්‍ය ක්‍රමෝපායන් සැලසීම.
11. ආබාධ සහිත පුද්ගලයින්ට සාමාන්‍ය ජන සමාජය හා අනුගත වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
12. ආබාධ සහිත පුද්ගලයින් ප්‍රධාන ජන ප්‍රවාහය හා එක්ව කටයුතු කිරීමට හැකිවන සේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් උචිත ක්‍රමෝපායන් යොදා ගනිමින් සිදු කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු වැඩසටහන් සම්පාදනය කොට දියත් කිරීම.
13. ආබාධ සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන්වලට අදාළ කටයුතු.
14. ආබාධිතයින් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
15. වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම.
16. ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් විෂයයට සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
17. අගය එකතු කිරීම, අපනයන වෙළඳපොළ අවස්ථා වැඩි දියුණු කිරීම, කර්මාන්ත සුරක්ෂිතභාවය ඇති කරමින් ගොවීන්, ධීවරයින් සහ කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයින් ගෝලීය ආර්ථිකය වෙත යොමු කිරීම සඳහා ප්‍රතිපත්ති, උපායමාර්ග සම්පාදනය කිරීම.
18. අගය එකතුකල නිෂ්පාදනය ද ඇතුලුව තිරසාර සම්පත් භාවිතය සහ ජෛව ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
19. කෘෂිකාර්මික සංවර්ධන කළාප සහ ධීවර අපනයන සංවර්ධන කළාප සම්බන්ධ කටයුතු.
20. විශේෂයෙන් නැගෙනහිර පළාත තුළ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මගින් ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා වන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
21. භූ සම්පත්හි තිරසාර භාවිතය ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
22. අමාත්‍යාංශයට අයත් ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු.
23. අමාත්‍යාංශයට අයත් ආයතනයන් අධීක්ෂණය කිරීම.

## අමාත්‍යාංශය යටතේ ඇති අංශ, ව්‍යවස්ථාපිත ආයතන හා දෙපාර්තමේන්තු

### 1.සමාජ සවිබලගැන්වීම් අංශය

I. පාලන අංශය
II. ගිණුම් අංශය
III. අභ්‍යන්තර විගණන අංශය
IV. මානව සම්පත් සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය
V. පර්යේෂණ, සංඛ්‍යාලේඛණ හා සැලසුම් අංශය
VI. සමෘද්ධි සංවර්ධන අංශය
VII. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
VIII. ජාතික සමාජ සංවර්ධන ආයතනය
IX. ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය
X. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

### 2.ප්‍රාථමික කර්මාන්ත අංශය

I. ප්‍රාථමික කර්මාන්ත අංශය
II. අපනයනකෘෂිකර්මදෙපාර්තමේන්තුව
III. කෘෂිකර්මඅංශය නවීකරණ ව්‍යාපෘතිය
IV. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය

### 3. සමාජ සුභසාධන අංශය

I. සමාජ සේවා දෙපාර්තමේන්තුව
II. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය
III. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය
IV. උපදේශන අංශය

# හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2103/33 හා 2018.12.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ස්ථාපිත කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ විෂය පථය 2019 වර්ෂයේ ජනවාරි මස සිදු කරන ලද අමාත්‍ය මණ්ඩල සංශෝධනයට සමගාමීව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රිත සමාජවාදි ජනරජයේ අංක 2106/9හා 2019.01.16දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුවප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ස්ථාපිත විය. ඒ අනුව මෙම අමාත්‍යාංශයේ වැඩසටහන් සමාජ සවිබලගැන්වීම, සමාජ සුභසාධනය හා ප්‍රාථමික කර්මාන්ත යන විෂය ක්ෂේත්‍ර 03 යටතේ ක්‍රියාත්මක වෙයි.

ශ්‍රී ලංකාවේදිළිඳු සහආන්තිකරණයට ලක් වූ ජනතාව සවිබලගැන්වීම, ඔවුන්ගේ සුභසාධනය, අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රාථමික කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය අරමුණු කරගෙන කාර්යක්ෂම හා ඵලදායී මෙන්ම ජනහිතකාමී සමාජයීය හා ආර්ථිකමය සේවාවන් සපයමින් මෙම අමාත්‍යාංශය කටයුතු කරනු ලැබේ.

වසර 2030 වන විට, දිළිඳු බවින් තොර, අයිතිවාසිකම් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් යන දැක්ම පෙරදැරිවමෙම අරමුණ ඉටු කිරීම වෙනුවෙන් අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු/ආයතන සහ අංශ මඟින් වැඩසටහන් සහ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරමින් සුවිශාල දායකත්වයක් ලබාදෙනු ලබයි.

අඩු ආදායම්ලාභීන් සමාජීය හා ආර්ථික වශයෙන් සවිබලගැන්වීම, සමාජ වැඩ වෘත්තිකයින් බිහි කිරීම, තිරසාර ග්‍රාම සංවර්ධනය උදෙසා ප්‍රජාව සවිබල ගැන්වීම සහ රජයේ විශ්‍රාම වැටුප් නොලබන විවිධ රැකියාවල නියුක්තවූවන්ට සමාජ ආරක්ෂාව සැපයීම සමාජ සවිබල ගැන්වීම් අංශය මඟින් සිදු කරයි.

අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමෙහි ලා දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා ශක්තිය සපයන දැවැන්තම සංවර්ධන ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමටසමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි.

සමෘද්ධි සංවර්ධන අංශය මඟින් සමෘද්ධි ප්‍රතිලාභීන් ජීවත්වන දුෂ්කර ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල දී  ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය ගොඩනැගීම සිදු කරනු ලබයි.

මානව සම්පත් සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය මඟින් අමාත්‍යාංශයේ කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම පිණිස අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනයන්හි නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කර ඔවුන්ගේ සේවාවන් ඵලදායි අන්දමින් යොදාගැනීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

සමාජ වැඩ විෂය මූලික කරගනිමින් රටට අවශ්‍ය සමාජ වැඩ හා සමාජ සුභසාධන වෘත්තිකයන් බිහිකිරීම උදෙසා සමාජ වැඩ පිළිබඳ අධ්‍යාපනය ලබාදෙන ප්‍රමුඛතම ආයතනය වන්නේ ජාතික සමාජ සංවර්ධන ආයතනයයි.

තව ද ප්‍රජාව සවිබලගන්වා තිරසාර ග්‍රාම සංවර්ධනයක් උදෙසා ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලබාදීමේ දිගුකාලීන අත්දැකීම් සහිත ආයතනයක් ලෙස ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය සිය කාර්යභාරය ඉටුකරනු ලබමින් සිටී.

රජයේ විශ්‍රාම වැටුප් නොලබන ස්වයං රැකියාවල නියුක්තවූවන්, වැඩිහිටි පුද්ගලයින්, අවාසි සහගත පුද්ගලයින්, තනි මාපියන්, විදේශ සේවා නියුක්තිකයින්, කලාකරුවන් ආදී සෑම සේවා නියුක්තිකයෙකුම වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයයි.

මේ ආකාරයට සමාජයේ ජීවත්වන දිළිඳු පුද්ගලයින් සඳහා සමාජයීය හා ආර්ථිකමය වශයෙන් සක්‍රීය දායකත්වයක් සමාජ සවිබල ගැන්වීම් අංශය මඟින් සිදු කරනු ලබයි.

එමෙන්ම 2015 වසරේ ස්ථාපිත ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයට 2018 වර්ෂයේදී සමාජ සුභසාධන විෂය පථය එක් කළ අතර, ආර්ථිකයේ කොඳු නාරටියක් බඳුවූ අපනයන ක්ෂේත්‍රයේ කෘෂි, ධීවර හා සත්ත්ව නිෂ්පාදන අංශයන්හි අගයදාමයන් ශීඝ්‍ර වර්ධනයකට යොමු කරමින් 2025 වසර වනවිට රටේ අපනයන ආදායම දෙගුණයක් දක්වා ඉහළ නංවමින් වාර්ෂික අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 25 ක් දක්වා වැඩි කිරීමේ ඉලක්කයන් සමගින් ප්‍රාථමික කර්මාන්ත අංශයේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ප්‍රාථමික කර්මාන්ත ක්ෂේත්‍රයේ සිටින සියළු කර්මාන්තකරුවන් හා ව්‍යාපාරිකයන් මෙහෙයවමින් කෘෂි, ධීවර හා සත්ත්ව නිෂ්පාදන ඇතුළු ප්‍රාථමික කර්මාන්තයන්හි නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීමත්, අගය එකතු කළ නිෂ්පාදන ගෝලීය වෙළෙඳ පොළට ප්‍රවිශ්ඨ කරවීමත් තුළින් අපගේ විදේශ විනිමය සංචිතය ඉහළ නැංවීම සහ ක්ෂේත්‍රයේ නියැළි සියළු පාර්ශවකරුවන්ට යහපත් හෙටක්, තිරසාර ජීවන පැවැත්මක් තහවුරු කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති, සැළසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීමත් මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි, සාදික්කා, එනසාල්, කෝපි, කොකෝවා, පුවක්, පැඟිරි, වැනිලා, සේර, බුලත්, ගොරකා, කිතුල්, ඉඟුරු හා කහ යන බෝග අපනයනය සඳහා විශේෂ අවධානයක් යොමු කෙරේ. ඒ සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම , නව නිපැයුම් හා ඉහළ අස්වැන්නක් ලබා දෙන ප්‍රභේද හඳුන්වා දීම ප්‍රධානතම වගකීම වන අතර අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා පර්යේෂණ සංවර්ධන කටයුතු හා ව්‍යාප්ති සේවා සැපයීම අඛණ්ඩව සිදු කරනු ලබයි.අපනයන කෘෂිකාර්මික බෝග වගාකිරීම, පිරිසැකසුම්කරණය, අගය එක් කරමින් නිමි භාණ්ඩ සැකසීම හා වෙළඳාමේ අතරමැදියන් වශයෙන් කටයුතු කරමින් ජීවනෝපාය සලසා ගන්නා මිලියන දෙකක් පමණ පාර්ශවකරුවන්ගේ ජීවන තත්ත්වය සුරක්ෂිත හා ශක්තිමත් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ.

කෘෂිකර්ම අංශයේ නව්‍ය අදහස් සහිත ව්‍යවසායකයන් හා කෘෂිකර්ම නිෂ්පාදන සංවිධාන සඳහා අපනයන අවස්ථා ඉහළ නැංවීමට මුළු ආයෝජනයට අනුව ප්‍රදානයක් ලබා දීම අරමුණු කොට ගෙන කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. කෘෂිකාර්මිකක්ෂේත්‍රයේඅගයදාමසංවර්ධනය,ඵලදායිතාවයවැඩිදියුණුකිරීම, විවිධාංගීකරණයසහවාණිජකරණය සහ ව්‍යාපෘතිකළමනාකරණය, අධීක්ෂණයහාඇගයීම යන සංරචක 03 ක් සමඟ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙයි.

එමෙන්ම මෙරට සමස්ථ ජනගහනයෙන් මිලියන 2.5 ක් පමණ වන වැඩිහිටි ප්‍රජාව හෙවත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේත්, මිලියන 1.7ක් පමණ වන ආබාධ සහිත පුද්ගලයන්ගේත්, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේත්, මානසික ආතතිය හා පීඩනයන්ට ගොදුරුවූවන්ගේත්, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන්ගේත් සමාජ සුභසාධනය, සුරක්ෂිතතාවය, පුනරුත්ථාපනය හා තිරසර ජීවන පැවැත්ම උදෙසා අවශ්‍ය සුභසාධන වැඩසටහන්, පුනරුත්ථාපන වැඩසටහන්, ජීවන තත්ත්වය තහවුරු කිරීම හා ඉහළ නැංවීම සඳහා වන ආර්ථික සංවර්ධන වැඩසටහන් ආදී සමාජ සුභසාධන වැඩසටහන් සමාජ සුභසාධන අංශය මඟින් ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව ආබාධ සහිත තැනැත්තන්ගේ වෘත්තීය නිපුණතා වැඩිදියුණු කිරීම හා ඔවුන් ස්වාධීන පුරවැසියන් බවට පත් කිරීම, මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම, විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ සංවර්ධනය සඳහා පූර්ව මැදිහත්වීම ඇතුළු සමාජ සංවර්ධන අරමුණු පෙරදැරිව සමාජ සේවා දෙපාර්තමේන්තුව සිය කාර්යයන් මෙහෙයවමින් සිටී.

එසේම සමාජයේ ජීවත්වන අවාසි සහගත පුද්ගලයන්ට හිතකර පරිසරයක් උදාකර දීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඇතුළු සහන සැලසීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය සතු කාර්යභාරය වේ.

ශ්‍රී ලාංකික වැඩිහිටි ප්‍රජාවගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය,සහභාගිත්වය හා අභිමානය ඇති කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් තුළින් ඔවුන්ව උනන්දු කරලීම සහ වැඩිහිටියන් සුරක්ෂිත කිරීමට අවශ්‍ය දායකත්වය සපයනු ලබන්නේ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය මඟිනි.

පවත්නා සමාජ ආර්ථික පරිසරය හා තාක්ෂණික ලෝකය තුළ මානසික ආතතිය හා පීඩනයට පත් දරුවන් හා අනෙකුත් පුද්ගලයින් ඉන් මුදවා ගැනීම උදෙසා ප්‍රමිතිගත උපදේශන සේවාවන් සැපයීම වෙනුවෙන් පැය 24 පුරා ක්‍රියාත්මක වන ජංගම දුරකථන සේවාව ඇතුලු උපදේශන වැඩසටහන් හා සේවාවන් පවත්වාගෙන යාම උපදේශන අංශය මඟින් සිදු කරනු ලබයි.

සමාජ සවිබලගැන්වීම්, ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සුභසාධන අංශ මඟින් 2018 වර්ෂය තුළ සිදුකරන ලදසංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය මෙම වාර්තාව සඳහා ඇතුළත් කර ඇත.

01

# සමාජ සවිබලගැන්වීම් අංශය





# සමාජ සවිබලගැන්වීම් අංශය

## 01.1 පාලන අංශය

### 1.1.1 හැඳින්වීම

අමාත්‍යාංශයේ පරිපාලන, ආයතන, ප්‍රවාහන හා තොරතුරු තාක්ෂණ කටයුතු මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම, අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතනවල පරිපාලන හා ආයතනික කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය කිරීම මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි.

### 1.1.2 අරමුණු

i. අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශයට අයත් සියළුම ආයතනවල කාර්ය මණ්ඩලයට අදාළ ආයතනික හා පරිපාලන කටයුතු මෙහෙයවීම.
ii. දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම තුළින් මානව සම්පත් හැකියා සංවර්ධනය කිරීම .
iii. අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ, පනත් කෙටුම්පත් ආදිය නිසි පරිදි ඉදිරිපත් කිරීම මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම.
iv. අමාත්‍යාංශයේ කාර්යයන් පවත්වා ගෙන යාමට අවශ්‍ය මානව සම්පත් හා යටිතල පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.
v. අමාත්‍යාංශයට අයත් සියළුම ආයතන සම්බන්ධීකරණය කිරීම.

### 1.1.3 උපායමාර්ග

i. අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම හා එම තොරතුරු නිසි පරිදි යාවත්කාලීන කිරීම.
ii. කාර්යාලීය උපකරණ, සන්නිවේදන උපකරණ හා යටිතල පහසුකම් අවශ්‍යතා හඳුනා ගැනීම හා ඒ අනුව අවශ්‍ය කටයුතු කිරීම.
iii. කාර්ය මණ්ඩල අභිප්‍රේරණය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
iv. අමාත්‍යාංශයට ලැබෙන හා පිටතට යැවෙන තැපැල නිසි පරිදි විධිමත්ව බෙදා හැරීම තුළින් අදාළ අංශවල කටයුතු කාර්යක්ෂම කිරීම.
v. වාහන නිසි පරිදි නඩත්තු කිරීම, අළුත්වැඩියාව, නඩත්තුව හා අවශ්‍යතාව අනුව කාර්යයන් සඳහා වෙන් කිරීම.
vi. නිසි පරිදි කාර්ය මණ්ඩලය ස්ථානගත කිරීම.

### 1.1.4 2018.01.01 සිට 2018.12.31 දක්වා වර්ෂය තුළ අත් කරගත් නිමැවුම

i. විදේශ පුහුණු පාඨමාලා 36 ක් සඳහා අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශයට අයත් ආයතනවල නිලධාරීන් 125 ක් සහභාගී කරවීම.
ii. අමාත්‍ය මණ්ඩල සංදේශ 26 ක් ඉදිරිපත් කිරීම.
iii. රාජ්‍ය කළමනාකරණ සහකාර නව පත්වීම්ලාභීන් 12 දෙනෙකු සම්බන්ධව ආයතනික කටයුතු සිදු කිරීම හා සේවා අවශ්‍යතා පරිදි අංශවලට අනුයුක්ත කිරීම.

iv. අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පැවති කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු 04 ක් සඳහා විධිමත් පරිදි සම්මුඛ පරීක්ෂණ පවත්වා නිළධාරීන් 04 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම.

v. අමාත්‍යාංශය වෙත ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 16ක් හා ස්ථාන මාරුවී ගිය නිලධාරින් 19ක් සම්බන්ධව ආයතනික කටයුතු සිදු කිරීම.

vi. නිලධාරීන් දෙදෙනෙකු වයස 60 සම්පූර්ණ වීම මත රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වීමට අදාළ ආයතන කටයුතු සිදු කිරීම.

vii. අංක 2070/56 හා 2018.05.12 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුව උපදේශන අංශය, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය හා ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යටතටත් කන්ද උඩරට උරුමය සුරැකීම පිළිබඳ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය විද්‍යා තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය යටතට පැවරිණි.

ඒ අනුව සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයට නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු 291 ක් ආයතනික කටයුතු අවසන් කර ලබා දෙන ලදී. තාක්‍ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයට නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු 8 ක ආයතනික කටයුතු අවසන් කර ලබා දීම.

viii. අනතුරුව නිකුත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදන අංක 2096/68 හා 2018.11.09 අනුව සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ආයතන සහ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු 291 ක් නැවත එකතු වීම මත ආයතන කටයුතු ඉටු කිරීම.

ix. අමාත්‍යාංශයේ ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන්ගේ දෙවන භාෂාව සඳහා වන කඩඉම සම්පූර්ණ කිරීම සඳහා පැය 50ක දෙමළ භාෂා පාඨමාලාවක් පැවැත්වූ අතර ඒ සඳහා රියදුරු/කා.සේ.සේ නිලධාරීන් 23ක් සහභාගි කරවීම.

x. සමාජ සේවා විෂයට අදාළව ආයතන 1 ක් සඳහා තීරු බදු සහන ලබා දීම.

xi. පෞද්ගලික මන්ත්‍රී කෙටුම්පත් ලැබෙන පරිදි නීති කෙටුම්පත් සම්පාදන, නීතිපති වෙත යොමු කිරීම.

xii. අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් වෙත නිසි වෙලාවට වැටුප් වර්ධක ලබාදීම.

## 1.1.5 අපේක්ෂිත සමාජ ආර්ථික ප්‍රතිඵල

කාර්යක්ෂම ලෙස මානව සම්පත හා මූල්‍ය කළමනාකරණ තුළින් අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ හා ආයතනවල අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

## 1.1.6 ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑ අභියෝග

i. අංක 2070/56 දරණ 2018.05.12 අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව මෙම අමාත්‍යාංශය සමාජ සවිබල ගැන්වීම් වශයෙන් නම් කෙරුණු අතර ඊට අදාළව සියළුම අංශවල විෂයයන් හා කාර්යයන් අදාළ පරිදි කෙටි කාලයක් තුළ අවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනාගෙන අනුමත කර ගැනීම සහ භෞතික සම්පත් නිසි පරිදි කළමනාකරණය කර ගැනීම.

ii. අනතුරුව නිකුත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදන අංක 2096/68 හා 2018.11.09 අනුව සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යටතේ වූ ආයතන සහ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු 289 ක් නැවත එකතු වීම හා එහි ආයතන කටයුතු සිදු කිරීම.

### 1.1.7 ලබාගත් සමස්ථ ජයග්‍රහණ

i. සීමිත සම්පත් ප්‍රමාණය අවශ්‍යතාවය අනුව නිසි පරිදි කළමනාකරණය කිරීම.
ii. සියළුම කාර්ය මණ්ඩලයේ ආයතනික කටයුතු නිසි වේලාවට සිදු කිරීම.
iii. අමාත්‍යාංශයේ සමස්ථ කාර්ය මණ්ඩලය අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම.

## 1.2 ගිණුම් අංශය

### 1.2.1 හැඳින්වීම

සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය සඳහා මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිදභාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වා ගෙන යාම පැවරී ඇති අංශය ගිණුම් අංශය වේ.

මෙහි ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ සහ ප්‍රධාන ගණකාධිවරයාගේ මගපෙන්වීම, කළමනාකරණය, අධීක්ෂණය හා මෙහෙය වීම මගින් ගිණුම් කටයුතු සිදුවන අතර, අමාත්‍යාංශයේ ගිණුම් කටයුතු සහ සමස්ථ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට අමතරව, ව්‍යවස්ථාපිත ආයතන හා මණ්ඩලවල ගිණුම් සුපරීක්ෂණය සිදුකරනු ඇත. මේ සඳහා ප්‍රධාන ගණකාධිකාරීවරයා සමග අයවැය සහකාරවරයෙකු, සැපයුම් සහකාරවරු දෙදෙනෙකු, සංවර්ධන නිලධාරිවරු සිව්දෙනෙකු මෙන්ම කළමනාකරණ සහකාරවරු අට දෙනෙකු සමඟ කාර්යාල කාර්යය සහකාරවරු තිදෙනෙකු සක්‍රිය සේවයක් සපයනු ලබයි.

### 1.2.2 ප්‍රධාන අරමුණු

2018 වර්ෂය තුළදී සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ සමාජ සංවර්ධන මෙහෙවර සහ දැක්ම සඳහා මුදල් රෙගුලාසි, විශේෂ විධි විධාන හා රජයේ චක්‍රලේඛ මඟින් ලබාදී ඇති බලතල අනුව,

i. අමාත්‍යාංශයට අයත් සමස්ථ වාර්ෂික අයවැය ලේඛනය සකස් කර නියමිත දිනට ප්‍රථම ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.
ii. සියළුම ගණුදෙනු නිවැරදි හා යාවත්කාලීනව ගිණුම් තැබීම හා ගිණුම් ඉදිරිපත් කිරීම.
iii. මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමට ඉහළ කළමනාකරණය වෙත සහය වීම.
iv. සියළුම ලැබීම් හා වියදම් අධීක්ෂණය සහ වියදම් පාලනය.
v. වියදම් සමාලෝචනය සඳහා ඉහළ කළමනාකරණය වෙත යෝජනා ඉදිරිපත් කිරීම.
vi. මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණ කටයුතු කිරීම.
vii. සියළුම මිලදී ගැනීම් වලදී විනිවිදභාවයෙන් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් මූල්‍ය නීතිරීති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම හා සහාය වීම.
viii. දිවයින පුරාම විහිදී ඇති සහනාධාර ලබන ප්‍රතිලාභීන්ගේ ප්‍රතිලාභ නියමිත දිනට සහ වෙලාවට ඔවුන් වෙත ලබාදීම සඳහා සහය ලබාදීම.
ix. අමාත්‍යාංශය යටතේ පවතින රජයේ වත්කම් යාවත්කාලීන කිරීම, ආදායම් එකතු කිරීම හා සුපරීක්ෂණය.
x. අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයට අයත් ආයතන වල මූල්‍ය හා ගිණුම් කටයුතු නිවැරදිව පවත්වා ගෙන යාමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීම.

## 1.2.3 උපායමාර්ග

i. රජය හඳුන්වා දී ඇති ගිණුම් පද්ධති නිවැරදිව හා නිවැරදි කාල පරාසයන් තුළ මෙහෙයවා, පවත්වා ගෙන යාම තුළින්, එහි පවතින සඵලතාවයන් අංශයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට යොදා ගැනීම.

ii. ගිණුම් පොත් හා ගිණුම් ලේඛන සැසඳීම මගින් ප්‍රතිපාදන සීමාවන් තුළ කටයුතු කිරීම.

iii. වියදම් බහුල වැය විෂයන් සඳහා අතිරේක ප්‍රතිපාදන සපයා ගැනීමට අවශ්‍ය කළමනාකරණ තීරණ නිවැරදි ලෙස ගැනීම සහ ඉහළ කළමනාකරණය දැනුවත් කිරීම.

iv. රජයේ ප්‍රතිපත්ති හා මූල්‍ය රෙගුලාසි නිසි ලෙස අධ්‍යයනයකින් යුතුව නියමිත දිනට, වෙලාවට හා අංශයට /ආයතනයට යොමුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම.

v. නිවැරදි වැඩ බෙදීමක් සිදුකිරීම මගින් සමාන කාර්යන් ගැටීමකින් තොරව පවත්වා ගෙන යාමට පියවර ගැනීම හා ඉහළ කළමනාකරණ උපදෙස් පිළිපැදීම.

vi. සියළුම විෂයන් සම්බන්ධව නිවැරදි අධීක්ෂණයක් සිදුකිරීම මගින් පමා වූ වැඩ ඒකක වල ප්‍රවර්ධනය සඳහා කළමනාකරණ තීරණ ගැනීමට ඉහළ අධීක්ෂණ නිලධාරීන්ගෙන් උපදෙස් ලබාගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vii. දීප ව්‍යාප්ත වැඩසටහන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රදේශීය ලේකම් කාර්යාල සමඟ ජාලගත ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම. මේ සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ සෘජු / වක්‍ර ආකාරයෙන් සහය ලබාගැනීම.

viii. අමාත්‍යාංශය යටතේ පවතින සංවර්ධන ව්‍යාපෘති සහ මෙහෙයුම් වැඩ සඳහා නිරන්තරයෙන්ම ලේකම්, අතිරේක ලේකම්වරුන් ගේ උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමුකරන අතර ඒ අනුව විෂයභාර අධ්‍යක්ෂවරුන් සමඟ නිරන්තරයෙන් අදහස් හුවමාරු කරගනිමින් මූල්‍ය විනයට අවශ්‍ය ක්‍රියාමාර්ග විනිවිදභාවයකින් යුතුව ගැනීම.

ix. සියලුම වැය විෂයන්වල මාසික වියදම් වාර්තා පවත්වා ගනිමින්, වියදම් පිළිබඳව විශ්ලේෂණයක් මාසිකව සිදුකරන අතර ඒ අනුව අවශ්‍ය ප්‍රගතීන් වෙත ලඟා නොවූ ව්‍යාපෘතිවල ප්‍රගතිය වැඩි කිරීම සඳහා ඉහළ කළමනාකරණයට යොමු කිරීම.

x. වාර්ෂිකව වෙන් වන ප්‍රතිපාදන නියමිත දින / කාර්තු වලට අනුව වියදම් නොවන්නේ නම් එම ප්‍රතිපාදන වෙනත් අත්‍යවශ්‍ය වැය විෂයන් සඳහා මුදල් රෙගුලාසි 66/69 විධිවිධානවලට අනුව මාරුකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

xi. ගිණුම් අංශය තුළ සේවය කරන නිළධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීමට පුහුණු වීම් සඳහා යොමුකර කාර්ය සාධනය ප්‍රවර්ධනය කර සේවයට යොදා ගැනීම.

## 1.2.4 2018.01.01 සිට 2018.12.31 දක්වා අත්කරගත් නිමැවුම

i. ශීර්ෂ අංක 124 යටතේ පවතින අමාත්‍යාංශ වැය විෂයන් වල 2017 වර්ෂයේ අයවැය මගින් වෙන් වන ලද පුනරාවර්තන ප්‍රතිපාදන වලින් 97% ප්‍රගතියක උපයෝජනයක් පෙන්නුම් කර තිබුණි. මෙම තත්ත්වය 2018 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට ලබා ඇති උපයෝජනය 93.50% ක් වී ඇත.

ii. ශීර්ෂ අංක 124 යටතේ මූලධන ප්‍රතිපාදන ප්‍රමාණය 2017 වර්ෂයට සමාන්තරව 2018 ප්‍රවර්තන වර්ෂයේ ද පවත්වා ගැනීමට සමත්වී ඇති අතර එම ප්‍රතිපාදනය වලින් 2018 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට රු.මි. 333.39 උපයෝජනයක් ලබාගැනීමට හැකි වී ඇත.

iii. පවත්නා වර්ෂයේ විගණකාධිපති වෙත වාර්තා කළයුතු ගිණුම් වාර්තා අතර 2017 විසර්ජන ගිණුම, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ වාර්ෂික වාර්තාව සහ සියළුම විගණන විමසුම් වලට පිළිතුරු නියමිත දිනට ප්‍රථම ලබාදීමට හැකිවීම.

iv. සංවර්ධන සහ මෙහෙයුම් වැඩ සඳහා අවශ්‍ය අක්මුදල් 2018-12-31 දින වන විට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් ලෙස ලබා ගැනීමට හැකි වී ඇත.

| පුනරාවර්තන රු. | මූලධන රු. | අත්තිකාරම් බී ගිණුම. රු. | විදේශ අරමුදල් | මුළු අක්මුදල් ප්‍රමාණය රු. |
|---|---|---|---|---|
| 313,970,000/- | 330,000,000/- | 7,900,000/- | - | 651,870,000/- |

v. ප්‍රසම්පාදන සැලසුම් හා චක්‍රලේඛ උපදෙස් අනුව නියමිත දිනයන් තුළ ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමට හැකි වීම.

vi. 2017 වර්ෂය සඳහා පවත්වන විගණන විමසුම් වලදී ගිණුම් කටයුතු පිළිබඳව විගණන විමසුම් ඉදිරිපත් වීම අඩුකර ගැනීමට හැකි වීම.

### 1.2.5 අනුමත වාර්ෂික අයවැය - 2018

| මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | මුළු පුනරාවර්තන ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) |
|---|---|
| 625.27 | 516.34 |

### 1.2.6 2018.01.01 සිට 2018.12.31 දක්වා වියදම් තත්ත්වය

මේ අනුව 2018 වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විට ශීර්ෂ අංක 124 යටතේ ලබාගෙන ඇති ප්‍රතිපාදන විස්තර පහත සඳහන් වේ.

| *වියදම් වර්ගය* | *ඇස්තමේන්තු ප්‍රතිපාදන රු.* | *අතිරේක ප්‍රතිපාදන රු.* | *මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.* | *2018 වර්ෂයේ දෙසැම්බර් 31 ට මුළු වියදම. රු.* |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 516,336,443/- | - | 516,336,443/- | 478,695,863/- |
| මූලධන වියදම. | 625,270,000/- | - | 625,270,000/- | 333,388,793/- |
| සමස්ථ වියදම | 1,141,606,443 /- | - | 1,141,606,443 /- | 812,084,656 /- |

## 1.2.7 ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑ අභියෝග

i. ඉදිරි වර්ෂයට ඇස්තමේන්තු කිරීම මාස 10 කට ප්‍රථම සිදුකරන බැවින් පවත්නා වර්ෂයේ අපේක්ෂිත අගයන් ඉදිරි වර්ෂයේදී කාලානුරූපව වෙනස් වීම නිසා ඇස්තමේන්තු ගත වැය විෂයන්ගේ වියදම් අවශ්‍යතාවය වෙනස් වීම.

ii. දීප ව්‍යාප්ත මට්ටමින් ප්‍රාදේශිය කාර්යාල වලට ප්‍රතිපාදන ලබා දෙමින් ප්‍රතිලාභින්ට දීමනා ලබාදීමට යාමේදී නිවැරදි දිනයටම ප්‍රතිලාභ ලබාදීම පිළිබඳව පසු විපරම් කිරීම හා සාර්ව ආර්ථික ප්‍රගතිය ලබා ගැනීම කල්ගත වීම මත විකල්ප හඳුනා ගැනීම ඉක්මනින් කළ නොහැකි වීම.

iii. 2018 වර්ෂයේ අමාත්‍යාංශය නැවත විෂයන් වෙනස් වීම හේතුවෙන් ක්‍රියාත්මකව පැවති සංවර්ධන ව්‍යාපෘති ඉලක්කගත ප්‍රගතීන් කරා ළඟාකර ගැනීමට අපහසුවීම

iv. ඉදිකිරීම් සඳහා 2018 වර්ෂය සඳහා ලැබී ඇති ප්‍රතිපාදන, වියදම් දැරීමේදී අදාළ ඉදිකිරීම් ආයතන විසින් නියමිත වවුචර් පත් ඉදිරිපත් කිරීම පමාවීම සහ කාලගුණික වෙනස් වීම් මත ඉදිකිරීම් පමාවීම නිසා අපේක්ෂිත ඉලක්ක වෙත ලඟා වීමට අපහසුවීම.

## 1.2.8 ලබාගත් සමස්ත ජයග්‍රහණ

i. 2016 වර්ෂයේ රාජ්‍ය ගිණුම් පවත්වා ගෙනයාම, යාවත්කාලීන කිරීම හා භාවිතය පිළිබඳව රාජ්‍ය ගිණුම් කාරක සභාව මඟින් කරන ලද ඇගයීම් සමීක්ෂණයට අනුව සිව්වන ස්ථානය හිමි, සහතිකපත්ලාභී අමාත්‍යාංශය බවට සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ඇගයීමට ලක්වීම.

ii. 2019 අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී ගරු අමාත්‍යතුමාගේ හා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ උපදෙස් හා අධීක්ෂණය ලබා ගැනීමට හැකි වීම.

iii. සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයට අදාළ 2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව සකස්කර නියමිත දිනට ඉදිරිපත් කිරීමට හැකිවීම.

iv. 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයට නව ව්‍යාපෘති ඉදිරිපත් කිරීමට හැකි වීම සහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට හැකිවීම.

v. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර අපහරණය කලයුතු අබලි භාණ්ඩ නියමිත භාණ්ඩ අපහරණ ක්‍රියාවලිය තුළ අපහරණය කර එමඟින් ලබා ගන්නා ලද ආදායම්, රජයේ ආදායමට එකතු කිරීම යටතේ භාවිතයට නුසුදුසු වාහන 07 ක් හඳුනා ගෙන වෙන්දේසි කිරීමෙන් රු.මි. 10.74ක් රාජ්‍ය ආදායමට බැරකිරීමට හැකිවීම.

vi. 2017 ට සාපේක්ෂව 2018 විගණන විමසුම් අවම කර ගැනීමට හැකි වන පරිදි මූල්‍ය කළමනාකරණය පවත්වා ගැනීමට හැකි වීම.

vii. 2018 වර්ෂයේ ඉදිරිපත් කළයුතු පහත සඳහන් ගිණුම් වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීමට හැකි වීම.

(අ). විසර්ජන ගිණුම -2017
(ආ). අත්තිකාරම් ගිණුම - 2017
(ඉ). උපචිත පදනම යටතේ අවසාන ගිණුම - 2017

viii. තිරසර සංවර්ධන ඉලක්කයන් කරා ලඟා වීමට මූල්‍ය ඉලක්ක සපුරාදීමට හැකිවීම.

## 1.3 අභ්‍යන්තර විගණන අංශය

### 1.3.1 හැදින්වීම

සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය, මු.රෙ. 133 ප්‍රකාර, අමාත්‍යාංශ ලේකම් වෙත ඍජුවම වගකීමට බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු යටතේ ක්‍රියාත්මක වේ.

### 1.3.2 අරමුණු

අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන සේවාවන් හා වැඩසටහන් ගුණාත්මකව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය මූල්‍ය විගණනය , කාර්ය සාධන විගණනය, කළමනාකරණ විගණනය, පාරිසරික විගණනය, පද්ධති පාලන විගණනය හා අවදානම් සහිත ක්ෂේත්‍ර පාදක කරගත් විගණනය සිදු කිරීම තුළින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ලඟාකරගැනීමට මඟපෙන්වීම් සිදු කිරීම. ඒ යටතේ

01. නිකුත් කර ඇති විගණන විමසුම් - 20

i. සීදූව ජාතික සමාජ සංවර්ධන ආයතනය ඉදි කිරිමේ කොන්ත්‍රාත්තුව සඳහා විගණන විමසුම
ii. අමාත්‍යාංශ නිලධාරින් සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම හා බිල්පත් නිරවුල් කිරිම පිළිබඳ විගණන විමසුම
iii. ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් මඩකලපුව ප්‍රදේශයේ පවත්වා ඇති උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශාලා පහසුකම් ලබා ගැනිම හා ව්‍යාපෘති/ වැඩසටහන් සම්පාදක තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනිම පිළිබඳ විගණන විමසුම
iv. අමාත්‍යාංශයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳ විගණන විමසුම (දෙවන කාර්තුව අවසානයේදී)
v. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අයථා ක්‍රියාවලිය පිළිබඳව විගණන විමසුම (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුර සඳහා බඳවා ගැනිම)
vi. අමාත්‍යාංශයේ වාහන අළුත්වැඩියාව පිළිබඳ විගණන විමසුම
vii. 2018 ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරිම
viii. සමෘද්ධි උදානය නව රූපවාහිනී වැඩසටහනක් නිෂ්පාදනය කර විකාශනය කිරීම
ix. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැනුවත් කිරීමේ අත්පත්‍රිකා මුද්‍රණය කිරීම පිළිබඳ විගණන පරීක්ෂාව
x. බැංකු සැසදුම් හා පොදු තැන්පත් ගිණුම් පරීක්ෂාව
xi. මූල්‍ය හා භෞතික ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයේදී)
xii. පැමිණීම, නිවාඩු හා තැපැල සම්බන්ධව

xiii. ගෙවීම් වවුචර් පරීක්ෂාව
xiv. සුළු මුදල් පරීක්ෂාව - 2018
xv. පුහුණු වැඩසටහන් සංවිධානය පැවැත්වීම හා පසුවිපරම් ක්‍රියාවලිය පිළිබඳ කාර්ය සාධන පරීක්ෂාව
xvi. අමාත්‍යාංශ පරිගණක වෙබ් අඩවිය පිළිබඳ කාර්ය සාධන පරීක්ෂාව
xvii. පෞද්ගලික පඩිනඩි වාර්තා විගණනය
xviii. පෞද්ගලික ලිපිගොනු විගණනය
xix. ප්‍රතිපාදන උපයෝජනය
xx. භාණ්ඩ සමීක්ෂණය, ගබඩා කාර්යය පටිපාටිය හා ලැබීම් වවුචර් පරීක්ෂාව

02. පවත්වා ඇති කළමනාකරණ කමිටු රැස්වීම් - 04

i. පළමුවෙනි රැස්වීම - 2018.02.19
ii. දෙවන රැස්වීම - 2018.07.03
iii. තෙවන රැස්වීම - 2018.10.23
iv. සිව්වන රැස්වීම - 2018.12.20

03. පවත්වා ඇති විමර්ශන සංඛ්‍යාව - 02

i. ජාතික සමාජ සංවර්ධන ආයතනය - ව්‍යාපෘති වැඩසටහන් සම්පාදක බඳවා ගැනීමට අදාළව
ii. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි බඳවා ගැනීමට අදාළව

04. විගණකාධිපතිගේ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇති සංඛ්‍යාව -13

i. වවුචර් පරීක්ෂාව - 2017
ii. මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථයක් මිළදී ගැනිමේ පරික්ෂාව
iii. තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවීම පරික්ෂාව -2017
iv. බැංකු සැසඳුම් පරික්ෂාව - 2017 දෙසැම්බර්
v. තීරු බදු සහන ලබා දීම - 2016
vi. තනි මා පිය පවුල් සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය - 2017
vii. විසර්ජන ගිණුම් පරීක්ෂාව
viii. වකුගඩු රෝගීන් සඳහා ආධාර ගෙවීම පරික්ෂාව -2017
ix. උපදේශන අංශයේ කාර්ය සාධනය පරීක්ෂාව
x. කාර්යසාධනය - 2017
xi. 2017 - විගණනය
xii. ශීර්ෂය 124 සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය
xiii. ශීර්ෂය 124 සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ විගණන වාර්තාව 2017 වර්ෂය

05. විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 95%

06. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධව නිරීක්ෂණ හා ගන්නා ලද ඉදිරි පියවරයන් ඉදිරිපත් කිරීම - 2016 වර්ෂය (ස්ථාවර නියෝග අංක119 (4)

07. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතයන්හි මූල්‍ය පාලනය හා කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතියට තොරතුරු ලබා දීම -2017 වර්ෂය

## 1.4 පර්යේෂණ, සංඛ්‍යාලේඛන හා සැලසුම් අංශය

### 1.4.1 හැඳින්වීම

2017 වර්ෂයේ සැප්තැම්බර් මස ස්ථාපනය කරන ලද පර්යේෂණ සහ සංඛ්‍යාලේඛන අංශයට පසුකාලීනව සැලසුම් විෂයය ද එක් කිරීමෙන් පර්යේෂණ, සංඛ්‍යාලේඛන සහ සැලසුම් අංශය ස්ථාපනය කරන ලදී. අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, ක්‍රියාත්මක වැඩසටහන් මෙහෙයවීම සහ ප්‍රගති පාලනය සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණ කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාර්ය වේ.

### 1.4.2 පර්යේෂණ හා සංඛ්‍යාලේඛන

#### 1.4.2.1. අරමුණු

i. අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතනවල සැලසුම්කරණ ක්‍රියාවලිය තර්කානුකූල හා විධිමත් කිරීම
ii. භාණ්ඩාගාරය, රාජ්‍ය නොවන සංවිධාන ආදියෙන් අමාත්‍යාංශයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන, තාක්ෂණය සහ අනෙකුත් යෙදවුම් ලබා ගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීම.

#### 1.4.2.2. උපායමාර්ග

i. අමාත්‍යාංශයේ අංශ සහ ආයතන සමඟ ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීම
ii. අනෙකුත් රේඛීය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු සහ ආයතන සමඟ ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීම
iii. දැනුම, කුසලතා සහ තොරතුරු හුවමාරු කර ගැනීම

#### 1.4.2.3. 2018 වර්ෂයේ අත් කරගත් නිමැවුම (2018.12.31 දක්වා)

i. සමාජ වැඩ පිළිබඳ පර්යේෂණ 06 ක් ක්‍රියාත්මක කර දත්ත රැස් කිරීමේ කටයුතු නිමකර ඇති අතර පර්යේෂණ වාර්තා සකස් කිරීමේ කටයුතු නිමවෙමින් පවතී.
ii. අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව පර්යේෂණ 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික සැලසුම් සිදුකර ඇත.
iii. ශාස්ත්‍රීය ප්‍රකාශන පිළිබඳ විද්වත් කතිකාවක් සාර්ථකව පවත්වා ඇත.

iv. දිළිඳු බව පිටුදැකීම සඳහා මානසික සෞඛ්‍ය සම්පන්න තරුණ ප්‍රජාවගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමේ සම්මන්ත්‍රණය සහ සමීක්‍ෂණය සාර්ථකව පවත්වා ඇත.

v. ක්‍රියාත්මක කරන ලද පර්යේෂණවල සොයාගැනීම් සහ නිර්දේශ පිළිබඳ අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමට විද්වත් කතිකා දෙකක් පැවැත්වීමට මූලික සැලසුම් සිදුකර ඇත.

## 1.4.2.4. 2018.01.01 සිට 2018.12.31 දක්වා වියදම

| මූල්‍ය ප්‍රභවය | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|
| ප්‍රාග්ධන | 5.00 | 2.183 |

දිළිඳු බව පිටුදැකීම සඳහා මානසික සෞඛ්‍ය සම්පන්න තරුණ ප්‍රජාවගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමේ සම්මන්ත්‍රණය සහ සමීක්ෂණය






ශාස්ත්‍රීය ප්‍රකාශන පිළිබඳ විද්වත් කතිකාවත





සමාජ සවිබලගැන්වීම් ගරු අමාත්‍ය පී.හැරිසන් මැතිතුමා විද්වත් කමිටු සාමාජිකයන් වෙත සමරු තිළිණ පිරිනැමීම



## 1.4.3 සැලසුම් හා මෙහෙයුම්

### 1.4.3.1. අරමුණු

i. උපායමාර්ගික සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සියළු ක්‍රියාත්මක පාර්ශවකරුවන් අතර කාර්යක්ෂම හා ඵලදායී කාර්ය සබඳතාවයක් පවත්වාගැනීම සඳහා දිරිගැන්වීම.

ii. පවතින සමාජ අවශ්‍යතාවයන් හා ඒ සඳහා සුදුසු වැඩසටහන් හඳුනා ගැනීම තුළින් අවාසි සහගත තත්ත්වයන්හි සිටින සියළු පුද්ගලයන්හට පුළුල් විවිධත්වයකින් යුතු අවස්ථාවන් උදාකර දීම.

iii. විවිධ බලධාරීන්හට අවශ්‍යවන කාලීන වාර්තා සම්පාදනය මඟින් තීරණ ගැනීමට සහාය වීම.

iv. උපායමාර්ගික සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.

### 1.4.3.2. උපායමාර්ග

i. භාණ්ඩාගාර ඇස්තමේන්තු ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම.

ii. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව මාසික හා කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කිරීම සහ කාර්තුමය වශයෙන් ප්‍රගතිය සමාලෝචනය කිරීම.

iii. අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව අනුව ප්‍රතිඵල ඉලක්ක කරගත් ඇගයීම් ක්‍රියාවලියක් පිළිබඳව කටයුතු කිරීම.

iv. අමාත්‍යාංශයේ වාර්ෂික අය වැය සහ කාර්ය සාධන වාර්තාව පිළියෙළ කිරීම හා ඒවා අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කිරීම.

v. නව ව්‍යාපෘති යෝජනා පිළිබඳව විශ්ලේෂණය කොට ඒවා නිර්දේශ සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම හා ජාතික අය වැය දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කිරීම.

vi. පාර්ශවකරුවන් සමඟ ඉලක්කගත ප්‍රජාව වෙනුවෙන් නව වැඩසටහන් සැලසුම් කිරීමට අවශ්‍ය වන රැස්වීම් පැවැත්වීම.

### 1.4.3.3. 2018 වර්ෂයේ අත් කරගත් නිමැවුම (2018.12.31 දක්වා)

- අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සහ දෙපාර්තමේන්තු වැය ශීර්ෂයන් සඳහා 2018 වර්ෂයට ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- නව ව්‍යාපෘති යෝජනා 05 ක් සඳහා අනුමැතිය ලබා ගැනීම.
- මාසික ප්‍රගති වාර්තා 12 ක් සකස් කිරීම සහ කාර්තුමය ප්‍රගති වාර්තා 04 ක් මුදල් අමාත්‍යාංශය සහ ව්‍යාපෘති කළමණාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය වෙත කාර්තුමය ප්‍රගති වාර්තා 04 ක් ඉදිරිපත් කිරීම.
- 2017 වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.
- 2018 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් වැඩමුළු 01 ක් හා එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 04 පැවැත්වීම

## 1.5 මානව සම්පත් සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය

### 1.5.1 හැඳින්වීම

අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනයන්හි නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කර ඔවුන්ගේ සේවාවන් ඵලදායි අන්දමින් යොදාගැනීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශය මඟින් සිදු කරයි.

### 1.5.2 අරමුණු

i. දැනුමෙන්, කුසලතාවයෙන් හා යහපත් ආකල්පවලින් සපිරි මානව සම්පතක් බිහි කිරීම.
ii. නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම.
iii. යහපත් රාජකාරීමය පරිසරයක් නිර්මාණය කිරීම.
iv. අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්ය සාධනය ඉහළ නැංවීම.
v. රැකියාවේ හා ආයතනයේ වෙනස්වීම් හා අභියෝගාත්මක අවශ්‍යතා සපුරාලීම සඳහා සේවකයින් සවිබලගැන්වීම.

### 1.5.3 2018.01.01 සිට 2018.12.31 දක්වා වියදම

| මූලාශ්‍ර ප්‍රභවය | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|
| ප්‍රාග්ධන | 11.00 | 8.467 |
| පුනරාවර්තන | - | - |

## 1.5.4 2018.01.01 සිට 2018.12.31 දක්වා අත්කරගත් නිමැවුම

| පුහුණු වැඩසටහන | ප්‍රධාන අරමුණ | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා "මානව සම්පත් සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන්වල වැදගත් කම" පිළිබඳ දේශනය | අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම | 65 |
| කාර්ය සාධන සැලැස්ම නිවැරදි ලෙස සැකසීම, ඇගයුම හා ප්‍රමාණකරණය පිළිබඳ මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | නිවැරදි ආකාරයට කාර්ය සාධන සැලැස්ම සකසන ආකාරය පිළිබඳව මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීම | 50 |
| පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව | අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල නිලධාරීන්ගේ පර්යේෂණ ගැටළු හඳුනාගැනීමේ හා පර්යේෂණ මාතෘකා ගොඩනැගීමේ කුසලතාවය වර්ධනය කිරීම | 80 |
| දේපළ/උපකරණ සැබෑදී ස්ථාවර වත්කම් පවත්වා ගෙන යාම, නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුව | වත්කම් කළමනාකරණය පිළිබඳ නිලධාරීන්ගේ දැනුම ඉහළ නැංවීම | 2 |
| Graphic Designing (NVQ Level 4) පිළිබඳ පුහුණුව | Graphic නිර්මාණ පිළිබඳ දැනුම වර්ධනය කිරීම | 1 |
| "සොඳුරු අඩහැරය" සෞන්දර්යාත්මක සත්කාර වැඩසටහන | අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල නිලධාරීන්ගේ මානසික ආතතිය අවම කර ඒ තුළින් තෘප්තිමත් වූ ඵලදායි සේවයක් ලබා ගැනීම | 337 |
| සිංහල රාජකාරි ලිපි ලිවීම, හා ලිඛිත භාෂණය පිළිබඳ වැඩමුළුව | ඵලදායී රාජ්‍ය සේවාවක් සඳහා ගුණාත්මක හා නිවැරදි අක්ෂර වින්‍යාස හා ව්‍යාකරණ යොදා ගනිමින් නිවැරදිව රාජකාරී ලිපි ලිවීමේ දැනුම වර්ධනය කිරීම | 14 |
| රාජ්‍ය ලේඛන පරිපාලනය හා ලේඛනාරක්ෂක නීතිය පිළිබඳ පාඨමාලාව | ආයතනවල ලේඛන පරිපාලනය, කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම | 1 |
| මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සම්මන්ත්‍රණය | මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම වර්ධනය කිරීම<br>කාර්ක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටින සංවර්ධන නිලධාරීන් හා කළමනාකර සහකාර නිලධාරීන්හට විභාගය සමත් වීමට අවශ්‍ය දැනුම ලබා දීම. | 37 |

| පුහුණු වැඩසටහන | ප්‍රධාන අරමුණ | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| කාර්ය සාධන වාර්තා පිළියෙල කිරීම සම්බන්ධයෙන් මාණ්ඩලික නොවන නිලධාරීන් දැනුවත් කිරීම | නිවැරදි ආකාරයට කාර්ය සාධන සැලැස්ම සකසන ආකාරය පිළිබඳව මාණ්ඩලික නොවන නිලධාරීන් දැනුවත් කිරීම | 61 |
| තිරසර ප්‍රසම්පාදනය : සාර්ථකත්වය සඳහා ක්‍රියාත්මක වීම (Sustainable Procurement : Executing for Success) පිළිබඳ වැඩමුළුව | a). තිරසාර ප්‍රසම්පාදන හේතු සහ සාධකයන් හඳුනා ගැනීම<br>b). ප්‍රසම්පාදන ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටීන් සහ භාවිතයන් තිරසාරව අන්තර්ගත කරන ආකාරය හැදෑරීම<br>c). තිරසාර ප්‍රසම්පාදන ක්‍රියාවට නැංවීම සඳහා සහභාගී වන පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා අන්තර්ගත කිරීම | 5 |
| අළුතින් පත්වීම් ලද රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් අමාත්‍යාංශයේ කාර්යභාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන | අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්යභාරය පිළිබඳව අළුතින් පත්වීම් ලද රාජ්‍ය කළමනාකරණ නිලධාරීන් දැනුවත් කිරීම | 29 |
| ඩිජිටල් නව්‍යකරණය කළමනාකරණය කිරීම (Managing Digital Innovations) පිළිබඳ වැඩමුළුව | ඩිජිටල් නව්‍යකරණය හා පරිවර්තනය පිළිබඳ අවබෝධය හා දැනුම යාවත්කාලීන කිරීම, ඩිජිටල් පරිවර්තන උපායන් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්ව කුසලතා වර්ධනය කිරීම සහ ඩිජිටල් පරිවර්තනය හරහා ආයතනයක කාර්ය සාධනය වර්ධන කර ගැනීම සඳහා ධනාත්මක සිතිවිලි ගොඩනැගීම | 4 |
| සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා පරිවර්තන පිළිබඳ පාඨමාලාව (Translation & Interpretation (Sinhala - Tamil - English)) | විවිධ සංස්කෘතික හා භාෂාමය කණ්ඩායම් අතර ඵලදායී සන්නිවේදනයක් සැපයිය හැකි කුසලතාවයෙන් සපිරි භාෂණ පරිවර්තකයන් බිහි කිරීම සහ අර්ථවත් ප්‍රතිසන්ධානයක් සඳහා මාර්ගයක් සකස් කිරීම. | 1 |
| අමාත්‍යාංශ නිලධාරීන් සඳහා බැහැරගත පුහුණු වැඩසටහන | වඩා හොඳ වැඩ පරිසරයක් නිර්මාණය කිරීම හරහා කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම පිණිස නිලධාරීන් අභිප්‍රේරණය කිරීම | 29 |
| ප්‍රමාණ සමීක්ෂණය (MEP Quantity Surveying) පිළිබඳ පුහුණුව | බහු මහල් ගොඩනැගිලිවල අභ්‍යන්තර විදුලිය, වායු සමීකරණ, විදුලි සෝපාන, ජල සම්පාදනය මාර්ග, ජලාපවාහන පද්ධති සහ ගෑස් නළ සවිකිරීම පිළිබඳව පුළුල් දැනුමක් ලබා දීම | 1 |
| තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කරන ලද 2016 වර්ෂයේ සිට සියළු රටවල් විසින් ක්‍රියාත්මක කර 2030 වර්ෂය වන විට ඉටු කළ යුතු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සියළු නිලධාරීන්ට පුළුල් අවබෝධයක් ලබා දීම | 131 |

| පුහුණු වැඩසටහන | ප්‍රධාන අරමුණ | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| විගණන විමසුම් ඇති නොවන පරිදි ලිපිගොනු සකස් කර ගන්නා ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | විගණන විමසුම් ඇති නොවන පරිදි ලිපිගොනු සකස් කර ගන්නා ආකාරයත් ඇතුළත් විය යුතු ලිපි ලේඛන පිළිබඳවත් නිලධාරීන් දැනුවත් කිරීම | 56 |
| තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ වැඩමුළුව | 2030 වර්ෂය වන විට සම්පූර්ණ කළ යුතු අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතනවලට අදාළ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ ක්‍රියාත්මක සැලැස්ම සැකසීම පිළිබඳව නිලධාරීන් හට නිසි අවබෝධයක් ලබා දීම | 37 |
| කාර්යාල කාර්ය සහායකයින්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ දැමීම පිළිබඳ දෙදින වැඩමුළුව | කාර්යාල කාර්ය සහායක සේවකයින්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම හා ඉහළ නිලධාරීන් වෙත ඔවුන්ගෙන් නිසි සේවයක් ලබා ගැනීම | 4 |
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ දෙදින වැඩමුළුව | සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිලධරීන්හට ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳව මනා අවබෝධයක් ලබා දීම | 19 |
| කාර්යාභිවර්ධන දෙදින පුහුණු වැඩසටහන | සහායක නිලධාරියෙකුට පැවරී ඇති කාර්යභාරය විධිමත්ව, කර්යක්ෂමව හා සිය ආයතනයට වඩාත් ඵලදායිව ඉටු කරන ආකාරයත්, අදාළ නිලධාරියා ආයතනයට වඩා වැදගත් අයෙකු බව ඉහළ කළමනාකාරිත්වයට නිරීක්ෂණය වීම සඳහා ගොඩනගා ගත යුතු කුසලතාවයන් පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දීම | 16 |
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි කළමනාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා SIYB නේවාසික පුහුණු වැඩසටහන | අනුරාධපුර දිසත්‍රික්කයෙන් තෝරා ගත් සමෘද්ධි කළමනාකරුවන්, සංවර්ධන නිලධාරින් හට SIYB පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කර ඒ හරහා ව්‍යපාර ගොඩනැගීම හා සාර්ථක ලෙස පවත්වා ගෙන යාම පිළිබඳව සමෘද්ධිලාභීන් හට මඟ පෙන්වා ඒ තුළින් ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමෘද්ධිලාභීන් සවිබලගන්වා ඉහළ ආර්ථික ප්‍රතිලාභයක් අත්කර දීම. | 31 |
| අභ්‍යන්තර විගණනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | රාජ්‍ය ආයතනවල මූල්‍ය වගවීම කාර්යක්ෂම හා සඵලදායී ලෙස මෙහෙයවනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳ සොයා බලා ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරීම සඳහා අභ්‍යන්තර විගණනයට ඇති වගකීම ඉටු කිරීම පිණිස නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම | 3 |
| ඵලදායි ලෙස ඉංග්‍රීසි ලිපි ලිවීමේ හා ලිඛිත සන්නිවේදන තාක්‍ෂණය පිළිබඳ දෙදින වැඩමුළුව | ඵලදායි රාජ්‍ය සේවයක් සඳහා ගුණාත්මක හා නිවැරදි ලෙස ඉංග්‍රීසි ලිපි ලිවීම පිළිබඳව අවබෝධයක් ලබා දීම | 41 |

| පුහුණු වැඩසටහන | ප්‍රධාන අරමුණ | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ දෙවන වැඩමුළුව | උපාය මාර්ගික සැලැස්ම සැකසීම අවසන් කිරීම සඳහා පවත්වන ලද වැඩමුළුව | 21 |
| තොරතුරු තාක්ෂණයට අදාළ භාණ්ඩ ප්‍රසම්පාදනය හා ඇගයීම පිළිබඳ දෙදින වැඩමුළුව | රජයේ කාර්යාලවල භාවිතා වන තොරතුරු තාක්ෂණයට අදාළ භාණ්ඩ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුළුල් දැනුමක් ලබා දීම හා එම කටයුතු කර ගෙන යාමේ දී මතුවන ප්‍රායෝගික තත්ත්වයන් හඳුනා ගැනීම | 11 |
| වත්කම් කළමනාකරණය හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | වත්කම් කළමනාකරණය හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳව නිලධාරීන්හට පුළුල් අවබෝධයක් ලබා දීම | 63 |
| ජාතික සමාජ සංවර්ධන ආයතනයේ නිලධාරීන් සඳහා බැහැරගත පුහුණු වැඩසටහනක් පැවැත්වීම | වඩා හොඳ වැඩ පරිසරයක් නිර්මාණය කිරීම හරහා කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම පිණිස ජාතික සමාජ සංවර්ධන ආයතනයේ නිලධාරීන් අභිප්‍රේරණය කිරීම | 31 |
| රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය හා රාජ්‍ය සේවකයාගේ රැකියා තෘප්තිය වර්ධනය කිරීම සහ වර්යා වෙනස්කම් මත සිදුවන පොදු අත්වැරදීම් පිළිබඳ සම්මන්ත්‍රණය | රාජ්‍ය නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය කොට සේවාලාභීන් වෙත නිසි සේවයක් ලබා දීම හරහා අමාත්‍යාංශයේ කාර්ය සාධනය ඉහළ නැංවීම | 175 |
| රාජකාරී ලිපි හා සිංහල ලිඛිත භාෂාව පිළිබඳ දෙදින පාඨමාලාව | ඵලදායී රාජ්‍ය සේවාවක් සඳහා ගුණාත්මක හා නිවැරදි අක්ෂර වින්‍යාස හා ව්‍යාකරණ යොදා ගනිමින් නිවැරදිව රාජකාරී ලිපි ලිවීමේ දැනුම වර්ධනය කිරීම | 50 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ඉලක්ක කර පවත්වනු ලබන තෙදින වැඩමුළුව | රාජ්‍ය කලමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සාර්ථක ලෙස සමත්වීම පිණිස එහි විෂය නිර්දේශය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දීම | 14 |
| පුහුණුකරුවන්ගේ අභ්‍යාසකරණ මූලික කුසලතා වර්ධන දෙදින වැඩමුළුව | ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ පුහුණු කිරීමේ කාර්යයේ යෙදෙන නිලධාරීන් හට පුහුණුකරුවෙකු ඵලදායි පුහුණුකරුවෙකු ලෙස කටයුතු කිරීමට සිය හැසිරීම්, දැනුම හා හැකියාවන් වෙනස් කර ගත යුත්තේ කෙසේ ද යන්න පිළිබඳවත්, පුහුණු කිරීමේ දී වඩා ප්‍රතිඵලදායි ලෙස එම කටයුතු මෙහෙය විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳවත් මූලික දැනුම ලබා දීම | 24 |
| රථවාහන හා යන්ත්‍රසූත්‍ර පරිපාලනය පිළිබඳ දෙදින වැඩමුළුව | රාජ්‍ය ආයතනවල රථවාහන හා යන්ත්‍රසූත්‍ර පරිපාලනය පිළිබඳව නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම | 3 |

| පුහුණු වැඩසටහන | ප්‍රධාන අරමුණ | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් සඳහා බැහැරගත පුහුණු වැඩසටහනක් පැවැත්වීම | වඩා හොඳ වැඩ පරිසරයක් නිර්මාණය කිරීම හරහා කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් අභිප්‍රේරණය කිරීම | 46 |
| ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ හා නිලධාරීන් සඳහා බැහැරගත පුහුණු වැඩසටහනක් පැවැත්වීම | වඩා හොඳ වැඩ පරිසරයක් නිර්මාණය කිරීම හරහා කාර්යක්ෂම හා ඵලදායි සේවයක් ලබා ගැනීම පිණිස ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නිලධාරීන් අභිප්‍රේරණය කිරීම | 42 |
| විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව | විශ්‍රාම වැටුප් සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දීම | 12 |
| සේවාලාභීන්හට විශිෂ්ඨ සේවාවක් අත්පත් කර දීම සඳහා නිලධාරීන් ආකල්පමය වශයෙන් අභිප්‍රේරණය කිරීම පිණිස සම්මන්ත්‍රණයක් පැවැත්වීම | රාජ්‍ය නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය කොට සේවාලාභීන් වෙත නිසි සේවයක් ලබා දීම හරහා නිලධාරීන්ගේ සහ අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්ය සාධනය ඉහළ නැංවීම | 215 |
| රසිකත්වය පිළිබඳ මානසික සංවර්ධනය තුළින් ආතති කළමනාකරණය කර ගැනීම සහ ජනතාවාදී සේවයක් සැපයීමට සංවේදිතාවයක් රාජ්‍ය සේවකයා තුළ ගොඩනැගීම පිළිබඳ සෞන්දර්යාත්මක වැඩසටහන | අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල නිලධාරීන්ගේ මානසික ආතතිය අවම කර ඒ තුළින් තෘප්තිමත් වූ ඵලදායි හා කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම | 192 |
| වෘත්තීය දිවියේ සාර්ථකත්වයට හා විශිෂ්ඨ සේවාවක් සැපයීම සඳහා නිර්මාණශීලිත්වය හා සිතීමේ පරාසය වැඩි දියුණු කිරීම (පළමු කණ්ඩායම) | රාජ්‍ය නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය කොට සේවාලාභීන් වෙත නිසි සේවයක් ලබා දීම හරහා අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්ය සාධනය ඉහළ නැංවීම | 55 |
| ඉන්දියාවේ සමාජීය විද්‍යාවන් පිළිබඳ ටාටා ආයතනයේ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ හා මුම්බායි නගරයේ ආදර්ශ ගම්මාන නැරඹීමට අදාළ විදේශ චාරිකාව | • සමාජ වැඩ සම්බන්ධ අධ්‍යාපනය, පුහුණු භාවිතයන් හා පර්යේෂණ සම්බන්ධ දැනුම හා අත්දැකීම් හුවමාරු කර ගැනීම.<br>• දකුණු ආසියාවේ ක්‍රියාත්මක සමාජ වැඩ පිළිබඳ අධ්‍යාපන ආයතන සමඟ සම්බන්ධතා ජාලයක් ගොඩ නඟා නැගීම.<br>• සමාජ වැඩ භාවිතයන් යටතේ "සුහුරු ගම්මාන" වැනි සංකල්ප පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම. | 11 |
| වෘත්තීය දිවියේ සාර්ථකත්වයට හා විශිෂ්ට සේවාවක් සැපයීම සඳහා නිර්මාණශීලිත්වය හා සිතීමේ පරාසය වැඩි දියුණු කිරීම (දෙවන කණ්ඩායම) | රාජ්‍ය නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය කොට සේවාලාභීන් වෙත නිසි සේවයක් ලබා දීම හරහා අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්ය සාධනය ඉහළ නැංවීම | 62 |

| පුහුණු වැඩසටහන | ප්‍රධාන අරමුණ | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| නිලධාරීන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය සමබරතාවය සඳහා පවත්වන ලද යෝගා පුහුණු වැඩසටහන | අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල නිලධාරීන්ගේ සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කර ඒ තුළින් සේවාලාභීන් වෙත නිසි සේවයක් ලබා දීම හරහා අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්ය සාධනය ඉහළ නැංවීම | 60 |
| විද්‍යාත්මක හා පිරිමැසුම්දායක රිය පැදවීම පිළිබඳ එක්දින වැඩමුළුව (න්‍යායාත්මක හා ප්‍රායෝගික) | රියදුරන් හට පැරණි හා නවීන වාහන පිළිබඳ දැනුම ලබා දෙමින් නිසි තාක්ෂණය යොදා ගෙන අඩු ඉන්ධන ධාරිතාවකින් විනය ගරුකව, ආරක්ෂිතව හා මාර්ග නීතිවලට අනුකූලව රිය පැදවීමේ වැදගත්කම වටහා දීම. | 28 |




## 1.6 සමෘද්ධි සංවර්ධන අංශය

### 1.6.1 හැඳින්වීම

සමෘද්ධි ප්‍රතිලාභීන් ජීවත්වන දුෂ්කර ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවලදී ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම සමෘද්ධි සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. මීට අමතරව අමාත්‍යාංශය යටතේ අධීක්ෂණය වන ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, ජාතික සමාජ සංවර්ධන ආයතනය හා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කටයුතු අධීක්ෂණය කිරීම ද සිදු කරනු ලබයි.

## 1.6.2 අරමුණු

i. සමාජයේ අවාසි සහගත තත්ත්වයට පත්වී ඇති ප්‍රජාව ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

ii. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති අධීක්ෂණය.

iii. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ වත්කම් අත්පත් කර ගැනීම සඳහා අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය කිරිම හා අවශ්‍ය කටයුතු කිරීම.

iv. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.

v. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සමාලෝචනය.

vi. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරිම සමාලෝචනය.

## 1.6.3 2018 වර්ෂය තුළ අත්කරගත් නිමැවුම (2018.12.31 දිනට)

i. සමෘද්ධි ප්‍රතිලාභීන් ජීවත්වන දුෂ්කර ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති 77 ක් සම්පූර්ණ කිරීම

ii. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ 04 ක් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත යොමුකර ඇති අතර, අනෙකුත් ඉඩම් අත්පත් කර ගැනීම් 29 ක ඉදිරි කටයුතු සිදුකර ඇත.

## 1.6.4 අපේක්ෂිත සමාජ ආර්ථික ප්‍රතිඵල

සාමාජීය හා ආර්ථික ලෙස ප්‍රජාව සවිබල ගැන්වීම.

## 1.6.5 අනුමත වාර්ෂික අයවැය - 2018

| ප්‍රාග්ධන (රු.මි) | පුනරාවර්තන (රු.මි) |
|---|---|
| 400.00 | - |

## 1.6.6 2018.01.01 සිට 2018.12.31 දක්වා වියදම

| මූල්‍ය ප්‍රභවය | ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 400.00 | 94.46 |

## 1.6.7 2018.01.01සිට 2018.12.31 දක්වා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල තොරතුරු

| වැඩසටහන - අංක 01 | රජයේ ඉඩම්වල ඉදිකර ඇති සමෘද්ධි බැංකු හා මහා සංගම් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම. |
|---|---|
| ක්‍රියාකාරකම් | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. |
| ස්ථාන | දිවයින පුරා සමෘද්ධි බැංකු 1074 ක් හා මහා සංගම් 331 |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභීන් |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| ප්‍රතිඵල | ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ 04 ක් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. ඉඩම් අත්පත් කර ගැනීම් 29 ක ඉදිරි කටයුතු සිදුකර ඇත. |

| වැඩසටහන - අංක 02 | සමෘද්ධි ප්‍රතිලාභීන් ජීවත්වන දුෂ්කර ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. |
|---|---|
| ක්‍රියාකාරකම් | කාණු පද්ධති, ඇළ මාර්ග, බෝක්කු, කුඩා පාලම්, අතුරු මාර්ග, පඩිපෙළවල්, පැති බැමි, ප්‍රවාහන පහසුකම්, ජල පහසුකම්, සේවා මධ්‍යස්ථාන, අලෙවිසල්, සති පොලවල් ආදි යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම |
| ස්ථාන | යාපනය දිස්ත්‍රික්කය, මඩකලපුව දිස්ත්‍රික්කය, අම්පාර දිස්ත්‍රික්කය, ගාල්ල දිස්ත්‍රික්කය, මොණරාගල දිස්ත්‍රික්කය, ගම්පහ දිස්ත්‍රික්කය |
| ඉලක්ක කණ්ඩායම | ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන සමෘද්ධි හා සමෘද්ධි නොවන ප්‍රතිලාභීන් |
| කාල සීමාව | 2018.07.11 – 2018.12.31 |

රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගල්පොත්ත හීන්යාය පාර පෙර තත්වය හා කොන්ක්‍රීට් කිරීමෙන් පසු





02

# ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය



# ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## 2.1 හැඳින්වීම

වර්ෂ 1974 දී ආරම්භ කරන ලද ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය, දිළිඳුකම පිටුදැකීමේ ජාතික සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රමුඛව ක්‍රියා කරන ආයතනය වේ. ප්‍රධාන සංවර්ධන ධාරාවෙන් ආන්තිකරණයට පත් දිළිඳු ප්‍රජාව සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය ඔස්සේ සවිබල ගන්වමින් ඔවුන් නැවත ප්‍රධාන සංවර්ධන ප්‍රවාහය සමග ඒකාබද්ධ කරලීමේ උපායමාර්ගික ආයතනයක් ලෙස මෙම ආයතනය ක්‍රියාත්මක වේ. ජනසවිය, සමෘද්ධි, ගමනැඟුම වැනි දිළිඳුකම පිටුදැකීමේ රජයේ ප්‍රධාන වැඩසටහන්වලට ප්‍රජා සහභාගීත්වය මත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සමාජ සජීවීකරණ ක්‍රමවේදය හඳුන්වා දෙමින් ප්‍රධාන දායකත්වයක් ලබා දී ඇත. විශේෂයෙන්ම මෙය දිළිඳුකම පිටුදැකීමේ ජාතික සංවර්ධන වැඩසටහන් සඳහා අනුගමනය කළ යුතු සංවර්ධන ප්‍රවේශයන් පිළිබඳව විවිධ අත්හදාබැලීම් සිදු කරන, කාර්යබද්ධ පර්යේෂණයන් පිළිබඳව සාර්ථක අත්දැකීම් සහිත ආයතනයකි. මෙම කාර්යභාරය ක්‍රියාවට නැංවීම සඳහා පුහුණු, පර්යේෂණ, ප්‍රකාශන හා සැපයුම් යන ප්‍රධාන අංශ යටතේ ආයතනය සංවිධාන ගතව ඇත.

## 2.2 දැක්ම

"සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් උදෙසා ප්‍රජා සවිබලගැන්වීමේ ප්‍රමුඛ ආයතනය බවට පත්වීම"

## 2.3 මෙහෙවර

සහභාගීත්ව සංවර්ධන ක්‍රමවේදය යොදාගනිමින් ප්‍රජාව සවිබලගන්වා තිරසාර ග්‍රාම සංවර්ධනය උදෙසා ඔවුන්ගේ සක්‍රිය සහභාගීත්වය උපරිම කිරීමට පුහුණු, පර්යේෂණ හා තොරතුරු සම්පාදනය තුළින් දායකවීම

## 2.4 අරමුණු

i. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය ග්‍රාම සංවර්ධනයේ මූලික උපායමාර්ගය ලෙස ප්‍රවර්ධනය කිරීම.

ii. පවුල් හා ප්‍රජා මූල සංවිධාන සවිබලගැන්වීමට සෘජුව සම්බන්ධ වන පරිදි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය.

iii. පළාත් ග්‍රාම සංවර්ධනය යථාර්තයක් කරගනු පිණිස පළාත් සභා සමඟ සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.

iv. අර්ධ වාර්ෂිකව හා ත්‍රෛමාසිකව තොරතුරු ප්‍රකාශයට පත් කිරීම.

v. ප්‍රජාව සවිබලගැන්වීම උදෙසා කාලීන මාතෘකාවන් ඔස්සේ විවෘත සංවාද පැවැත්වීම.

vi. ප්‍රතිපත්ති සම්පාදකයන්, සංවර්ධන වැඩකරුවන්, ග්‍රාමීය සංවර්ධන ක්‍රියාකාරීන් උදෙසා සංවර්ධන ප්‍රකාශනයන් වාර්ෂිකව ප්‍රකාශයට පත්කිරීම.

vii. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්ව ග්‍රාමීය සංවර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## 2.5 2018 වර්ෂය තුළ අත්කරගත් නිමැවුම (2018.12.31 දිනට)

- වයඹ පළාත තුළ ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි හා ආබාධිත ප්‍රජාව සමාජ ආර්ථික හා ආධ්‍යාත්මික වශයෙන් සවිබලගැන්වීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක සමාජ සේවා නිලධාරීන් හා ග්‍රාමීය ක්‍රියාකාරීන් දැනුවත් කිරීම තුළින් සුළු පරිමාණ ව්‍යවසායකයන් 600 දෙනෙකු ගොඩනැංවීම සඳහා දායක වීම

- ආදර්ශ ගම්මාන ගොඩනැගීමේ කාර්යබද්ධ පර්යේෂණ වැඩසටහන

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සියඹලාවැහැර ගම්මානයේ පවුල් 85 ක් හා මාතලේ දිස්ත්‍රික්කයේ ආලෝකගම ගම්මානයේ පවුල් 189 ක් ආර්ථික හා සමාජීය වශයෙන් ශක්තිමත් කිරීම උදෙසා දියත් කළ මෙම වැඩසටහන තුළින් ප්‍රජා සහභාගීත්ව ඉතුරුම්, ණය, ගෙවතු සංවර්ධනය, ආධ්‍යාත්මික සංවර්ධන, ළමා සංවර්ධන, අරමුදල් රැස් කිරීම, සමාජ ආරක්ෂණ, සති පොළ, අධ්‍යාපන චාරිකා, ළමුන්ට පාසල් පොත් ලබාදීම ආදී ක්‍රියාකාරකම් ආරම්භකර ඇති අතර 2018 වර්ෂය තුළ ලබාගෙන ඇති අරමුදල් ප්‍රමාණය රු. ලක්ෂ 700,000.00 ඉක්මවි ඇත.

- සංවර්ධනය හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ ග්‍රන්ථය නැවත මුද්‍රණය කිරීම

පිටපත් 500 ක් මුද්‍රණය කර ඇත.

- තරුණය පුවත් හසුන මුද්‍රණය

තරුණය පුවත් හසුන සඳහා පිටපත් 1000 ක් මුද්‍රණයට ලබා දීඇත.

- ග්‍රාම සංවර්ධනය පිළිබඳ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම

වෙබ් අඩවිය නිර්මාණය කර ජනවාරි මස ජනතා අයිතියට පැවරීමෙන් අනතුරුව යාවත්කාලීන කටයුතු සිදු කර ඇත.

- පුස්තකාල පොත් මිලදී ගැනීම

බොරැල්ල සහ පිළිමතලාව මධ්‍යස්ථානයේ පුස්තකාල සඳහා පොත් 300 ක් මිලදී ගෙන පරිගණකගත කර ඇත.

- සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඒ යටතේ දිස්ත්‍රික්ක 20 ක සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 443 දෙනෙකු ගේ පවුල් සවිබලගැන්වීම ඉලක්ක කර පුහුණු කිරීම සඳහා වැඩසටහන් 22 ක් සංවිධානය කර නිලධාරීන් 433 ක් පුහුණු කර ඇත.

- නිලධාරීන්ගේ දැනුම, කුසලතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 20 ක් අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් සිදු කර ඇත.

- ආයතන පරිශ්‍රය තුළ භෞතික සම්පත් හා අභ්‍යන්තර පරිසරය සංවර්ධනය කිරීම

රුපියල් මිලියන 1.9 ක් වැය කර ආයතනයේ දේශන ශාලා සංවර්ධනය කර ඇත.

- පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම

රුපියල් මිලියන 21.9 ක් වැය කර නේවාසිකාගාර අලුත්වැඩියා කර ඇත.

## 2.6 අනුමත වාර්ෂික අයවැය - 2018

| ප්‍රාග්ධන (රු.මි) | පුනරාවර්තන (රු.මි) |
|---|---|
| 11 | 39 |

## 2.7 2018.01.01 සිට 2018.12.31 දක්වා වියදම

| ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|
| පුනරාවර්තන (රු.මි) 39.00 | 36.91 |
| ප්‍රාග්ධන (රු.මි) 11.00 | 4.04 |



ආදර්ශ ගම්මාන ව්‍යාපෘතියේ වැඩසටහන් පැවැත් වූ අවස්ථාවන්



කාර්යබද්ධ පුහුණු වැඩපිළිවෙල සැලසුම් කිරීම



ග්‍රාම සංවර්ධනය හා සංවර්ධනය පිළිබඳ සඟරාව



පුහුණු වැඩසටහන් පැවැත්වූ අවස්ථාවක්

03

# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව



# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

## 3.1 හැඳින්වීම

2017 අංක 2 දරණ සමෘද්ධි පනතින් සංශෝධිත 2013 අංක1 දරණ දිවිනැගුම පනත මඟින් ස්ථාපිත මෙම ආයතනයට පැවරී ඇති ප්‍රධානම කාර්යය වන්නේ දිළිඳු පවුල් ලක්ෂ 14 ට සමෘද්ධි සුබසාධනය සලසමින් සමාජ ආරක්ෂණ අරමුදල මඟින් එම පවුල්වල දෛනික වැදගත් අවස්ථාවලදී ආරක්ෂණය සැලසීමට අදාළව දීමනා ලබාදෙමින්, ශ්‍රී ලංකාවේ දිළිඳුකම මුලින්උපුටා දැමීම සඳහා එම පවුල් සවිබල ගැන්වීමට ඔවුන්ගේ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් සහ ප්‍රජාමූල බැංකු 1074 ක් මඟින් දිවයින පුරා විසිරී සිටින එම දිළිඳු පවුල්වල සහ අඩු ආදායම් ලාභී පවුල්වලට අවශ්‍යකරන විවිධ ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්පාදනය කිරීම වේ. මීට අමතරව,දිළිඳු පවුල් සහ අඩු ආදායම් ලාභී ජනතාව, ඒකරාශී කරමින් ප්‍රජාමූල සංවිධාන ජාලයක් ස්ථාපිත කොට පවත්වාගෙන යාමත්, සමාජ සංවර්ධනය උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් අරමුණු කෙරේ.

## 3.2 දැක්ම

" වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිකිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම"

## 3.3 මෙහෙවර

ආන්තිකරණයට පත් ජනතාව (ආර්ථිකමය, සමාජයීය, දේශපාලනික, භෞතික, මානසික, නෛතික හා පාරිසරික) සවිබලගැන්වීම හා ප්‍රාදේශීය විෂමතාවය අවම කිරීම සඳහා කාර්යක්ෂම, සඵලදායී, වේගවත් හා ඵලදායී විසඳුම් ජනහිතකාමී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා, දෙපාර්තමේන්තු, ප්‍රජාමූල සංවිධාන හා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ජාලය හා වෘත්තිකයන්, රජය, පෞද්ගලික, ජනතා සහ දේශපාලන අංශවල මනා දායකත්වය හා දේශීය හා ගෝලීය ආයතන වලද සහභාගීත්වයෙන්, දුගී බවෙන් තොර, සමෘද්ධිමත් දේශයක් ගොඩ නැංවීම තුළින් ආර්ථික සංවර්ධනයට දායක වීම.

## 3.4 අරමුණු

- ✓ දිළිඳු පවුල් 1,400,000 කගේ දෛනික යැපුම් පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම.
- ✓ උපතේ සිට මරණය දක්වා වූ විශේෂ අවස්ථාවලදී ලබා දීමට නියමිතව ඇති මූල්‍ය ප්‍රතිලාභ ලබාදෙමින්, පවුල් 1,400,000 හි සමාජ ආරක්ෂණය සැලසීම.
- ✓ දිළිඳු පවුල් 1,400,000 හි හා අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් මට්ටම රු.5,000 කින් වර්ධනය කිරීම.
- ✓ ප්‍රජාමූල සංවිධාන 36,000 ක්, ප්‍රාදේශීය සංවිධාන 331 ක් සහ දිස්ත්‍රික් සංවිධාන 25 ක් ඇති කොට දිළිඳු පවුල්වල ආර්ථික හා සාමාජීය කටයුතු ශක්තිමත් කිරීම.
- ✓ දිළිඳු පවුල් 1,400,000 ක් හා අඩු ආදායම්ලාභී පවුල්වල ජීවනෝපාය නගා සිටුවීම සඳහා සමෘද්ධි බැංකු 1,074 තුළින් වසරකට රු.මි.25,000ක ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම.

## 3.5 උපායමාර්ග

- කාණ්ඩ 4 ක් යටතේ ( රු.3,500/= , රු.2,500/= , රු.1,500/= හා රු.420/= ආදී වශයෙන් ) දිළිඳු පවුල් 1,400,000 හඳුනාගෙන සමෘද්ධි සහනාධාර ලබා දීම.
- ඉහත දිළිඳු පවුල්වල, දරු උපත්, විවාහ, ලෙඩ රෝග, මරණ හා ළමයින්ගේ අධ්‍යාපනය යන අවස්ථාවන්ට අදාළ තොරතුරු ප්‍රාදේශීය මට්ටමින් නිසි කලට ලබාගෙන සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීම.
- සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය අවශ්‍යතාවයන් හඳුනාගෙන ඊට ගැළපෙන ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රජාමූල සංවිධාන පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කොට ඔවුන් ලවා දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක කර ගත් ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් සංවිධාන පිහිටුවා පවත්වාගෙන යාම.
- දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල්වල ණය අවශ්‍යතාවයන් හඳුනාගෙන, ඔවුන් සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හරහා විවිධ ක්ෂුද්‍ර මූල්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීම සහ නිලධාරීන්ට ඉලක්ක ලබා දීම

## 3.6 2018 වර්ෂය තුළ අත්කරගත් නිමැවුම් (2018.12.31 දිනට)

### 01.ජීවනෝපාය සංවර්ධනය

i. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජීවන මට්ටම ඉහල දැමීම සඳහා කෘෂිකාර්මික ව්‍යාපෘති 2,163 ක් සත්ව පාලන ව්‍යාපෘති 1,139 ක් ධීවර ව්‍යාපෘති 170 ක් කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති 7,728 ක් සහ තරුණයින් 312 ක් සඳහා රැකියාභිමුඛ පුහුණුව ලබාදීම ඇතුළු මුළු ව්‍යාපෘති 19,147 ක් නිම කිරීම (මූල්‍යමය වියදම රු.මි.506.89 ක් වේ).

ii. දිරිය පියස නිවාස වැඩසටහන යටතේ එක් අයෙකුට රු.150,000/- බැගින් වන පරිදි පුද්ගලයින් 1,018 ක් සඳහා නිවාස 1,018 ක් ඉදි කිරීම (මූල්‍ය වියදම රු.මි. 187.32 ක් වේ).

iii. කැකුළු ළමා සමාජ වැඩසටහන යටතේ ළමයින් 3,400 ක් ජාතික මට්ටමේ සාහිත්‍ය හා සංස්කෘතික තරඟ පවත්වා තෝරා ගැනීම (මූල්‍ය වියදම රු.මි.17.89 ක් වේ).

iv. දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් වෙළඳ ප්‍රදර්ශන 22 ක් පැවැත්වීම තුළින් ව්‍යවසායකයින් 3,000 ක් පමණ පිරිසකට වෙළඳපල අවස්ථා සලසාදීම. ව්‍යවසාය සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම යටතේ ව්‍යවසායකයින් 1,546 ක් සඳහා පහසුකම් ලබාදීම ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන් 609 ක් පැවැත්වීම (මූල්‍ය වියදම රු.මි.110.5 ක් වේ).

v. නිවාස ලොතරැයි වැඩසටහන යටතේ එක් අයෙකුට රු.200,000/- බැගින් වන පරිදි ප්‍රතිලාභීන් 3,972 දෙනෙකු සඳහා නිවාස 3,972 ක් ඉදි කිරීම (මූල්‍ය වියදම රු.මි.794.4 ක් වේ).

vi. විශේෂ නිවාස වැඩසටහන යටතේ පුද්ගලයින් 24 ක් සඳහා එක් අයෙකුට රු.200,000/- බැගින් වන පරිදි නිවාස 24 ක් ඉදි කිරීම (මූල්‍ය වියදම රු.මි. 4.70 ක් වේ).

vii. මත්ද්‍රව්‍ය භාවිතය වැනි අයහපත් ගතිපැවතුම් නිසා පවුල් ඒකක මුහුණපාන ගැටළු අවම කර ඔවුන් තුළ සතුට හා සහජීවනය ගොඩනැංවීම සඳහා සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් 316 ක් ක්‍රියාත්මක කර පවුල් ඒකක තුළ සතුට හා සමඟිය වැඩිදියුණු කිරීම (මූල්‍ය වියදම රු.මි.7.02 ක් වේ).

viii. හරිත දායාද වැඩසටහන යටතේ පවුල් 8,575 ක් සඳහා පොල් පැල හා වෙනත් වන සංරක්ෂණ පැළ ලබාදීම (මූල්‍ය වියදම රු.මි.18.89 ක් වේ).

ix. දිවයින පුරා ප්‍රජා මූල සංවිධාන 30,211 ක්, ප්‍රාදේශීය සංවිධාන 331 ක්, දිස්ත්‍රික් සංවිධාන 25 ක් ලියාපදිංචි කිරීම සහ ප්‍රජා මූල සංවිධාන සභාපතිවරුන් හා ලේකම්වරුන් ඇතුළු නිලධාරීන් පුහුණු කිරීම (මූල්‍ය වියදම රු.මි.26.48 ක් වේ).

x. ක්‍රීඩා සංවර්ධන හා ශාරීරික ක්‍රියාකාරකම් යටතේ සමෘද්ධි නිලධාරීන් හා සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල දරුවන්ගේ ක්‍රීඩා කුසලතා සංවර්ධනය කිරීම (මූල්‍ය වියදම රු.මි.20.0 ක් වේ).

## 02.සමාජ සුබ සාධනය

දිළිඳු පවුල් 1,384,021 ක් සඳහා සමෘද්ධි සහනාධාර ලබාදී ඔවුන්ගේ පරිභෝජන අවශ්‍යතා සපුරාලීම. 2018.12.31 දිනට ලබාදී ඇති සහනාධාරයන්හි මූල්‍ය වටිනාකම රු.මි.39,238 ක් වේ.

## 03.සමාජ ආරක්ෂණය

සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සමාජ ආරක්ෂණය වැඩි කිරීම සඳහා එම පවුල්වල උපත් 6,707 ක්, විවාහ සඳහා 29,544 දෙනෙකුට, ලෙඩ රෝග සඳහා 58,578 දෙනෙකුට, මරණ සඳහා 29,620 දෙනෙකුට ආදී වශයෙන් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ මුළු ප්‍රතිලාභීන් 1,521,741 ක් සඳහා රු.මි.1,159.47 ක් වියදම් කර ඇත.

## 04.ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්පාදනය

සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1074 මඟින් රු.මි.56,399.74ක් වටිනා මූල්‍ය පහසුකම් ලබා දීම. ලබා දී ඇති ණය ප්‍රමාණය 687,408කි.

## 3.7 අපේක්ෂිත සමාජ ආර්ථික ප්‍රතිඵලය

i. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජීවන මට්ටම ඉහළ දැමීම සඳහා, විවිධ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින්, 2018 වර්ෂයේදී පවුල් 125,000 මාසික ආදායම රු.5,000 කින් වර්ධනය කිරීම හා ඔවුන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම.

ii. නිවාස වැඩසටහන් යටතේ, නිවාස 5,014 ක් ඉදි කිරීම තුළින්, දිළිඳු පවුල්වල නිවාස අවශ්‍යතාවය සැපිරීම.

iii. ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් 331 ක් සහ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ළමයින් 3,400 ක් ජාතික මට්ටමේ සාහිත්‍ය තරඟ ජයග්‍රහණ ලබාගැනීම තුළින්, සමාජ සංවර්ධනය ඇති කිරීමට දායක වීම.

iv. දිවයිනේ දිස්ත්‍රික් 25 හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331 ක ව්‍යවසායක සංගම් ඇතිකිරීම තුළින් රටේ ආර්ථිකයට ශක්තිමත් දායකත්වයක් ලැබීම.

v. දිළිඳු පවුල් 1,384,021ක් සඳහා සමෘද්ධි සහනාධාර ලබා දීම තුළින්, ඔවුන්ගේ පාරිභෝජන අවශ්‍යතා සපුරාලීම.

vi. සමාජ ආරක්ෂණ වැඩසටහන් යටතේ, සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 1,521,741ක් දෙනෙකුට උපත්, විවාහ, ලෙඩරෝග, මරණ හා ළමුන්ගේ අධ්‍යාපනය වැනි අවස්ථා වලදී මූල්‍ය ආධාර ලබා දීම තුළින්, එම පවුල්වල සමාජ ආරක්ෂණය වර්ධනය වීම.

vii. සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1074 මඟින් රු.මි.56,399.74ක් වටිනා මූල්‍ය පහසුකම් ලබා දීම තුළින්, රටේ දළ දේශීය නිෂ්පාදිතයට ඉහත සැපයූ ණය මෙන් කීප ගුණයක දායකත්වයක් සැපයීම.

## 3.8 අනුමත වාර්ෂික අයවැය-2018

| ප්‍රාග්ධන(රු.මි.) | පුනරාවර්තන(රු.මි.) |
|---|---|
| 2,038.4 | 14,163.7 |

## 3.9 2018.01.01 සිට 2018 12.31 දක්වා වියදම

| මූල්‍ය ප්‍රභවය | ප්‍රතිපාදන(රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|
| ප්‍රාග්ධන | 2,038.40 | 1,097.19 |
| පුනරාවර්තන | 14,165.60 | 12,993.89 |
| අරමුදල් | _ | _ |
| සමෘද්ධි සහනාධාර | 39,600.00 | 39,238.00 |
| සමාජ ආරක්ෂණ අරමුදල | 1,668.00 | 1,159.47 |
| නිවාස ලොතරැයි අරමුදල | 834.00 | 794.40 |
| ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අරමුදල | - | 56,399.74 |

## 3.10 ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑ අභියෝග

i. දෙපාර්තමේන්තු නිලධාරීන් සම්බන්ධ පරිපාලන ගැටළු නිරාකරණය නොවීම හේතුවෙන්, උද්ගත වී ඇති ගිණුම් හා ක්ෂේත්‍ර ගැටළු නිරාකරණය කර ගැනීමට නොහැකි වීම.

ii. නිසි කලට වේලාවට භාණ්ඩාගාර මුදල් ලැබීම ප්‍රමාදවීම නිසා සැලසුම් කළ කාල පරිච්ඡේදයට ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.

iii. අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරුන් වරින් වර වෙනස්වීම නිසා ක්‍රියාත්මක සැලැස්ම වරින් වර වෙනස් වීම.

## 3.11 ලබාගත් සමස්ථ ජයග්‍රහණ

i. දිළිඳු පවුල් 1,384,021ක් සඳහා සමෘද්ධි සහනාධාර ලබාදී ඔවුන්ගේ පාරිභෝජන අවශ්‍යතා සපුරාලීම. 2018.01.01 සිට 2018.12.31 දක්වා ලබා දී ඇති සහනාධාරයන්හි මූල්‍ය වටිනාකම රු.මි. 39,238 ක් වේ.

ii. සමෘද්ධි ප්‍රතිලාභි පවුල්වල සමාජ ආරක්ෂණය වැඩි කිරීම සඳහා එම පවුල්වල උපත් 6,707 ක් සඳහාත්, විවාහ 29,544 ක් සඳහාත්, ලෙඩ රෝග 58,578 ක් සඳහාත්, මරණ 29,620 ක් සඳහාත් සහ ශිෂ්‍යත්ව 15,000 ක් සඳහාත් වශයෙන් මුළු පවුල් 1,521,741 කට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීම. මේ දක්වා ලබා දී ඇති සමාජ ආරක්ෂණ ප්‍රතිලාභයන්හි මූල්‍ය වටිනාකම රු.මි.1,159.47 ක් වේ.

iii. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජීවන මට්ටම ඉහල දැමීම සඳහා කෘෂිකාර්මික ව්‍යාපෘති 2,163 ක්, සත්ව පාලන ව්‍යාපෘති 1,139 ක්, ධීවර ව්‍යාපෘති 170 ක්, කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති 7,728 ක් සහ තරුණයින් 312 ක් සඳහා රැකියාභිමුඛ පුහුණුව ලබාදීම ඇතුළු මුළු ව්‍යාපෘති 19,147 ක් නිම කිරීම (මූල්‍ය වියදම රු.මි.506.89 ක් වේ)

iv. දිරිය පියස නිවාස වැඩසටහන යටතේ, එක් අයෙකුට රු.150,000 බැගින් වන පරිදි, පුද්ගලයින් 1,018 ක් සඳහා නිවාස 1,018 ක් ඉදි කිරීම. (මූල්‍ය වියදම රු.මි.187.32 ක් වේ.)

v. කැකුළු ළමා සමාජ වැඩසටහන යටතේ ළමයින් 3,400 ක් ජාතික මට්ටමේ සාහිත්‍ය හා සංස්කෘතික තරඟ මඟින් තෝරාගෙන ඔවුන්ගේ දක්ෂතා ඇගයීම.

vi. දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශිය මට්ටමින් වෙළඳ ප්‍රදර්ශන 22 ක් පැවැත්වීම තුළින් ව්‍යවසායකයින් 3,000 ක් පමණ පිරිසකට වෙළඳපල අවස්ථා සලසාදීම. ව්‍යවසාය සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම යටතේ ව්‍යවසායකයින් 1,546 ක් සඳහා පහසුකම් ලබාදීම, ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන් 609 ක් පැවැත්වීම (මූල්‍ය වියදම රු.මි.110.5 ක් වේ).

vii. නිවාස ලොතරැයි වැඩසටහන යටතේ එක් අයෙකුට රු.200,000/- බැගින් වන පරිදි ප්‍රතිලාභීන් 3,972 දෙනෙකු සඳහා නිවාස 3,972 ක් ඉදි කිරීම (මූල්‍ය වියදම රු.මි.794.4 ක් වේ).

viii. විශේෂ නිවාස වැඩසටහන යටතේ පුද්ගලයින් 24 ක් සඳහා එක් අයෙකුට රු.200,000/- බැගින් වන පරිදි නිවාස 24 ක් ඉදි කිරීම (මූල්‍ය වටිනාකම රු.මි.4.70 ක් වේ).

ix. මත්ද්‍රව්‍ය භාවිතය වැනි අයහපත් ගති පැවතුම් නිසා පවුල් ඒකක මුහුණපාන ගැටළු අවම කර ඔවුන් තුළ සතුට හා සහජීවනය ගොඩනැංවීම සඳහා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් 316 ක් ක්‍රියාත්මක කර පවුල් ඒකක තුළ සතුට හා සමගිය වැඩි දියුණු කිරීම (මූල්‍ය වියදම රු.මි.7.02 ක් වේ).

x. ප්‍රජාමූල බැංකු 1074 ක් මඟින් ප්‍රතිලාභීන් 687,408ට රු.මි. 56,399.74ක් වටිනා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම.

## 3.12 2018.12.31 දක්වා ක්‍රියාත්මක කල ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල තොරතුරු

| | |
|---|---|
| වැඩසටහන - අංක 01 | "සමෘද්ධි අරුනළු" කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති වැඩසටහන |
| ක්‍රියාකාරකම් | ✓ කෘෂිකර්ම ව්‍යාපෘති 2,163 ක් සඳහා රු.මි.65.71 ක් වැයකර සමෘද්ධි ප්‍රතිලාභීන් 2,163 දෙනෙකු සවිබල ගන්වා ඇත.<br>✓ සත්ත්ව පාලන ව්‍යාපෘති 1,139 ක් සඳහා රු.මි. 45.08 ක් වැයකර සමෘද්ධි ප්‍රතිලාභීන් 1,139 දෙනෙකු සවිබල ගන්වා ඇත.<br>✓ ධීවර සංවර්ධන ව්‍යාපෘති 170 ක් සඳහා රු.මි. 6.50 ක් වැයකර සමෘද්ධි ප්‍රතිලාභීන් 170 දෙනෙකු සවිබල ගැන්වීමට ක්‍රියාකර ඇත.<br>✓ සුළු කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති 7,728 ක් සඳහා රු.මි. 248.80 ක් වැයකර සමෘද්ධි ප්‍රතිලාභීන් 7,728 දෙනෙකු සවිබල ගැන්වීමට ක්‍රියාකර ඇත.<br>✓ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල රැකියා විරහිත හා පාසල් හැරගිය තරුණ දරුවන් 312 දෙනෙකුට රැකියා අභිමුඛ පුහුණුව ලබා දීම සඳහා රු.මි. 8.89 ක් වැයකර ඇත. |
| ස්ථාන | දිස්ත්‍රික් 25 තුළ සෑම ග්‍රාම නිලධාරි වසමකම ක්‍රියාත්මකයි. |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභීන් |
| කාල සීමාව | 2018.01.01. – 2018.12.31 |
| ප්‍රතිඵල | සමෘද්ධි ප්‍රතිලාභීන් 11,512 ක් සවිබල ගැන්වීමට ක්‍රියාකර ඇත. |
| 2018.12.31 දක්වා වියදම | වෙන් කර ඇති මුදලින් එනම් රු 438.93 න් රු.මි.374.98 ක් වැයකර ව්‍යාපෘති 11,512 ක් නිම කර ඇත. |

| | |
|---|---|
| වැඩසටහන - අංක 02 | සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන |
| ක්‍රියාකාරකම් | ✓ සමෘද්ධි නිෂ්පාදන ගම්මාන 47 ක් සංවර්ධනය කිරීම සඳහා හඳුනා ගෙන ඇත. ඉන් ගම්මාන 34 ක පහත පරිදි ව්‍යාපෘති අනුමත කර ඇත.<br>✓ පේෂ කර්මාන්ත නිෂ්පාදන ගම්මාන 01, මැටි ආශ්‍රිත ගම්මාන 03 ක්, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන 02ක්, දොර අගුල් නිෂ්පාදන ගම්මාන 01ක්, පාපිසි ගම්මාන 01 ක්,<br>✓ කිරි නිෂ්පාදන ගම්මාන 03ක්, එළු පාලන ගම්මාන 01 ක්, කෝමාරිකා වගා ගම්මාන 01 ක්,<br>✓ ධීවර ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන 01 ක්, බිම්මල් වගා ගම්මාන 01 ක්, විසිතුරු මල් / කැපු මල්, විසිතුරු පැළ නිෂ්පාදන ගම්මාන 08 ක්, කෙසෙල් ඇතුළු පලතුරු හා එළවළු ගම්මාන 03 ක්, මීමැසි පාලනය ආශ්‍රිත ගම්මාන 01 ක්<br>✓ රසකැවිලි ගම්මාන 01 ක්, කුරුඳු / ගම්මිරිස් වගා ගම්මාන 02 ක්, කිතුල් නිෂ්පාදන ගම්මාන 01 ක්, වසවිස නැති කෘෂි නිෂ්පාදන/ දේශීය අල වගා ගම්මාන 03 බැගින් ආදිය වේ. |
| ස්ථාන | දිස්ත්‍රික් 25 ක් තුළ එක් දිස්ත්‍රික්කයකට ගම්මාන 1-2 අතර |
| ඉලක්ක කණ්ඩායම | නිෂ්පාදන කටයුතු සඳහා/ අඩු ආදායම්ලාභීන්/ සමෘද්ධි ප්‍රතිලාභීන්/ පාසල් හැරගිය තරුණ තරුණියන් ප්‍රජා දායකත්වය ලබාදිය හැකි පුද්ගලයින් |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| ප්‍රතිඵල | ප්‍රතිලාභීන් දැනුම්වත් කිරීමේ රැස්වීම් පවත්වා ඇත. |
| 2018.12 31.දක්වා වියදම | ප්‍රතිපාදන රු.මි. 109.77 ක් වෙන් කර ඇත. වියදම රු.මි. 65.28 කි. |

| | |
|---|---|
| වැඩසටහන - අංක 03 | සමෘද්ධි ආදර්ශ ගෙවතු සංවර්ධන වැඩසටහන |
| ක්‍රියාකාරකම් | ✓ 2018 වසරේ සවිබලගැන්වීමට ඉලක්ක කර ඇති සමෘද්ධි පවුල් 125,000 ක ගෙවතු සංවර්ධනය සඳහා ප්‍රතිලාභීන් යොමු කරවීම.<br>✓ සෑම ග්‍රාම නිලධාරි වසමකින්ම හොඳම ආදර්ශ ගෙවතු සඳහා රු. 5,000/- බැගින් ත්‍යාග දීමනා ලබා දීම.<br>✓ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හොඳම ආදර්ශ ගෙවතු 03 සඳහා රු. 15,000/- බැගින් රු. 45,000/- ක ත්‍යාග දීමනා ලබා දීම.<br>✓ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගනු ලබන හොඳම දිරිය තරුණ ගොවීන් තිදෙනා සඳහා රු. 15,000/- බැගින් රු. 45,000/- ක ත්‍යාග දීමනා ලබා දීම.<br>✓ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ නිලධාරින්, දිස්ත්‍රික්, බැංකු හා වසම් මට්ටමින් වූ නිලධාරීන් සඳහා එළවළු බීජ පැල ලබා දීම |
| ස්ථාන | දිස්ත්‍රික් 25 තුළ සෑම ග්‍රාම නිලධාරි වසමකම |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභීන් |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| ප්‍රතිඵල | ප්‍රතිලාභීන් දැනුවත් කර ඇත. |
| 2018.12 31.දක්වා වියදම | ප්‍රතිපාදන රු.මි. 82.65ක් වෙන් කර ඇත. වියදම රු.මි.50.74 කි. |

| | |
|---|---|
| වැඩසටහන - අංක 04 | විශේෂ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන |
| ක්‍රියාකාරකම් | ✓ නිෂ්පාදන කටයුත්තක් වඩාත් වර්ධනය කිරීම සඳහා පහසුකම් සැපයීම.<br>✓ ජීවනෝපාය ව්‍යාපෘතීන් හි නියුතු ප්‍රතිලාභින්ගේ ධාරිතා වර්ධනය.<br>✓ නිෂ්පාදන අතරමැදියන්ගේ මැදිහත්වීමක් නොමැතිව අලෙවිකර ගැනීම සඳහා සෘජුවම රාජ්‍ය හෝ පෞද්ගලික අංශය සමඟ සම්බන්ධ කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම.<br>✓ ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන තරඟකාරී වෙළඳපොලට ගැලපෙන පරිදි ප්‍රවර්ධනයට අවශ්‍ය පුහුණු වැඩසටහන් හා නව තාක්ෂණ දැනුම උපයෝගී කරගෙන අගය එකතු කළ නිෂ්පාදන වෙළඳපොලට සැපයීම.<br>✓ නව ආදායම් උත්පාදන නිෂ්පාදනයන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම. |
| ස්ථාන | දිස්ත්‍රික් 25 තුළ |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභින්/ අඩු ආදායම්ලාභීන් |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| ප්‍රතිඵල | ව්‍යාපෘති 546 ක් අනුමත කර ඇත. ඉන් ව්‍යාපෘති 341 ක් නිම කර ඇත. |
| 2018.12 31.දක්වා වියදම | ප්‍රතිපාදන රු.මි. 30.07ක් වෙන් කර ඇත. වියදම රු.මි.12.17 කි. |

| | |
|---|---|
| වැඩසටහන - අංක 05 | ජීවනෝපායට ඉවහල්වන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන |
| ක්‍රියාකාරකම් | ග්‍රාමීය මාර්ග සංවර්ධනය<br>ග්‍රාමීය ජල යෝජනා ක්‍රම සංවර්ධනය<br>කුඩා වාරි මාර්ග සංවර්ධනය |
| ස්ථාන | දිස්ත්‍රික්ක 25 තුළ |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභින් / අඩු ආදායම්ලාභින් |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| ප්‍රතිඵල | ජීවනෝපාය සංවර්ධනයට ඉවහල්වන මාර්ග සංවර්ධන ව්‍යාපෘති 5 ක් අනුමත කර ඇත. |
| 2018.12.31 දක්වා වියදම | ප්‍රතිපාදන රු.මි. 42 ක් වෙන් කර ඇත. වියදම් කල මුදල රු.මි. 3.44 කි. |

| | |
|---|---|
| වැඩසටහන - අංක 06 | සමෘද්ධි කැකුළු ළමා සමාජ, ළමා ආරක්ෂණ හා සංස්කෘතික වැඩසටහන |
| ක්‍රියාකාරකම් | සමෘද්ධි කැකුළු ළමා සමාජ නායකයින්ගේ නායකත්ව හැකියාව වර්ධනය කිරීම<br>සමෘද්ධි කැකුළු ළමා සමාජ දරුවන්ගේ හැකියාවන් දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික මට්ටමින් ඇගයීම<br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ළමා සමාජ පුස්තකාල 75 ක් ආරම්භ කිරීම |
| ස්ථාන | සියළුම දිස්ත්‍රික්කවල හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| ඉලක්ක කණ්ඩායම | ( ප්‍රතිලාභින් ගණන) සමෘද්ධි කැකුළු ළමා සමාජ 11,953 ක දරුවන් 367,566 කි |
| කාල සීමාව | 2018.02.01– 2018.11.30 |
| ප්‍රතිඵල | ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් කැකුළු ළමා සමාජ තරඟ |

| | |
|---|---|
| | පවත්වා අවසන් කර ඇත. පුස්තකාල සඳහා අවශ්‍ය පහසුකම් සපයා ඇත. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.17.89 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 07 | දිරිය පියස නිවාස වැඩසටහන |
| ක්‍රියාකාරකම් | නිවසක හිමිකාරිත්වය නොමැතිකමින් විවිධ පීඩනයන්ට ලක්ව ඇති අඩු ආදායම්ලාභී ප්‍රජාව හඳුනාගෙන ඔවුන්ගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම. වෙන්කර ඇති මුදල.රු.මි. 200.02 කි. |
| ස්ථාන | දිස්ත්‍රික්ක 25 තුළ |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභීන් / අඩු ආදායම්ලාභීන් |
| කාල සීමාව | 2018.03.13– 2018.12.31 |
| ප්‍රතිඵල | දිස්ත්‍රික් මට්ටමින් නිවාස 1018 ක් ඉදිකිරීම් අවසන් කර ඇත. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.187.32 කි. |

| | |
|---|---|
| වැඩසටහන - අංක 08 | දුම්වැටි හා මත්ද්‍රව්‍ය නිවාරණය, ගෘහ කළමනාකරණය හා සතුටු පවුල් වැඩසටහන |
| ක්‍රියාකාරකම් | ආර්ථික සංවර්ධනයට සමගාමීව සමාජ සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයෙන් අත්මිදී විධිමත් ගෘහ කළමනාකරණ ක්‍රමවේදයක් අනුගමනය තෘප්තිමත් පවුල් ජීවිතයක් ගත කිරීමට ප්‍රජාවට මඟ පෙන්වීම. වෙන්කර ඇති මුදල රු.මි.10 කි. |
| ස්ථාන | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස |
| ඉලක්ක කණ්ඩායම | සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල සමෘද්ධි සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ හඳුනාගත් පවුල් |
| කාල සීමාව | 2018.03.13 - 2018.11.30 |
| ප්‍රතිඵල | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැඩසටහන් 316 ක් පවත්වා පුද්ගලයන් 25,375ක් දැනුවත් කර ඇත. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි. 7.02 කි. |

| | |
|---|---|
| වැඩසටහන - අංක 09 | උපදේශන වැඩසටහන මේ සඳහා වෙන්කළ මුදල රු.මි.17.50 |
| ක්‍රියාකාරකම් | ✓ සමෘද්ධි සමාජ සංවර්ධන නිලධාරීන්ගේ මනෝ සමාජීය වර්ධනය කිරීමේ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව<br>✓ සමාජ සංවර්ධන වැඩසටහන සඳහා උපදේශනය පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම<br>✓ මානසික සවිබල ගැන්වීම ඉලක්ක කර ප්‍රජාව සඳහා පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කිරීම |
| ස්ථාන | සියළුම දිස්ත්‍රික්කවල හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභීන් 25,000 ක් නිලධාරීන් 700 ක් |
| කාල සීමාව | 2018.03.13 - 2018.11.30 |

| | |
|---|---|
| ප්‍රතිඵල | නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 5 ක් පවත්වා ඇත. උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර ඇත. ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩමුළු 246 ක් පවත්වා අවසන් කර ඇත. |
| 2018.12.31 දක්වා වියදම | රු. මි. 12.74 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 10 | සමෘද්ධි හරිත දයාද ආදායම් උත්පාදන වැඩසටහන |
| ක්‍රියාකාරකම් | සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභී පවුල් වල 2017 වර්ෂයේ හා 2018.06.30 දක්වා සිදු වු දරු උපත් පදනම් කරගෙන ආර්ථික හා වාණිජ වශයෙන් ඵලදායි පැළ රෝපණය කිරීම. මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 25 ප්‍රතිපාදන වෙන්කර ඇත. |
| ස්ථාන | වැඩසටහන ක්‍රියාත්මක කරන දිස්ත්‍රික් වල හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභීන්/ අඩු ආදායම්ලාභීන් 5000 ක් |
| කාල සීමාව | 2018.03.13 - 2018.12.31 |
| ප්‍රතිඵල | ප්‍රතිලාභින් 8575 ක් සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්බන්ධිකරණය කර අවශ්‍ය පැළ ලබා දී ඇත. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.18.89 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 11 | ප්‍රගති සමාලෝචනය |
| ක්‍රියාකාරකම් | සමෘද්ධි සමාජ සංවර්ධන වැඩසටහනේ ඉලක්ක සාධනය කර ගැනීම සඳහා දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් මාසිකව හා කාර්තුමය වශයෙන් ප්‍රගතිය මැනබැලීම. |
| ස්ථාන | වැඩසටහන ක්‍රියාත්මක කරන දිස්ත්‍රික් හා ප්‍රධාන කාර්යාල |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි නිලධාරින් |
| කාල සීමාව | 2018.03.13 - 2018.12.31 |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.1.53 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 12 | ව්‍යවසාය සංවර්ධන වැඩසටහන |
| ක්‍රියාකාරකම් | සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ දැනට ව්‍යාපාරයක් කරනු ලබන ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර වැඩිදියුණු කර ගැනීමට හා අළුතින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන සමෘද්ධි ප්‍රතිලාභීන් ව්‍යවසායකයින් ලෙස ව්‍යාපෘති ගැන්වීම තුළින් ඔවුන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීම උදෙසා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.<br>ව්‍යවසාය සංවර්ධනයට අදාළ යටිතල පහසුකම් සැලසීම.<br>(ජංගම රථ, අලෙවි කුටි,ගෘහස්ථ ගබඩා හා සුළු පරිමාණ යන්ත්‍ර හා උපකරණ වැනි )<br>ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම හා නව වෙළඳපොල අවස්ථා ඇති කිරීමේ අරමුණින් වෙළඳ ප්‍රදර්ශන හා අලෙවි පොල වැඩසටහන් සංවිධානය කිරීම. |

| | |
|---|---|
| | කාන්තාවන් සඳහා ක්ෂණික ආහාර තාක්ෂණය සම්බන්ධ පුහුණුවක් ලබාදීම.<br>V 2025 එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශනය.<br>සමෘද්ධි අලෙවි මධ්‍යස්ථාන පිහිටුවීම<br>සමෘද්ධි ප්‍රතිලාභීන් 14000 ක් නව ව්‍යවසායකයින් ලෙස ව්‍යාපෘති ගැන්වීමට අදාලව පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>(ව්‍යවසාය සංවර්ධන චක්‍රලේඛණය මගින් ආවරණය නොවන එහෙත් ව්‍යවසාය සංවර්ධනයට සෘජුවම දායක කරගත හැකියැයි හඳුනා ගනු ලබන ව්‍යාපෘති ) |
| ස්ථාන | දිස්ත්‍රික්ක 25 තුළ |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභී පවුල් |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| ප්‍රතිඵල | ව්‍යවසාය සංවර්ධන යටිතල පහසුකම් සැලසීම යටතේ ව්‍යවසායකයින් 1,546ක් ව්‍යාපෘති ගන්වා ඇති අතර ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන් 609 ක් තුළින් ප්‍රතිලාභීන් 26,255ක් සඳහා පුහුණුව ලබාදී ඇත. දිස්ත්‍රික් වෙළඳ ප්‍රදර්ශන 22ක් පවත්වා ප්‍රතිලාභීන් 3,000 ආසන්න පිරිසකට වෙළඳපල අවස්ථා සලසාදීමට කටයුතු කර ඇත. සමස්ථ වැඩසටහන තුළින් සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 8,691ක් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට කටයුතු කර ඇත. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි. 110.5 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 13 | සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරුවන් සඳහා නීතිමය සවිබල ගැන්වීම් වැඩසටහන. |
| ක්‍රියාකාරකම් | සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරුවන් සඳහා නීතිමය සවිබල ගැන්වීම් වැඩසටහන් දෙකක් නිල්ලඹ හා බලංගොඩ පුහුණු මධ්‍යස්ථානවල දී පවත්වන ලදී. |
| ස්ථාන | නිල්ලඹ හා බලංගොඩ පුහුණු මධ්‍යස්ථානයන් |
| ඉලක්ක කණ්ඩායම | මධ්‍යම පළාත, ඌව පළාත, සබරගමුව පළාත හා දකුණු පළාත් වල සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරුවන් 114 |
| කාල සීමාව | 2018.05.03 - 2018.05.05 මධ්‍යම පළාත, ඌව පළාත සහ කෑගල්ල දිස්ත්‍රික්කය<br>2018.08.14 - 2018.08.15 මාතර, හම්බන්තොට, මොණරාගල හා කළුතර දිස්ත්‍රික්කය |
| ප්‍රතිඵල | කෑගල්ල දිස්ත්‍රික්කයේ සමෘද්ධිලාභී/ අඩු ආදායම්ලාභී 269 කගේ දැනට පවතින නෛතික ගැටළු හඳුනා ගැනීමට හැකිවීම. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි. 0.14 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 14 | සමෘද්ධි ප්‍රජා මූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන් සඳහා බැංකු විෂයට අදාළ නෛතික ගැටලු නිරාකරණය කිරීම පිළිබඳ වැඩමුළු පැවැත්වීම. |
| ක්‍රියාකාරකම් | මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රජා මූල සමෘද්ධි බැංකු / සමිති කළමණාකරුවන් සඳහා බැංකු විෂයට අදාළ නෛතික ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය භාවිතය පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම. |
| ස්ථාන | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. |

| | |
|---|---|
| ඉලක්ක කණ්ඩායම | මහනුවර දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරුවන් |
| කාල සීමාව | 2018.01.06 (එක් දින වැඩමුළුවකි) |
| ප්‍රතිඵල | දීර්ඝ කාලයක් තිස්සේ සමෘද්ධි බැංකු නිලධාරීනගේ නොවිසඳී පැවති නෛතික ගැටලු විසඳාගැනීම සඳහා අවශ්‍ය සවිබලගැන්වීම සිදුකිරීම. |

| | |
|---|---|
| වැඩසටහන - අංක 15 | සමෘද්ධි ප්‍රජා මූල බැංකු වල පැහැර හැර ඇති ණය අයකරගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සිදුකිරීම . |
| ක්‍රියාකාරකම් | ණය පැහැර හැර ඇති ණය ලාභීන් වෙත ණය ගෙවන ලෙසට එන්තරවාසියක් මඟින් දැනුම්දීමට කටයුතු කිරීම. ණය පැහැර ඇති ණයලාභීන් අදාළ සමෘද්ධි බැංකු වෙත කැඳවා ගිවිසුම් කොන්දේසි කඩ කල විට දිසා අධිකරණයේ නඩු පවරා ණය මුදල අයකරගැනීමට කටයුතු හැකි බැවින් ඊට පෙර ණය මුදල් බැංකුවට ගෙවා ඉන් නිදහස් වන ලෙසට උපදෙස් ලබා දීම. |
| ස්ථාන | පිළියන්දල, මන්දාරම්නුවර, මතුරට, වතුමුල්ල, බුළුගහපිටිය හා ගෝමරන්කඩවල යන සමෘද්ධි බැංකු. |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි බැංකු ප්‍රතිලාභීන් |
| වැඩසටහන ආරම්භ කල දිනය | 2018.05.04 |
| ප්‍රතිඵල | බොල් ණය බවට පත්ව තිබූ ණය විශාල සංඛ්‍යාවක් අයවීම.<br>දීර්ඝ කාලයක් තිස්සේ සමෘද්ධි බැංකු නිලධාරීන්ගේ නොවිසඳී පැවති නෛතික ගැටලු විසඳාගැනීම සඳහා අවශ්‍ය සවිබලගැන්වීම සිදුකිරීම. |
| වැඩසටහන - අංක 15 | සමෘද්ධි ප්‍රජා මූල බැංකු වල පැහැර හැර ඇති ණය අයකරගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සිදුකිරීම . |

| | |
|---|---|
| වැඩසටහන - අංක 16 | ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳව පුහුණු කරුවන් ලෙස සමෘද්ධි කළමණාකරුවන් පුහුණු කිරීම. |
| ක්‍රියාකාරකම් | <u>පළමු අදියරේ</u> දී කළමණාකරුවන් පුහුණු කිරීම සිදු කරුනු ලැබේ .<br><u>දෙවන අදියරේදී</u> මෙම පුහුණු කරුවන් යොදවා ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් පුහුණු කරනු ලැබේ.<br><u>තෙවන අදියරේදී</u> සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ව්‍යාපාර හා ව්‍යාපෘති සඳහා අවශ්‍ය ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ දැනුම ලබා දීම හා මග පෙන්වීම සිදුකිරීමට බලාපොරොත්තු වේ. මෙමගින් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති බල ගැන්වීම අපේක්ෂා කෙරේ. |
| ස්ථාන | කළමණාකරුවන් පුහුණු කිරීම නිල්ලඹ හා සමනල වැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන වලදී සිදුකරනු ලැබේ. සමෘද්ධි සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම දිස්ත්‍රික්ක මට්ටමෙන් තෝරාගත් පුහුණු මධ්‍යස්ථාන වලදී සිදු කරයි. |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි කළමණාකරුවන් - 200<br>සමෘද්ධි සංවර්ධන නිලධාරීන් -7,935 |
| කාල සීමාව | 2018.03.01 – 2018.12.31 |
| ප්‍රතිඵල | මෙම ව්‍යාපෘතියේ සමෘද්ධි කළමණාකරුවන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය YOULEAD ආයතනය මඟින් ලබා දීම. ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය හා පුහුණු වියදම් YOULEAD ආයතනය මඟින් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.<br>2018 වර්ෂය තුළ සමෘද්ධි ප්‍රතිලාභීන් 14,000 ක් ව්‍යවසායකයින් ලෙස |

| | |
|---|---|
| | සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. |
| 2018.12.31 දක්වා වියදම | රු .මි.0.373 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 17 | මානව සම්පත් සංවර්ධන වැඩසටහන |
| ක්‍රියාකාරකම් | ✓ තම අවශ්‍යතාවය පරිදි තෝරා ගත් පාඨමාලාවන් සඳහා නිලධාරීන් හට අධ්‍යයන පාඨමාලා සඳහා ගාස්තු ගෙවීම.<br>✓ නිලධාරීන් දැනුවත් කිරීම.<br>✓ නිලධාරීන්ගේ ඉල්ලුම් පත්‍ර කැඳවීම.<br>✓ අත්පත්‍රිකා සකසා කමිටු නිර්දේශයට යොමු කිරීම.<br>✓ කමිටු නිර්දේශය හා අනුමැතිය ලබා ගැනීම.<br>✓ ගෙවීම් කටයුතු සඳහා ගිණුම් අංශයට යොමු කිරීම. |
| ඉලක්ක කණ්ඩායම | ආයතනයේ නිලධාරීන් |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| ප්‍රතිඵල | නිලධාරීන් 25 දෙනෙකු අධ්‍යයන පාඨමාලා සඳහා යොමු කිරීම |
| 2018.12.31 දක්වා වියදම | රු.මි. 0.61 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 18 | මානව සම්පත් සංවර්ධන වැඩ සටහන |
| ක්‍රියාකාරකම් | ✓ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා මානව සම්පත් සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලා සඳහා යොමු කිරීම.<br>✓ මේ සඳහා නිලධාරීන්ගේ දිස්ත්‍රික් මට්ටමින් නාම යෝජනා කැඳවීම තෝරා ගැනීම සඳහා ශ්‍රම අධ්‍යන ආයතනය සමඟ ඒකාබද්ධව සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම.<br>✓ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සමඟ එකඟතාවය ගිවිසුම අත්සන් තැබීම. |
| ඉලක්ක කණ්ඩායම | නිලධාරීන් 50 ( මොවුන් දිස්ත්‍රික් මට්ටමින් තෝරා සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගෙන ඇත.) |
| කාල සීමාව | 2018.04.30 - 2019.02.30 |
| ප්‍රතිඵල | මෙම පාඨමාලාව 2018.10.04 ආරම්භ විය. |

| | |
|---|---|
| වැඩසටහන - අංක 19 | මානව සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ නිලධාරීන් විදේශ ශිෂ්‍යත්ව සඳහා යොමු කිරීම |
| ක්‍රියාකාරකම් | ✓ නිලධාරීන් දැනුවත් කිරීම.<br>✓ සුදුසු නිලධාරීන්ගේ අයදුම්පත් කැඳවීම.<br>✓ කමිටු නිර්දේශයට යෙමු කිරීම.<br>✓ අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීම . |
| ඉලක්ක කණ්ඩායම | ආයතන නිලධාරීන් |
| කාල සීමාව | 2018.01.01. – 2018.12.31 |
| ප්‍රතිඵල | නිලධාරීන් 10 දෙනෙක් යොමු කර ඇත |
| 2018.12.31 දක්වා වියදම | අංශයේ ප්‍රතිපාදන වැය නොවේ . |

| | |
|---|---|
| වැඩසටහන - අංක 20 | නිල්ලඹ ජීවනෝපාය සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය සඳහා කම්කරුවන් යොමු කර ගැනීමට කටයුතු කිරීම. |
| ක්‍රියාකාරකම් | ✓ මධ්‍යස්ථාන භූමියේ පිහිටි අතිරේක ගස් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.<br>✓ මධ්‍යස්ථානයේ අතිරේක ආදායම් මාර්ග ලෙස තේ වගා කිරීමට කටයුතු කිරීම.<br>✓ මධ්‍යස්ථානයේ ගොඩනැගිලි අඩුපාඩු සකස් කිරීම - අවශ්‍ය ඇස්තමේන්තු ගත කිරීම හා ඒවා සකස් කිරීමට මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කිරීම. |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| ප්‍රතිඵල | අවශ්‍ය පුහුණු උපකරණ හා ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා මූලික කටයුතු නිමවා ඇත. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.15 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 21 | පරිගණක සාක්ෂරතා අවබෝධයක් රහිත ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සඳහා පරිගණක පුහුණුව ලබා දීම. |
| ක්‍රියාකාරකම් | ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතා වැඩි දියුණු කිරීම සඳහා කණ්ඩායම් වශයෙන් නිලධාරීන් 75 කට පරිගණක පුහුණුව සඳහා අනුමැතිය ලබා දීම. |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| ප්‍රතිඵල | නිලධාරීන් 75 ක් පරිගණක පුහුණුව සඳහා යොමු කිරීම. |

| | |
|---|---|
| වැඩසටහන - අංක 22 | දිළිඳු පවුල් සවිබලගැන්වීම උදෙසා විපර්යකාරකයෙකු ලෙස සමෘද්ධි සංවර්ධන නිලධාරී භූමිකාව පිළිබඳ කාර්ය බද්ධ පුහුණුව සිංහල මාධ්‍යය (අනුරාධපුර, පොළොන්නරුව, මුලතිව් දිස්ත්‍රික්ක.) |
| ක්‍රියාකාරකම් | අදියර 1 - භූමිකා රංගන, කණ්ඩායම් සාකච්ඡා, කණ්ඩායම් ඉදිරිපත් කිරීම් ඇතුළුව කාර්ය බද්ධ පුහුණුව සිදු කිරීම.<br>අදියර 2 - කාර්ය බද්ධ පුහුණුවෙන් පසුව පුහුණුලාභීන් ප්‍රතිලාභී පවුල් 10 ක් තෝරාගෙන ඔවුන් සඳහා පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම හා නැවත සති 03 කින් පැවැත්වෙන පෝෂණ වැඩසටහනේදී පවුල් 10 පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම. |
| ස්ථාන | ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය, පිළිමතලාව |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි නිලධාරීන් |
| කාල සීමාව | 2018.08.26 - 2018.08.29 |
| ප්‍රතිඵල | අනුරාධපුර, පොළොන්නරුව, මුලතිව් දිස්ත්‍රික්ක වල ප්‍රතිලාභී පවුල් 700 ක පවුල් සංවර්ධන සැලැස්ම සකස් කිරීම. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.0.31 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 23 | සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල කාන්තාවන් සවිබලගැන්වීමේ වැඩමුළුව පුහුණු කිරීම. |
| ක්‍රියාකාරකම් | සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 100 ක් දැනුවත් කරන ලදී. මෙම පවුල් 100 ට තම කුඩා කණ්ඩායම්වල 05 දෙනා දැනුවත් කරන ලෙසත්, ඔවුන්ගේ ප්‍රශ්න විසඳා ගැනීමටත් පුහුණු කරන ලදී. පුහුණු ක්‍රියාකාරකම් (භූමිකා රංගන, කණ්ඩායම් ඉදිරිපත් කිරීම්) |
| ස්ථාන | අනුරාධපුර, තලාව සමාජ සංවර්ධන ආයතන |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභී පවුල් |
| කාල සීමාව | 2018.08.05 – 2018.08.07 |
| ප්‍රතිඵල | මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය සමාජ සංවර්ධන ආයතනය මගින් ලබා දීම. වැඩසටහන අතරතුර ප්‍රතිලාභීන් දැක්වූ අදහස් අනුව ඔවුන්ගේ පවුල් වල විසඳාගත නොහැකිව පැවති ගැටළු විසඳාගැනීමට හැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී. එසේම කාන්තාවන් ලෙස ඔවුන්ගේ දුර්වලකම් මෙම වැඩ සටහනේ දී අවබෝධ වූ බවත් , එම දුර්වලකම් නිවැරදි කර ගැනීමට උත්සාහ කිරීම තුළින් පවුලේ සතුට වැඩි වෙමින් පවතින බව සඳහන් කරන ලදී. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.1.70 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 24 | සමාජ ආරක්ෂණ වැඩසටහන |
| ක්‍රියාකාරකම් | සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් ස්වකැමැත්තෙන් දෙනු ලබන මාසික දායකත්වය හා එම දායකත්ව මුදලින් ප්‍රතිලාභී ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි වන මුදල් රාජ්‍ය බැංකු වල ආයෝජනය කිරීමෙන් උපයා ගන්නා පොලී ආදායම් මඟින් මෙම අරමුදල ගොඩනැගී ඇත. එසේ ගොඩනගාගත් අරමුදල තුළින් සමෘද්ධි ප්‍රතිලාභීන්, අඩු ආදායම්ලාභීන් හා අවාසි සහගත තත්වයන්ට පත්වූ පුද්ගලයන්, කණ්ඩායම්, ආයතන සහ ප්‍රතිලාභී නොවන නිවුන් දරු උපත් සඳහා ප්‍රතිලාභ දෙනු ලැබේ. ප්‍රධාන වශයෙන් උපත්, නිවුන් දරු උපත්, විවාහ, රෝහල් ගතවීම, මරණ සහ සිප්දොර ශිෂ්‍යත්ව යන අපේක්ෂිත හා අනපේක්ෂිත සිදුවීම් සඳහා රක්ෂණ ක්‍රමවේදයක් වශයෙන් ප්‍රතිලාභ ලබා දේ. මීට අමතරව සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයින්, කණ්ඩායම්, ආයතන සඳහා මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර ලබා දේ. |
| ස්ථාන | වසම, සමෘද්ධි ප්‍රජා මූල බැංකුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල |
| ඉලක්ක කණ්ඩායම | සමස්ථ දිවයින පුරා වෙසෙන පවුල් 1,385,000 ආසන්න සමෘද්ධි ප්‍රතිලාභී පවුල් |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| ප්‍රතිඵල | ✓ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සිදුවන උපත් ,විවාහ, රෝග හා මරණ වැනි සිදුවීම් සඳහා මූලමය ප්‍රතිලාභ කඩිනමින් ගෙවීමට හැකිවීම.<br>✓ හදිසි ආපදා, ස්වභාවික විපත් ආදියේ දී සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරාකාර මණ්ඩලයේ අනුමැතිය මත ආපදාවට ලක්වූවන්ට |

කඩිනමින් සහන සැලසීමට හැකිවීම.

- ✓ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සිදුවන නිවුන් දරු උපත් සඳහා වර්ෂයක පෝෂණ ලබා දීමට හැකිවීම.
- ✓ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ මාසික අයකර ගන්නා රු.100/- මුදලින් ඉහත ප්‍රතිලාභ ගෙවා ඉතිරි මුදල් වැඩි පොලී අනුපාතයකට රාජ්‍ය බැංකුවල අයෝජනය කර අරමුදල වර්ධනය කිරීමට හැකිවීම.

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව | මුදල රු. |
|---|---|---|---|
| 1 | උපත් | 6,707 | 50,302,500.00 |
| 2 | විවාහ | 29,544 | 221,580,000.00 |
| 3 | රෝග | 58,578 | 158,661,380.00 |
| 4 | මරණ | 29,620 | 444,300,000.00 |
| 5 | ශිෂ්‍යත්ව | වසරකට 10,000 බැගින් | 219,186,000.00 |
| | එකතුව | | 1,094,029,880.00 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 25 | සමාජ විගණන කණ්ඩායම් බිහිකර ගැනීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරිමේ වැඩසටහන |
| ක්‍රියාකාරකම් | නව සමෘද්ධි වැඩසටහන, මූලික ගිණුම් ක්‍රමය, සමාජ විගණනය හැඳින්වීම |
| ස්ථාන | බොරලැල්ල ග්‍රාම සංවර්ධන හා පුහුණු පර්යේෂණ ආයතනය |
| ඉලක්ක කණ්ඩායම | 662 එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් ප්‍රජා නියෝජිතයින් දෙදෙනෙකු ඇතුළුව |
| කාල සීමාව | 2018.03.23 - 2018.05.25 |
| ප්‍රතිඵල | ප්‍රජා නායකයන් තුළ දැනුම, කුසලතා ආකල්ප වර්ධනය වීම. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.1.95 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 26 | දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම |
| ක්‍රියාකාරකම් | සමෘද්ධි ප්‍රජා මූල සංවිධානවල ,ප්‍රාදේශීය සංවිධානවල වැඩසටහන් අධීක්ෂණය කිරීම, නියාමනය කිරීම සහ ඇගයීම. දිස්ත්‍රික්කය තුළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ යෝජනා ඉදිරිපත් කිරීම, වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම. |
| ස්ථාන | දිස්ත්‍රික් ලේකම් කාර්යාල |
| ඉලක්ක කණ්ඩායම | ප්‍රාදේශීය සංවිධානවල සභාපතිවරු, ලේකම්වරු, ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්, දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරු, සංවර්ධන කටයුතු කරන තුන්දෙනෙකු |
| කාල සීමාව | සෑම වර්ෂයකම තුන්මසකට වරක් රැස්වීම පැවැත්වේ. |
| ප්‍රතිඵල | දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සහ මත සලකා බැලීම සහ ඒවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය , රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණය පැවැත්වීම. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.1.18 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 27 | ප්‍රජා පුහුණුකරුවන් (ප්‍රජා විපර්යකාරක) මඟින් සමෘද්ධි ප්‍රතිලාභීන් පුහුණු කිරීම. |
| ක්‍රියාකාරකම් | නව සමෘද්ධි වැඩසටහන, මූලික ගිණුම් ක්‍රමය, සමාජ විගණනය හැඳින්වීම |
| ස්ථාන | ප්‍රාදේශීය මට්ටමින් වැඩසටහන් පැවැත්වීම |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභීන් |
| කාල සීමාව | ප්‍රතිපාදන යවා ඇත. |
| ප්‍රතිඵල | ප්‍රජාව තුළ දැනුම, කුසලතා ආකල්ප වර්ධනය වීම |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.19.85 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 28 | ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනයට සමගාමීව ක්‍රියාත්මක කොඩි වැඩසටහන් |
| ක්‍රියාකාරකම් | ✓ කොඩි මුද්‍රණය කිරීම<br>✓ දිස්ත්‍රික් මට්ටමින් බෙදා හැරීම.<br>✓ ප්‍රාදේශීය හා ප්‍රජාමූල සංවිධාන මට්ටම බෙදා හැරීම<br>✓ වැඩසටහන ක්‍රියාත්මක කරමින් අරමුදල් එක් රැස් කිරීම. |
| ස්ථාන | සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල |
| ඉලක්ක කණ්ඩායම | සියළුම ප්‍රජාව |
| කාල සීමාව | සෑම වර්ෂයකම මැයි 31 දින සිට මසක කාලයක් |
| ප්‍රතිඵල | දුම්වැටි විරෝධී ලිපියට සමගාමීව මත් නිවාරණ වැඩසටහන් පැවැත්වීම හා කොඩි වැඩසටහන තුළින් එක්රැස් කරන ලද අරමුදලින් ප්‍රතිලාභීන්ගේ සුබසාධනය සඳහා යෙදවීම. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි. 56.54 (භාණ්ඩාගාර ප්‍රතිපාදන නොවේ) |

| | |
|---|---|
| වැඩසටහන - අංක 29 | ක්‍රීඩා සංවර්ධන හා ශාරීරික ක්‍රියාකාරකම් වැඩසටහන |
| ක්‍රියාකාරකම් | සමෘද්ධි නිලධාරීන් හා සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල දරුවන්ගේ ක්‍රීඩා කුසලතාවය වර්ධනය කිරීම. |
| ස්ථාන | සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි නිලධාරීන් සහ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල දරුවන් |
| කාල සීමාව | 2018.02.15 - 2018.12.31 |
| ප්‍රතිඵල | ✓ ලෝක මළල ක්‍රීඩා උළෙලට දෙදෙනකු සහභාගි කරවීම.<br>✓ ලෝක බොක්ෂිං තරඟාවලිය 2 වන ස්ථානය දිනා ගැනීම.<br>✓ රාජ්‍ය සේවා ක්‍රීඩා තරඟාවලියේ ක්‍රිකට් කණ්ඩායම 16 කණ්ඩායමට ඇතුළු වීම.<br>✓ එල්ලේ ගැහැණු /පිරිමි කණ්ඩායම් දෙකම අර්ධ අවසන් තරඟයට තේරීම. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි. 20 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 30 | සිංහල හා දමිළ මාධ්‍ය පුවත්පත් මුද්‍රණ වැඩසටහන |
| ක්‍රියාකාරකම් | ✓ ප්‍රාදේශීය සමෘද්ධි සන්නිවේදන ජාලය මඟින් තොරතුරු ලබාගැනීම<br>✓ විශේෂ පුවත් හා ක්ෂේත්‍ර මාධ්‍ය ආවරණ කටයුතු සිදු කිරීම.<br>✓ පුවත්පත නිර්මාණය හා සංස්කරණ කටයුතු<br>✓ විශේෂිත උත්සව අවස්ථාවන් සඳහා පුවත්පත් බෙදා හැරීම. |
| ස්ථාන | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (ලේක් හවුස් ආයතනය මඟින් පල කරයි) |
| ඉලක්ක කණ්ඩායම | පොදු ජනතාව |
| කාල සීමාව | 2018 .01.01 - 2018.12.31 |
| 2018.12.31 දක්වා වියදම | සිංහල පුවත් කලාප 1ක් සඳහා වැය මුදල ( රු.300,000.00 + VAT රු.45,000.00 - රු.345,000.00 )<br>දමිළ පුවත් කලාප 1ක් සඳහා වැය මුදල ( රු.200,000.00 + VAT රු.30,000.00 - රු.230,000.00 )<br>පුවත්පත් කලාප සිංහල රු.345,000.00 x 12 = .4,140,000.00<br>පුවත්පත් කලාප දමිළ රු.230,000.00 x 12 = .2,760,000.00 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 31 | මාධ්‍ය වැඩසටහන |
| ක්‍රියාකාරකම් | ✓ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වලට අදාළ තොරතුරු ගොණු කිරීම, අත්පත්‍රිකා නිර්මාණය කිරීම, සංස්කරණය හා මුද්‍රණය ( අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කළ කමිටුවේ නිර්දේශ හා උපදෙස් පරිදි)<br>✓ ජාතික මට්ටමින් පවත්වනු ලැබූ උත්සවවල දී සමෘද්ධි වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම සඳහා බෙදා හැරීම.<br>✓ සමෘද්ධි ප්‍රජා මූල බැංකු 1073ක් හා ප්‍රජාමූල බැංකු සමිති 331 හරහා මුළුදිවයිනම ආවරණය වන පරිදි බෙදා හැරීම. |
| ස්ථාන | ප්‍රධාන කාර්යාලය මඟින් |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභීන්, සමෘද්ධි වැඩසටහන යටතේ ප්‍රතිලාභ අපේක්ෂිත කණ්ඩායම් හා පොදු ජනතාව |
| කාල සීමාව | 2018 අගෝස්තු - සැප්තැම්බර් |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.2.88 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 32 | රූපවාහිනි වැඩසටහන ( සමෘද්ධි උදානය ) |
| ක්‍රියාකාරකම් | ✓ ක්ෂේත්‍ර හා විශේෂ උත්සව අවස්ථා ආවරණය.<br>✓ නිෂ්පාදනය හා සංස්කරණය ස්වාධින රූපවාහිණිය මඟින් සිදු කිරීම. |
| ස්ථාන | ප්‍රධාන කාර්යාලය මගින් |
| ඉලක්ක කණ්ඩායම | සමෘද්ධි ප්‍රතිලාභීන් සමෘද්ධි වැඩසටහන යටතේ ප්‍රතිලාභ අපේක්ෂිත කණ්ඩායම් හා පොදු ජනතාව. |
| කාල සීමාව | 2018 දෙසැම්බර් දක්වා. |
| ක්‍රියාත්මක වැඩසටහන් ගණන | වැඩසටහන් 15 |
| 2018.12.31 දක්වා වියදම | විකාශන ගාස්තු රු.234,600.00 x 15 = රු.3,519,000.00<br>නිෂ්පාදන ගාස්තු රු.73,000.00 x 15 = රු.1,095,000.00<br>එකතුව රු. 4,614,000.00 |

ධීවර මාළු දැල් ලබා දීම - කයිට්ස්



යාපනය, කෝපායි පොක්කනායි -පාපිසි නිෂ්පාදන ගම්මානය



මත්ද්‍රව්‍ය නිවාරණ හා සතුටු පවුල් වැඩසටහන - ඕපනායක



කෑගල්ල දිස්ත්‍රික් අලෙවි ප්‍රදර්ශනය




වැඩ අවසන් වූ මාතලේ දිස්ත්‍රික් අලෙවි මධ්‍යස්ථානය
(ක්ෂණික ආහාර තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව)



04

# ජාතික සමාජ සංවර්ධන ආයතනය



# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## 4.1 හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනය සමාජ වැඩ (Social Work) පිළිබඳව අධ්‍යාපනය ලබාදෙන ශ්‍රී ලංකාවේ ඇති එකම රාජ්‍ය අධ්‍යාපන ආයතනය වේ. 1992 අංක 41 දරන පාර්ලිමේන්තු පනත අනුව ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත වූ මෙම ආයතනය 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 ඒ වගන්තිය යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස 2005 වර්ෂයේදී ප්‍රකාශයට පත් කර ඇත.

ආයතනයේ ක්‍රියාකාරී කටයුතු ප්‍රධාන එකිනෙකට බද්ධ වූ අංශ 4 කින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒවා නම්,

1. සමාජ සේවා විද්‍යාලය
2. පුහුණු අංශය
3. සමාජ සංවර්ධන, ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
4. පරිපාලන හා මුදල් අංශය

## 4.2 දැක්ම

සමාජ වැඩ අධ්‍යාපනයේ පුහුණු කටයුතුවල හා පර්යේෂණවල දේශීය හා ජාත්‍යන්තර ලෙස විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්විම.

## 4.3 මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය සහ සමාජ සුභසාධනය සඳහා සියලුම මට්ටම්වලදී අවශ්‍ය සමාජ වැඩ පිළිබඳ කුසලතා පූර්ණ මිනිස් බල අවශ්‍යතා සපුරාගැනීම සමාජ වැඩ පිළිබඳ අවශ්‍ය දැනුම හා තාක්ෂණයන් යොදා ගනිමින් සමාජයට සුවිශේෂී සේවයක් සැපයීම.

## 4.4 අරමුණු

- සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම්, වැඩසටහන් සහ වැඩ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයා දැනුවත් කිරීම.
- සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම.
- සමාජ සුභසාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩසටහන් පිළිබඳව අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම.
- සමාජ වැඩ වලදී තාක්ෂණය උපයෝගී කර ගැනීම ඇතුළුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිචයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- සමාජ සුභසාධන ක්‍රමයේ කාර්ය මණ්ඩලයේ වෘත්තීමය සහ කළමණාකාරීත්ව ප්‍රවීණතාව වර්ධනය කිරීම සඳහා විධිවිධාන සැළැස්වීම.
- සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂඥ සේවාවන් ආණ්ඩුවට සහ වෙනත් අනුමත සංවිධානයන්ට ලබාගැනීමට සැලැස්වීම.
- ඒ සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

## 4.5 උපායමාර්ග

- ✓ සමාජ වැඩ වෘත්තීයවේදී අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.
- ✓ සමාජ වැඩ පිළිබඳ දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා පැවැත්වීම.
- ✓ සමාජ වැඩ, සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ හා ප්‍රකාශන පළ කිරීම.
- ✓ සමාජ සුබසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්වීම.
- ✓ සමාජ සුබසාධන කටයුතු වල නියැලී සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තීය කුසලතා වැඩිදියුණු කිරීම.
- ✓ සමාජ සුබසාධන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගරු ඇමතිතුමාට අවශ්‍ය සහාය ලබාදීම.

## 4.6 2018 වර්ෂය තුළ අත්කරගත් නිමැවුම හා ඉදිරි කාලයේදී බලාපොරොත්තු වන නිමැවුම්

- 2013/2017 අධ්‍යයන වර්ෂයේ අධ්‍යයන කටයුතු සාර්ථක ලෙස හදාරා අවසන් කළ සිසුන් 93ක් සඳහා සමාජ වැඩ උපාධිය පිරිනැමීම.
- 2014/ 2018 අධ්‍යයන වර්ෂයන්හි පාඨමාලාව හැදෑරූ සිසුන් 105ක් සඳහා සමාජ වැඩ උපාධිය පිරිනැමීමට නියමිතය.
- 2015/2017 අධ්‍යයන වර්ෂය සඳහා සමාජ වැඩ පශ්චාත් උපාධි පාඨමාලාව සාර්ථක ලෙස හදාරා නිම කළ සිසුන් 07 දෙනෙකු වෙනුවෙන් පශ්චාත් උපාධිය පිරිනැමුණු අතර 2016/2018 අධ්‍යයන වර්ෂයන්හි සමාජ වැඩ පශ්චාත් උපාධි හැදෑරූ සිසුන් 16 දෙනෙකු වෙනුවෙන් සමාජ වැඩ පශ්චාත් උපාධිය පිරිනැමීමට නියමිතය.
- උපදේශනය, ළමා රැකවරණය, වැඩිහිටි රැකවරණය, සමාජ වැඩ, සංඥා භාෂා පරිවර්තක, ප්‍රජා විශෝධනය යන ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා සාර්ථකව නිම කළ සිසුන් 548ක් සඳහා සහතික පත්‍ර ප්‍රදානය කිරීම 2018 මාර්තු මස 21 දින සිදු කරන ලදී.
- උපදේශනය, ප්‍රජා විශෝධනය, සමාජ වැඩ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා පාඨමාලා සහ සහතික පත්‍ර පාඨමාලා හැදෑරූ සිසුන් 300ක් සඳහා ඩිප්ලෝමා හා සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට නියමිතය.
- ආයතනය සඳහා සීදූව ප්‍රදේශයේ ඉදිකෙරෙන ස්ථිර ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු වල 25% ක ප්‍රගතියක් අත්කරගෙන තිබීම.
- ආයතනයට අත්‍යවශ්‍යව තිබූ ශිෂ්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය හා පුස්තකාල ප්‍රවර්ධනය සඳහා වන තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම.

## 4.7 අපේක්ෂිත සමාජ ආර්ථික ප්‍රතිඵලය

- ප්‍රතිපත්ති සැකසීම, කළමනාකරණය හා ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු කළ හැකි වෘත්තීමය සමාජ වැඩ වෘත්තිකයින් බිහිවීම හා ඔවුන් සඳහා රැකියා අවස්ථා උදාවීම.

2018 වසරේ උපාධි ලබා 86 දෙනෙකු පිට වූ අතර, මෙම සිසුන් 86 දෙනා අතරින් 05 දෙනෙකු රාජ්‍ය අංශයේ රැකියාවලද, 30 දෙනෙකු රාජ්‍ය නොවන සංවිධානවලද, අර්ධ රාජ්‍ය ආයතනයන් හි 05 දෙනෙක් ද සේවයේ නියුක්තව සිටිති. එමෙන්ම ව්‍යාපාර හා අර්ධ රැකියා අංශයන් හි 24 දෙනෙකු ද පෞද්ගලික අංශයේ රැකියාවන් හි 05 දෙනෙකු හා ස්වයං ව්‍යාපෘති වල 02 නෙකු ද නියුක්තව ඇති අතර ඉතිරි 15 දෙනා රැකියා වියුක්තිකයින් වේ. ඔවුන් බොහොමයක් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශීය ශිෂ්‍යත්ව ලබා ඇති අය වේ.

- ගැටළු කළමනාකරණය මගින් පුද්ගල ගැටළු සඳහා මැදිහත්විය හැකි උපදේශන වෘත්තිකයින් බිහිවීම හා රැකියා අවස්ථා උදාවීම මත ඔවුන් සමාජ සංවර්ධනයට දායක කිරීම.
- අවදානම් සහිත ප්‍රජාවන් සඳහා සමාජ වැඩ මැදිහත්වීමේ ක්‍රමවේදයන් යොදා ගැනීම මගින් ප්‍රජාව සවිබලගැන්වීම
- පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීමට සෘජුවම දායක වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### තිරසර සංවර්ධන අරමුණු

| අරමුණු අංකය | දායකත්වය |
|---|---|
| 01 | සෑම ආකාරයකම දුගී බව අවසන් කිරිම. |
| 04 | ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ඉගැනුම් අවස්ථාව සැළසීම. |
| 05 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ලඟාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම. |
| 08 | සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය. |

මේ වන විට ආයතනයෙන් සමාජ වැඩ උපාධි ලබා පිටවූ උපාධිධාරීන්ගෙන් රැකියාවේ නියුක්තිකයන් 73.53% කි. මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් (ගැහැණු) 14.71% ක් පෞද්ගලික හේතූන් මත විරැකියාවේ පසුවේ. එම හේතු අතර විවාහය, දරු ප්‍රසූතිය සහ උසස් අධ්‍යාපන අවස්ථා විශේෂ කරුණු ලෙස දැක්විය හැකිය. 11.76% ක ප්‍රතිශතයක් ශිෂ්‍යයින් කළින් රැකියාවල නියුක්තව සිටියත් දැනට රැකියා විරහිතවීමට හේතු වී ඇත්තේ වෙනත් රැකියා සෙවීම සහ උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වීම යන කරුණුය.
ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 44.83% ක ප්‍රමාණයක් රාජ්‍ය නොවන ආයතන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන ආයතනවල සේවය කරන අතර, එය සමාජ වැඩ වෘත්තීය ප්‍රචලිත කිරීම හා ඉල්ලුම වැඩකිරීම සඳහා ඉවහල් වී ඇත. ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 24.14 % ක් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සේවය කරයි.

ශිෂ්‍යය නියැදි සටහන්වලට අනුව සියළුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් විධායක ශ්‍රේණියට අයත් රැකියා මෙන්ම ව්‍යාපෘති සම්බන්ධීකාරක, ව්‍යාපෘති කළමනාකරු, පර්යේෂණ සහකාර, පරිගණක සැළසුම්කරු, රේගු නිලධාරීන්, පොලිස් නිලධාරී හා බැංකු නිලධාරි යන රැකියාවල නියුතු වේ. ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බහුතරයක් ඔවුන්ගේ රැකියා අවස්ථාවන්වල මුල් අවධියේ පසුවේ.

## 4.8 අනුමත වාර්ෂික අයවැය - 2018

| ප්‍රාග්ධන (රු.මි.) | පුනරාවර්තන (රු.මි.) |
|---|---|
| 11.00 | 140.00 |

## 4.9 2018.01.01- 2018.12.31 දක්වා වියදම්

| | ප්‍රතිපාදන (රු.මි.) | ආයතනික ආදායම (රු.මි) | වියදම (රු.මි.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 11.00 | _ | 9.913 |
| පුනරාවර්තන | 140.00 | 0.544 | 125.714 |

## 4.10 ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දුන් අභියෝග

- පාඨමාලා පැවැත්වෙන අතරමගදී ඉවත් වන සිසුන් සංඛ්‍යාව ඉහළ යෑම.
- ආයතනයේ අධ්‍යයන කටයුතු සිදුකරන සමාජ වැඩ වැනි විෂයයන්වලින් ඈත්ව සිසුන් ජනප්‍රිය විෂයයන් වලින් උපාධි පාඨමාලා හැදෑරීමට හා පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධි ලබාගැනීමට යොමුවීම.
- අප ආයතනයේ පවත්වන පාඨමාලාවන්ට සමාන පාඨමාලා ආරම්භ කරන තරඟකාරී වෙනත් ආයතන බිහිවීම.
- අවම සුහසාධන පහසුකම් යටතේ පාඨමාලා පවත්වාගෙන යෑම.

## 4.11 ලබාගත් සමස්ථ ජයග්‍රහණ

- ආයතනයේ සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි හා සමාජ වැඩ පශ්චාත් උපාධිධාරීන් ජාතික හා අන්තර්ජාතික මට්ටමේ සමාජ වැඩ වෘත්තීන් සඳහා යොමුවීම.
- දේශීය පුහුණු සඳහා කාර්යමණ්ඩලයේ 75% ක් (84 දෙනෙක්) පමණ සහභාගී වීම හා විදේශීය පුහුණු සඳහා කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු දෙසැම්බර් මාසයේ දී සහභාගී විය.
- ආයතනයට අඩුපාඩුවක්ව පැවති ශිෂ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම. මෙමගින් ආයතනය මගින් පවත්වන සියලු අධ්‍යයන වැඩසටහන් වලට සහභාගී වන සිසුන්ට අදාළ තොරතුරු පරිගණක ගත කිරීම මගින් වඩා කාර්යක්ෂම සේවාවක් ස්ථාපනය වනු ඇත.
- ආයතනය පහත සඳහන් අන්තර්ජාතික සමාජ වැඩ වෘත්තියවේදී සංවිධාන වල සාමාජිකත්වය ලබාගෙන කටයුතු කිරීම.
  - ✓ අන්තර්ජාතික සමාජ වැඩ විද්‍යාල සංගමය
  - ✓ අන්තර්ජාතික සමාජ සංවර්ධන සම්මේලනය
  - ✓ අන්තර්ජාතික නිදහස් සමාජ වැඩකරුවන්ගේ සංගමය
  - ✓ ආසියා පැසිපික් සමාජ වැඩ අධ්‍යාපනික සංගමය
- සීදුව නව ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් 2018 වසරේ ආරම්භ වූ අතර වර්ග අඩි 100,000ක ගොඩනැගිලි සංකීර්ණයක් 2020 මාර්තු වන විට අවසන් කිරීමට නියමිතය. මෙමගින් නව පාඨමාලා රාශියක් ආරම්භ කර සමාජ වැඩ, උපදේශන හා සමාජ සංවර්ධන ක්ෂේත්‍රයන්ට කුසලතා සහිත වෘත්තිකයින් බිහිකිරීමේ අවස්ථාව උදාවීම.
- ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් රන්න හා තලාව පුහුණු, පර්යේෂණ හා සමාජ වැඩ ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථාන ජාතික සමාජ සංවර්ධන ආයතනය වෙත පවරා ගැනීමේ කටයුතු අවසන් වෙමින් පවතී.

- 2017 වසරේ විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලද විගණන විමසුම් 16 ක් වූ අතර එය 2018 වසර වන විට 11 දක්වා අඩු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත හැකි වීම.
- ක්‍රියාකාරී සැලැස්මට අනුව අංශ 4 විසින් ඉලක්ක කොට තිබූ සියළු වැඩසටහන් නිම කරමින් පැවතීම.

## 4.12 2018.01.01 සිට 2018.12.31 දක්වා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හා වැඩසටහන්

### සමාජ සේවා විද්‍යාලය

| | |
|---|---|
| වැඩසටහන - අංක 01 | සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව 2018/19 (නව කණ්ඩායම) |
| ක්‍රියාකාරකම් | අයදුම්පත් කැඳවීම, බැනර් මුද්‍රණය කිරීම, ගැසට් පත්‍රයේ සහ පුවත්පත් දැන්වීම් පළකිරීම, කඩඉම් විභාගය පැවැත්වීම සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, ඉංග්‍රීසි කඩිනම් වැඩසටහන පැවැත්වීම (බාහිර සම්පත්දාරීන් සඳහා ගෙවීම් සිදුකිරීම), ක්ෂේත්‍ර අනුස්ථාපන වැඩසටහන පැවැත්වීම,ශිෂ්‍ය අත්පොත් මුද්‍රණය කිරීම,පාඨමාලා අනුස්ථාපන වැඩසටහන, සමාජ සුභසාධන ආයතන හා ආයතන වල සේවා සැපයුම පිළිබඳ අධ්‍යයනය සඳහා නිරීක්ෂණ ක්ෂේත්‍ර චාරිකාව (අනුරාධපුර, වවුනියාව හා යාපනය), හා ඊට අදාළ නිරීක්ෂණ ක්ෂේත්‍ර චාරිකාව පිළිබඳ පැනල මණ්ඩල ඉදිරිපත් කිරීම, පංති කාමර දේශන පැවැත්වීම. |
| ස්ථාන | නාවල, කොළඹ. |
| ඉලක්ක කණ්ඩායම | සිසුන් 65 |
| ආරම්භකළ දිනය | 2018.02.24 |
| ප්‍රතිඵල | සිසුන් 65 දෙනෙකු සාර්ථකව සමාජ වැඩ උපාධි පාඨමාලාවට බඳවාගන්නා ලද අතර ක්ෂේත්‍ර අනුස්ථාපන වැඩසටහන පවත්වන ලදී. එමෙන්ම, සමාජ සුභසාධන ආයතන හා ආයතනවල සේවා සැපයුම පිළිබඳ අධ්‍යයනය සඳහා නිරීක්ෂණ ක්ෂේත්‍ර චාරිකාව (අනුරාධපුරය, වවුනියාව හා යාපනය) නිරීක්ෂණ ක්ෂේත්‍ර චාර්කාව සාර්ථකව නිම කරන ලදී. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.0.811 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 02 | සමාජ වැඩ ශාස්ත්‍රවේදී පාඨමාලාව 2013/17, සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව 2015/17 |
| ක්‍රියාකාරකම් | උපාධි ප්‍රදානෝත්සවය |
| ස්ථාන | බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව |
| ඉලක්ක කණ්ඩායම | සමාජ වැඩ ශාස්ත්‍රවේදී පාඨමාලාව - 86, සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව - 07 |
| ආරම්භකළ දිනය | 2018.03.29 |
| ප්‍රතිඵල | සිසුන් බහුතරයක් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල දැනට සේවයේ නිරතව සිටී. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.0.450 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 03 | සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2018/19 (සිංහල හා දෙමළ මාධ්‍යය) |
| ක්‍රියාකාරකම් | පංති කාමර දේශන සහ ක්ෂේත්‍ර පුහුණුව, ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව |
| ස්ථාන | නාවල, කොස්වත්ත, රාජගිරිය |
| ඉලක්ක කණ්ඩායම | සිංහල - 41, දෙමළ - 15 |
| ආරම්භකළ දිනය | 2018.03.05 |
| ප්‍රතිඵල | පළමු වසර දෙවන සමාසික පංති කාමර දේශන සාර්ථකව පැවැත්වේ. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.0.200 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 04 | සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) |
| ක්‍රියාකාරකම් | අයදුම්පත් කැඳවීම (ගැසට් නිවේදනය සහ පුවත්පත්), සම්මුඛ පරීක්ෂණය පැවැත්වේ, පංති කාමර දේශන සාර්ථකව පවත්වයි. |
| ස්ථාන | ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| ඉලක්ක කණ්ඩායම | සිසුන් 20 |
| ආරම්භකළ දිනය | 2018.05.04 |
| ප්‍රතිඵල | පළමු වසර පංති කාමර දේශන සාර්ථකව පැවැත්වේ. |
| 2018.12.31 දක්වා වියදම | රු.0.869 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 05 | සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව 2018/19 (සිංහල හා දෙමළ මාධ්‍යය) |
| ක්‍රියාකාරකම් | පාඨමාලාව සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ලියාපදිංචිය සිදුවේ. |
| ස්ථාන | ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| ඉලක්ක කණ්ඩායම | සිසුන් 15 |
| කාල සීමාව | 2018.03.05 |
| ප්‍රතිඵල | පාඨමාලාව සැළසුම් කර ඇති අතර, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ලියාපදිංචිය සාර්ථකව සිදුකෙරේ. පළමු වසර පංති කාමර දේශන පවත්වයි. |
| 2018.12.31 දක්වා වියදම | රු. මි.0.006 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 06 | සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (රන්න) 2016/2017 |
| ක්‍රියාකාරකම් | පංති කාමර දේශන, විභාග පවත්වන ලදී. දැනට අවසන් විභාග මණ්ඩලය පවත්වා ඇත. |
| ස්ථාන | රන්න |
| ඉලක්ක කණ්ඩායම | සිසුන් 35 |
| ආරම්භක දිනය | 2017.01.06 |
| ප්‍රතිඵල | පාඨමාලාවේ සියළු අධ්‍යයන වැඩ කටයුතු සාර්ථකව අවසන් කර ඇති අතර, විභාග මණ්ඩල පවත්වා ඇත. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.21.524 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 07 | සංඥා භාෂා පරිවර්තක ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල ) 2016/2017 |
| ක්‍රියාකාරකම් | ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානය කිරීම. |
| ස්ථාන | බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව |
| ඉලක්ක කණ්ඩායම | සිසුන් 50 |
| ආරම්භක දිනය | 2016.09.30 |
| ප්‍රතිඵල | 2018.03.21 වන දින සිසුන් 30 දෙනෙකු ඩිප්ලෝමා සහතිකපත් ලබාගන්නා ලදී. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.2.674 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 08 | ධාරිතා සංවර්ධන වැඩසටහන (ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා) |
| ක්‍රියාකාරකම් | ශිෂ්‍ය කණ්ඩායම් අතර යහපත් අන්තර් සම්බන්ධතාවයක් ගොඩනැංවීමට පංති කාමර ක්‍රියාකාරකම් ඇසුරෙන් පහසුකම් සැලසීම. අධ්‍යයන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර යහපත් අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගැනීම සඳහා එක්දින වැඩමුළුවක් සංවිධානය කිරීම. අවදානම් තත්ත්වයන් තුළ සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් හඳුනාගැනීම හා ඒ සඳහා සුදුසු ක්‍රමෝපායන් යෝජනා කිරීම. |
| ස්ථාන | නාවල, කොළඹ |
| ඉලක්ක කණ්ඩායම | සිසුන් 125 |
| ආරම්භක දිනය | 2018.06.11 |
| ප්‍රතිඵල | සාර්ථක ලෙස අවශ්‍යතා සහිත සිසුන් හඳුනාගැනීම හා ශිෂ්‍ය උපදේශනය සඳහා සිසුන් යොමු කිරීම. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි. 0.73 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 09 | ධාරිතා සංවර්ධන වැඩසටහන (අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා) |
| ක්‍රියාකාරකම් | ශිෂ්‍ය කණ්ඩායම් අතර යහපත් අන්තර් සම්බන්ධතාවයක් ගොඩනැංවීමට පංති කාමර ක්‍රියාකාරකම් ඇසුරෙන් පහසුකම් සැලසීම. අධ්‍යයන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර යහපත් අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගැනීම සඳහා එක්දින වැඩමුළුවක් සංවිධානය කිරීම. අවදානම් තත්ත්වයන් තුළ සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් හඳුනාගැනීම හා ඒ සඳහා සුදුසු ක්‍රමෝපායන් යෝජනා කිරීම. අධ්‍යයන කාර්ය මණ්ඩලය තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳව ඇති අවබෝධය වැඩිදියුණු කිරීම උදෙසා විවිධ තාක්ෂණික ක්‍රමවේද, මෙවලම් යොදාගනිමින් අවබෝධයක් ලබාදීම. |
| ස්ථාන | නාවල, කොළඹ |
| ඉලක්ක කණ්ඩායම | අධ්‍යයන කාර්ය මණ්ඩලය 41 |
| ආරම්භක දිනය | 2018.05.25 |
| ප්‍රතිඵල | කුසලතා හා දැනුමෙන් පරිපූර්ණ වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සැළසීම හා අන්තර් ශිෂ්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩල සබඳතා වැඩිදියුණු කිරීම. |
| 2018.12.31 දක්වා වියදම | රු. මි.0.025 |

## පුහුණු අංශය

| | |
|---|---|
| වැඩසටහන - අංක 01 | ළමා ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ( පාඨමාලා 05කි) |
| ක්‍රියාකාරකම් | ප්‍රතිපල නිකුත් කර 2018 මාර්තු මස ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පවත්වා ඇත. |
| ස්ථාන | කිලිනොච්චිය, මඩකලපුව,අම්පාර,මොණරාගල සහ තලාව මධ්‍යස්ථාන |
| ඉලක්ක කණ්ඩායම | යුනිසෙෆ් ආයතනය මූල්‍ය අනුග්‍රහය දක්වන රජයේ නිලධාරීන් 122 |
| කාල සීමාව | 2016.01.31 - 2018.03.31 |
| ප්‍රතිඵල | කණ්ඩායම සාර්ථකව පාඨමාලාව හදාරා අවසන් කරන ලදී. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.11.00 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 02 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ( සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යය වලින් පාඨමාලා 17ක් පවත්වනු ලැබේ ) |
| ක්‍රියාකාරකම් | පංති කාමර දේශන, ක්ෂේත්‍ර පුහුණුව, අවසන් පැනල මණ්ඩල පරීක්ෂණ සහ ප්‍රතිපල නිකුත් කිරීමට නියමිතය. |
| ස්ථාන | නාවල, රාජගිරිය, තලාව, කිලිනොච්චි, රන්න, අම්පාර, නුවර, ත්‍රිකුණාමලය |
| ඉලක්ක කණ්ඩායම | රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිලධාරීන්, උසස් අධ්‍යාපන කටයුතු වල නියුතු කණ්ඩායම් සහ අ.පො.ස. උසස් පෙළ සමත් සිසුන් 750ක් |
| කාල සීමාව | 2016.11.12 - 2018.12.31 |
| ප්‍රතිඵල | කණ්ඩායම සාර්ථකව පාඨමාලාව හදාරමින් සිටියි. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි. 23 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 03 | වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව |
| ක්‍රියාකාරකම් | පංති කාමර දේශන හා ක්ෂේත්‍ර පුහුණුව |
| ස්ථාන | ජාතික සමාජ සංවර්ධන ආයතන ප්‍රධාන කාර්යාලය |
| ඉලක්ක කණ්ඩායම | වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරීන් 21 |
| ආරම්භක දිනය | 2018.08.03 |
| අවසන්කළ දිනය | දැනට අධ්‍යයන කටයුතු සිදුකරමින් පවතී. |
| ප්‍රතිඵල | කණ්ඩායම සාර්ථකව පාඨමාලාව හදාරමින් සිටියි. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.0.003 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 04 | ප්‍රජා පාදක විශෝධන ඩිප්ලෝමා පාඨමාලාව - (පාඨමාලා 02) |
| ක්‍රියාකාරකම් | පංති කාමර දේශන හා ක්ෂේත්‍ර පුහුණුව |
| ස්ථාන | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව |
| ඉලක්ක කණ්ඩායම | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා පාදක විශෝධන නිලධාරීන් 59 |
| ආරම්භක දිනය | 2016.11.07 |
| අවසන්කළ දිනය | 2019 |
| ප්‍රතිඵල | කණ්ඩායම සාර්ථකව පාඨමාලාව හදාරා අවසන් කර ඇත. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.1.70 |

## සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය

| | |
|---|---|
| වැඩසටහන - අංක 01 | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩමුළුව |
| ක්‍රියාකාරකම් | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය සඳහා නායකත්ව කුසලතා වර්ධනය, ආකල්ප සංවර්ධනය, දැනුම කළමනාකරණය හා වඩා යහපත් වැඩ පරිසරයකට අවශ්‍ය වෘත්තීමය සබඳතා ජාලය වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම |
| ස්ථාන | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ප්‍රධාන කාර්යාලය |
| ඉලක්ක කණ්ඩායම | සෑම අංශයක්ම නියෝජනය වන පරිදි නිලධාරීන් 20 |
| ආරම්භක දිනය | 2018 අප්‍රේල් 25 |
| අවසන්කළ දිනය | 2018 මැයි 16 ( දින 05) |
| ප්‍රතිඵල | ✓ නවතම ඉගැන්වීම් න්‍යාය, පුහුණු හා තාක්ෂණය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම<br>✓ 21 වන සියවසේ දැනුම හා ක්‍රමවේද අධ්‍යයනය<br>✓ නවතම ඉගැන්වීම් හා පර්යේෂණ පිළිබඳ අධ්‍යයනය<br>✓ සම අධ්‍යයනික ජාල අතර නව ඉගැන්වීම් හා පර්යේෂණ අදහස් හුවමාරුව හා සංවර්ධනය<br>✓ නායකත්ව කුසලතා වර්ධනය, ආකල්ප සංවර්ධනය හා දැනුම කළමනාකරණය |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.0.050 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 02 | ශාස්ත්‍රීය ප්‍රකාශන පිළිබඳ විද්වත් කතිකාව |
| ක්‍රියාකාරකම් | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත්කරනු ලබන සමාජ වැඩ විෂයට අදාළ පර්යේෂණ හා ශාස්ත්‍රීය ප්‍රකාශනයන් මගින් අනාවරණය කළ දත්ත හා තොරතුරු විද්වත් මණ්ඩලයක් මගින් විවෘත සංවාදයක් සිදුකර එය ප්‍රජාව කණ්ඩායම් තුළ සමාජගත කිරීමට කටයුතු කිරීම. |
| ස්ථාන | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| ඉලක්ක කණ්ඩායම | නිලධාරීන් 200 |
| ආරම්භක දිනය | 2018 අගෝස්තු 21 (එක් දින වැඩසටහනකි) |
| ප්‍රතිඵල | ✓ පර්යේෂණ ඔස්සේ ලබා ගන්නා දත්ත, තොරතුරු හා ශාස්ත්‍රීය දැනුම සමාජගත කිරීම<br>✓ නව සමාජීය ප්‍රවනතා හා අභියෝග හඳුනා ගැනීම<br>✓ පර්යේෂණ මගින් අනාවරණය කරගත් දත්ත හා තොරතුරු විශ්ලේෂණය කර කතිකාවට බඳුන් කිරීම<br>✓ පර්යේෂණ නව මානයන් හඳුනා ගැනීම හා පර්යේෂණය සඳහා අභිප්‍රේරණයක් ඇති කිරීම<br>✓ රජයේ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ක්‍රියාකාරී දායකත්වයක් සැපයීම |
| 2018.12.31 දක්වා වියදම | රු.මි. 0.207 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 03 | පුවත් හසුන |
| ක්‍රියාකාරකම් | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සියලු අංශවල ක්‍රියාකාරකම්, ප්‍රගතිය හා ඉදිරියේ සිදු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ප්‍රකාශයට පත් කිරීම |
| ස්ථාන | ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| ඉලක්ක කණ්ඩායම | සියලු රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශ |
| කාල සීමාව | 2018 ජනවාරි 01 - 2018 දෙසැම්බර් 31(කාර්තු වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී) |
| ප්‍රතිඵල | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන අංශ මගින් සිදු කරන ලද ක්‍රියාකාරකම් හඳුන්වා දීම<br>ජාතික සමාජ සංවර්ධන ආයතනය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.0.098 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 04 | විද්‍යුත් සඟරාව |
| ක්‍රියාකාරකම් | ශ්‍රී ලංකාවේ සමාජ ගැටලු අවම කිරීම සඳහා සමාජ වැඩ මැදිහත්වීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ පර්යේෂණ පත්‍රිකා 6ක් ඇතුළත් සඟරා 40ක් ප්‍රකාශයට පත් කිරීම |
| ස්ථාන | ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| ඉලක්ක කණ්ඩායම | සමාජ වැඩ විෂය හා අදාළ පර්යේෂණවල නියුතුවූවන් හා විද්වත් ප්‍රජාව |
| කාල සීමාව | 2018 ජනවාරි 01 – 2018 දෙසැම්බර් 31(අර්ධ වාර්ෂික සඟරාවකි) |
| ප්‍රතිඵල | ✓ සමාජ සංවර්ධනයට අදාළ පර්යේෂණ සමාජගත කිරීම<br>✓ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ පත්‍රිකා ලිවීමේ කුසලතා සංවර්ධනය<br>✓ නව පර්යේෂණ සඳහා ආධුනික පර්යේෂකයන් පෙළඹවීම<br>✓ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය මගපෙන්වීම සිදු කිරීම |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.0.095 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 05 | ශ්‍රී ලංකා සමාජ වැඩ සඟරාව |
| ක්‍රියාකාරකම් | සමාජ වැඩ විෂයට අදාළ පර්යේෂණ පත්‍රිකා 10ක් ඇතුළත් සඟරා 100ක් ප්‍රකාශයට පත් කිරීම |
| ස්ථාන | ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| ඉලක්ක කණ්ඩායම | සමාජ වැඩ විෂයට අදාළ පර්යේෂණවල නියුතුවූවන් හා විද්වත් ප්‍රජාව |
| කාල සීමාව | ✓ 2018 ජනවාරි 01 - 2018 දෙසැම්බර් 31 |
| ප්‍රතිඵල | ✓ සමාජ වැඩ විෂයට අදාළ පර්යේෂණ මඟින් අනාවරණය කරගත් තොරතුරු සමාජගත කිරීම<br>✓ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ පත්‍රිකා ලිවීමේ කුසලතා සංවර්ධනය<br>✓ නව පර්යේෂණ සඳහා ආධුනික පර්යේෂකයන් පෙළඹවීම<br>✓ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය මගපෙන්වීම සිදු කිරීම |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.0.102 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 06 | ශ්‍රී ලංකා සමාජ සංවර්ධන සගරාව |
| ක්‍රියාකාරකම් | සමාජ සංවර්ධනයට අදාළ පර්යේෂණ පත්‍රිකා 10ක් ඇතුළත් සඟරා 100ක් ප්‍රකාශයට පත් කිරීම |
| ස්ථාන | ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| ඉලක්ක කණ්ඩායම | සමාජ සංවර්ධනය හා අදාළ පර්යේෂණවල නියුතුවූවන් හා විද්වත් ප්‍රජාව |
| කාල සීමාව | 2018 ජනවාරි 01 - 2018 දෙසැම්බර් 31 |
| ප්‍රතිඵල | ✓ සමාජ සංවර්ධනයට අදාළ පර්යේෂණ සමාජගත කිරීම<br>✓ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ පත්‍රිකා ලිවීමේ කුසලතා සංවර්ධනය<br>✓ නව පර්යේෂණ සඳහා ආධුනික පර්යේෂකයන් පෙළඹවීම<br>✓ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය මගපෙන්වීම සිදු කිරීම |
| 2018.08.31 දක්වා වියදම | රු. 0.107 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 07 | සමාජ වැඩ උපාධි පාඨමාලාව සංවර්ධනය කිරීමේ උපාය මාර්ග හඳුනා ගැනීම |
| ක්‍රියාකාරකම් | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය සංවර්ධනය කිරීමේ සමීක්ෂණයක් සැලසුම් කිරීම |
| ස්ථාන | ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| ඉලක්ක කණ්ඩායම | අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය අවසන් කළ විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් නොවූ සිසුන් |
| කාල සීමාව | 2018 ජනවාරි 01 - 2018 අගෝස්තු 31 |
| ප්‍රතිඵල | ✓ සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව සඳහා බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වර්ධනය කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.<br>✓ නූතන රැකියා ක්ෂේත්‍රයට අදාළ වන පරිදි විෂයමාලා සංශෝධනය කිරීම හා විෂයමාලාව යාවත්කාලීන කිරීම හා අදාළ ක්ෂේත්‍ර හඳුනා ගැනීම.<br>✓ රැකියා වෙළඳපොල තුළ අනෙකුත් සාමාජීය විද්‍යාවන්වලට මෙන් සමාජ වැඩ උපාධි සඳහා වටිනාකමක් ඇති කිරීමට පියවර ගැනීම. |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.0.001 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 08 | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ඩිප්ලෝමාධාරීන් නියුක්ත රැකියා අවස්ථා පිළිබඳ අධ්‍යයනය |
| ක්‍රියාකාරකම් | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ඩිප්ලෝමාධාරීන් නියුක්ත රැකියා අවස්ථා හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සැලසුම් කිරීම |
| ස්ථාන | ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| ඉලක්ක කණ්ඩායම | රාජ්‍ය හා රාජ්‍ය නොවන, පෞද්ගලික අංශයන්හි නියුතු නිලධාරීන් |
| කාල සීමාව | 2018 ජනවාරි 01 - 2018 අගෝස්තු 31 |
| ප්‍රතිඵල | ✓ වර්තමාන රැකියා ක්ෂේත්‍ර සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ඩිප්ලෝමාවන්හි උපයෝගීතාවය හඳුනා ගැනීම<br>✓ ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා රැකියා වෙළඳපොල හඳුනා ගැනීම<br>✓ නූතන රැකියා වෙළඳපොළට යෝග්‍ය පරිදි ඩිප්ලෝමා පාඨමාලා සංවර්ධනය කළ යුතු ආකාරය කෙසේ ද යන්න හඳුනා ගැනීම |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.0.01 |

පශ්චාත් උපාධි ප්‍රධානෝත්සවය - 2018



සීදුව ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම් කටයුතු



අධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය සංවර්ධන වැඩමුළුව



ශාස්ත්‍රීය ප්‍රකාශන පිළිබඳ විද්වත් කතිකාවත



05

# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය



# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

## 5.1 හැඳින්වීම

1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මඟින් හා 1999 අංක 33 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධිත) පනත මඟින් ස්ථාපිතව සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයකි.

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොමැති තැනැත්තන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා විශ්‍රාම වැටුප් ලබා දීම, හදිසි අකර්මන්‍යතාවයන්හි දී හා මරණයේ දී මූල්‍ය සහනය ලබා දීම සඳහා විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. රජයේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් ප්‍රායෝගිකව ක්‍රියාවට නගමින් රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති පුරවැසියන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහතික කිරීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යය භාරය වේ.

## 5.2 දැක්ම

සමාජ ආරක්ෂණයෙන් සුරක්ෂිත වූ අභිමානවත් ජාතියක්

## 5.3 මෙහෙවර

අභිමානවත් ජාතියක් ගොඩනැගීම උදෙසා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය තුළින් යහපාලන ප්‍රතිපත්ති වලට අනුගත වෙමින් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ ආර්ථික , සාමාජීය , සංස්කෘතික සුරක්ෂිතභාවය වෙනුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ උපාය මාර්ගික සම්බන්ධතා ගොඩනගමින් තිරසාර සංවර්ධනයක් කරා ළඟාවීම.

## 5.4 අරමුණු

i. ස්වයං රැකියා වල නියුතු තැනැත්තන්ට ඔවුන් වයෝවෘද්ධ කාලයේ දී හෝ ඔවුන් යම් අශක්නුතාවයකට පත්වූ විට එම කාලයේදී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැලසීම.
ii. ස්වයං රැකියා වල නියුතු තැනැත්තන් මියගිය විට, ඔවුන්ගේ යැපෙන්නන්ට සහන සැලසීම.
iii. ස්වයං රැකියා වල නියුතු තැනැත්තන්ට ඔවුන්ගේ අදාල වෘත්තීන්වල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩි දියුණු කිරීම.
iv. ස්වයං රැකියා වල යෙදෙන තරුණයන් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩි දියුණු කිරීම.
v. සකසුරුවම් වීම හා සම්පත් කළමණාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම.
vi. සාමාන්‍යයෙන් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.

## 5.5 උපාය මාර්ග

i. රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම් නොමැති තැනැත්තන් වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සැලසීම සඳහා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ➢ වයස අවුරුදු 18 සිට 59 අතර තැනැත්තන් සඳහා (සුරකුම) යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- ➢ වයස අවුරුදු 18ට අඩු දරුවන් සඳහා (ආරස්සාව) පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

ii. විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභයන් වන්නේ
- ➢ සාමාජිකයාට වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම
- ➢ සාමාජිකයාගේ අභාවයෙන් පසු සාමාජිකයාගේ වයස අවුරුදු 80 දක්වා කලත්‍රයා වෙත විශ්‍රාම වැටුප ගෙවීම.
- ➢ ස්ථිර අර්ධ අබලතාවයක දී රු.25,000/- දක්වා වන අබලතා පාරිතෝෂිකයක් ලබා දීම.
- ➢ ස්ථිර පූර්ණ අබලතාවයක දී රු.50,000/- ක එකවර ගෙවන දීමනාවක් හෝ අබලතාවයට පත්වූ දින සිට ජීවිතාන්තය දක්වා සාමාජිකයා හට විශ්‍රාම වැටුප් ගෙවීම
- ➢ විශ්‍රාම වැටුප ලබාගැනීමට පෙර සාමාජිකයාගේ මරණයට පත්වීමේ දී යැපෙන්නන් වෙත රු.25000/- මරණ පාරිතෝෂිකයක් ලබා දීම.

iii. "ආරස්සාව" යෝජනා ක්‍රමය යටතේ විභාග කඩඉම් සමත්වීමේදී මූල්‍ය ප්‍රතිලාභ ලබා දීම.
- ➢ 5 වසර ශිෂ්‍යත්ව විභාගය අදාල කඩඉම් ලකුණු ලබාගෙන සමත්වීමේදී ගිවිසගත් මාසික විශ්‍රාම වැටුප් මුදලින් 50% ක මූල්‍ය ප්‍රතිලාභයක් ගෙවීම.
- ➢ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය අධි සාමාර්ථ 05ක් සමග සමත්වීමේදී ගිවිසගත් මාසික විශ්‍රාම වැටුපට සමාන මූල්‍ය ප්‍රතිලාභයක් ගෙවීම.
- ➢ අ.පො.ස උසස් පෙළ විභාගය සමත්ව මෙරට ජාතික විශ්ව විද්‍යාලයකට ප්‍රවේශය ලද විට ගිවිසගත් මාසික විශ්‍රාම වැටුප මෙන් දෙගුණයක මූල්‍ය ප්‍රතිලාභයක් ගෙවීම.

iv. රාජ්‍ය, පෞද්ගලික සහ ස්වේච්ඡා සංවිධාන සමග ඒකාබද්ධව විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 5.6 2018 වර්ෂය තුල අත්කරගත් නිමැවුම් (2018.12.31 දිනට)

i. සාමාජිකයන් 62933* දෙනෙකු බඳවා ගැනීම.
ii. වැඩිහිටියන් 28742 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් ගෙවීම.
iii. සාමාජිකයන් 27 සඳහා පූර්ණ අබලතා ප්‍රතිලාභ ගෙවීම.
iv. සාමාජිකයන් 61 දෙනෙකු වෙත මරණ පාරිතෝෂික ගෙවීම.
v. පාසල් දරු දැරියන් 445 දෙනෙකු වෙත මූල්‍ය ප්‍රතිලාභ ලබාදීම.

## 5.7 අපේක්ෂිත සමාජ ආර්ථික ප්‍රතිඵලය

i. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජික තැනත්තන්ගේ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමය ආර්ථික වශයෙන් ශක්තිමත් වීම.

ii. රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන් වෙත රාජ්‍ය සුරක්ෂිතතාවය සහිත විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම තුලින් සුරක්ෂිතතාවය තහවුරු වීම.

iii. දරුවන් වෙත දෙමාපිය භාරකාරත්වය යටතේ විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුලින් අධ්‍යාපනය කෙරෙහි වැඩි නැඹුරුතාවයක් ඇති කිරීම හා වෘත්තීන්හී ස්වාධීනත්වය තහවුරු වීම.

iv. අනාගත ජ්‍යෙෂ්ඨ පුරවැසි ජනගහනය ඉහළ යැමෙන් රටට ඇතිවන සාමාජීය ආර්ථික ගැටළුවලට පිළියමක් ලෙස සාමාජිකයන්ගේ විශ්‍රාම දිවියට ආර්ථිකමය වශයෙන් ආරක්ෂාවක් ලබාදීම.

## 5.8 අනුමත වාර්ෂික අයවැය - 2018

| ප්‍රාග්ධන (රු.මි) | පුනරාවර්තන (රු.මි) |
|---|---|
| 7.00 | 130.00 |

## 5.9 2018.01.01 සිට 2018.12.31දක්වා වියදම

| මූල්‍ය ප්‍රභවය | ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 7.00 | 2.071 |
| පුනරාවර්ථන | 130.00 | 132.678 |
| එකතුව | 137.00 | 134.750 |

## 5.10 ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑ අභියෝග

i. අනපේක්ෂිත ස්වභාවික ආපදාවන්, දේශපාලන අස්ථාවරත්වයන්, ක්ෂේත්‍ර මෙහෙයුම් කටයුතු සිදු කිරීමේදී ගැටලු ඇති වීම.

ii. පනතේ අරමුණු ඉටු කර ගැනීමේ දී මුහුණ පෑමට සිදුවන අභ්‍යන්තර හා බාහිර අභියෝග තුළින් අභ්‍යන්තර අභියෝග අප හට පාලනය කල හැකි වුවත් බාහිර අභියෝග පාලනය කිරීමට නොහැකි වීම.

iii. විශ්‍රාම වැටුප් නමින් ක්‍රියාත්මක වන පෞද්ගලික බැංකු හා රක්ෂණ සමාගම් විසින් ක්‍රියාත්මක කරන ආකර්ශනීය ආයෝජන හා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම

iv. මුදල් ආයෝජනය කිරීම සඳහා ජනතාව තුල තිබෙන සෘණ ආකල්ප සහ ජනතාවගේ ඉතිරි කිරීම් සීමා වීම.

v. විශ්‍රාම දිවිය සුරක්ෂිත කර ගැනීමේ අවශ්‍යතාවය ජනතාව වෙත අවබෝධ කරවීම සඳහා මාධ්‍ය භාවිතයට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම.

vi. සමාජ ආරක්ෂණ අරමුදලේ මුදල් ආයෝජනය කිරීම සඳහා පවතින සීමාවන්

## 5.11 ලබාගත් සමස්ථ ජයග්‍රහණ

i. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බඳවාගත් මුලු සාමාජික සංඛ්‍යාව 640,000 ක් ඉක්මවීම සහ එයින් 28,000 ඉක්මවූ ප්‍රමාණයකට විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවමින් සමාජ ආරක්ෂණය සහතික කිරීම.

ii. වර්ෂ 20ක් පුරා අඛණ්ඩ සේවාව තුලින් 641,600 කට අධික සාමාජික පිරිසක් සතු වීම සහ විශ්‍රාම වැටුප් ලාභීන් 27,900 කට අධික පිරිසක් ආයතනය සතු වීම.

iii. සමාජ ආරක්ෂණ අරමුදල රාජ්‍ය අංශය තුළ ඉතා සුරක්ෂිතව ආයෝජනය කිරීම සහ රුපියල් මිලියන 2,000කට ආසන්න මූල්‍ය වත්කමක් ගොඩනගා තිබීම.

iv. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් රාජ්‍ය ආයතන විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ මඟින් මෙම මණ්ඩලයේ සේවා කටයුතු ඉටු කිරීමට රාජ්‍ය නිලධාරි ජාලයේ සුවිශේෂී සේවයක් හා මැදිහත්වීමක් ලබා දී තිබේ. (දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්, සමාජ සේවා නිලධාරින්, සමෘද්ධි නිලධාරින් ආදි රාජ්‍ය නිලධාරින්)

## 5.12 2018.01.01 සිට 2018.12.31 දක්වා ක්‍රියාත්මක කල වැඩසටහන්වල තොරතුරු

| | |
|---|---|
| වැඩසටහන - අංක 01 | සමාජ ආරක්ෂණ හිමිකම් ඔප්පු ප්‍රධානය |
| ස්ථාන | වැලිඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - මුලතිව් දිස්ත්‍රික්කය |
| ඉලක්කගත කණ්ඩායම | වැලිඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනත්තන් |
| ආරම්භ කළ දිනය | 2018.07.20 |
| ප්‍රතිඵල | සාමාජිකයන් 543 දෙනෙකු බඳවා ගැනීම |

ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සමාජ ආරක්ෂණ
හිමිකම් ඔප්පු ප්‍රධානය - වැලිඔය





| | |
|---|---|
| වැඩසටහන - අංක 02 | රාජ්‍ය නිළධාරීන් ඇගයීම සහ ප්‍රතිලාභ පිරිනැමීමේ වැඩසටහන 2018 |
| ස්ථාන | යාපනය දිස්ත්‍රික්කය |
| ඉලක්කගත කණ්ඩායම | ඉහළ සාමාජික ප්‍රමාණයක් සාමාජික කරගත් නිලධාරීන් ඇගයීම සහ සිසුන් වෙත අධ්‍යාපන හිමිකම් ප්‍රතිලාභ ලබාදීම |
| ආරම්භ කළ දිනය | 2018.08.28 |
| ප්‍රතිඵල | රාජ්‍ය නිලධාරීන් 70 දෙනෙකුට ඇගයීම් සහතිකපත් හා සිසුන් වෙත අධ්‍යාපන හිමිකම් ප්‍රතිලාභ ලබාදීම |

06

# ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සුබසාධන අංශය



## 6.1 ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සුබසාධන අංශයේ කාර්යභාරය

### 6.1.1. ප්‍රාථමික කර්මාන්ත අංශය

I. කෘෂි හා ධීවර නිෂ්පාදන ද ඇතුළුව ප්‍රාථමික කර්මාන්ත නිෂ්පාදනයන්හි අගයදාම සංවර්ධනය කරමින් අගය එකතු කළ නිමි භාණ්ඩ නිෂ්පාදනය හා අපනයනය සඳහා සියළු පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීම හා ගෝලීය වෙළඳ පොළට අනුබද්ධ කිරීම සඳහා පහසුකම් සැලසීම.

II. අපනයන කෘෂි බෝගද ඇතුළුව අපනයන වටිනාකමක් ඇති අනෙකුත් බෝග හා ප්‍රාථමික කර්මාන්ත නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය හා ඉහළ ඵලදායීතාවය තහවුරු කිරීම උදෙසා අවශ්‍ය ප්‍රමිතීන් හඳුන්වා දීම හා ජාතික හා ජාත්‍යන්තර පිළිගැනීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය සහතික කිරීම් සිදු කිරීමට පහසුකම් හා දිරිගැන්වීම් ලබා දීම.

III. ගෝලීය වෙළඳ පොළ තුළ පවත්නා තරඟකාරීත්වය ජය ගැනීම සඳහා දැනුම හා අත්දැකීම් ලබා ගැනීම සඳහා ශ්‍රී ලාංකීය ව්‍යාපාරිකයන්ට අවස්ථාව ලබා දීමට දේශීය හා විදේශීය වශයෙන් අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන හා වෙළෙඳ සල්පිල් සංවිධානය කිරීම හා සම්බන්ධ වීම.

IV. කෘෂිකාර්මික අධි කලාප හා ධීවර අධි කලාප ස්ථාපනය කිරීම මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සිය ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ඉඩම් සපයාදීම සහ ඒ සඳහා අවශ්‍ය අනෙකුත් සානුබල ලබා දීම.

V. විශේෂයෙන් අපනයන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නවීකරණය උදෙසා නව තාක්ෂණික යන්ත්‍රෝපකරණ, පසු අස්වනු තාක්ෂණය, කෘෂි ණය ඇතුළු වෙනත් භෞතික හා ආර්ථික යටිතල පහසුකම් හා දිරිගැන්වීම් නව ව්‍යවසායකයින් සඳහා අධි කලාප තුළ මෙන්ම ඉන් පිටතද ඇති කිරීම.

VI. අපනයනය පෙරටු කොට ගත් කෘෂිකාර්මික අංශයේ නවීකරණය තුළින් අගය එකතු කළ නිෂ්පාදනයන් උදෙසා ඉදිරිපත් වන ආයෝජකයින්, ව්‍යවසායකයින් හා අපනයනකරුවන් සඳහා සිය ව්‍යාපාර සංවර්ධනයට අවශ්‍ය මූල්‍ය ප්‍රදාන, ණය පහසුකම් හා තාක්ෂණික උපදෙස් ලබා දෙමින් ව්‍යාපාර දිරි ගැන්වීම.

VII. ආයෝජනයන් සඳහා ඉදිරිපත් වන දේශීය හා විදේශීය ව්‍යවසායකයන් සඳහා අවශ්‍ය තොරතුරු හා සහායක සේවාවන් ලබා දීම පිණිස පහසුකම් වලින් සපිරි වෙළඳ පොළ හා ආයෝජන සම්බන්ධ තොරතුරු සපයන සහායක සේවා ඒකකයක් (Trade facilitation unit) ස්ථාපනය කොට ආයෝජන දිරි ගැන්වීමට කටයුතු කිරීම.

VIII. විශේෂයෙන් අපනයනය ඉලක්ක කරගත් පලතුරු වගාව හා දේශීය හා විදේශීය වෙළඳ පොළ කේන්ද්‍ර කරගත් එළවළු වගාව ඇතුළු ඉහළ අපනයන වටිනාකමක් ඇති වෙනත් බෝග වගා ව්‍යාප්තිය හා නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

IX. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව, උපදේශන අංශය, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන මහ ලේකම් කාර්යාලය, වැඩිහිටි මහලේකම් කාර්යාලය හා කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතියේ වාර්ෂික සැලැස්ම හා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා

අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙමින් ඊට සහායවීම සහ ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා මෙහෙයවීම සඳහා සහාය වීම.

X. අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය සහ අනුබද්ධිත දෙපාර්තමේන්තු හා ආයතනවල පරිපාලන කටයුතු හා ආයතනික කටයුතු සම්බන්ධීකරණය කිරීම හා අවශ්‍ය මඟපෙන්වීම් සිදු කිරීම.

## 6.1.2. සමාජ සුබසාධන අංශය

I. රටේ සමස්ථ ජනගහනයෙන් මිලියන 2.5 ක් පමණ වන වැඩිහිටි පුද්ගලයින්ගේ සුබසාධනය හා අනාගත සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කරමින් එකී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා තෘප්තිමත් අනාගතයක් සලසාදීම පිණිස පියවර ගැනීම. (ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ප්‍රතිපත්තියක් සකස් කරන ලද අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත)

II. රැකවරණයක් නොමැති ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රැකවරණය සඳහා වඩාත් හිතකර රැකවරණ මධ්‍යස්ථාන හා සුරැකුම් නිවාස පවත්වා ගෙන යාම සඳහා රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේද දායකත්වය තහවුරු කිරීමට අවශ්‍ය වැඩසටහන් හඳුන්වා දීම.

III. යැපෙන්නන් වෙනුවට ස්වශක්තියෙන් තවදුරටත් ජීවත්විය හැකි ක්‍රියාකාරී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා අවශ්‍ය සහාය ලබා දෙමින් ඔවුනගේ සේවය ඵලදායීව ලබා ගැනීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

IV. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුනට සමාජයේ හිමිවිය යුතු පිළිගැනීම හා ගෞරවය ලබා දීම පිණිස ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම ඇතුළු විවිධ වැඩසටහන් ඔවුනගේ සෘජු දායකත්වය හා සහභාගීත්වය මත සංවිධානය කිරීම.

V. සමස්ථ ජනගහනයෙන් මිලියන 1.6 ක් පමණ වන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතීන් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා එම ප්‍රතිපත්තිය ඔස්සේ කටයුතු කිරීමට රාජ්‍ය අංශයේ සියළුම ආයතන වලට හා රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශයේ අදාළ ආයතන වලට අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කිරීම හා ඒවා නියාමනයට සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම.

VI. ආබාධ සහිත තැනැත්තන් හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සවිබලගැන්වීම හා ඔවුන්ගේ ආර්ථිකය නගා සිටුවීම සඳහා සුදුසු ස්වයං රැකියා අවස්ථා හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

VII. ආබාධ සහිත තැනැත්තන්ගේ ක්‍රීඩා, කලා සහ වෙනත් හැකියාවන් වර්ධනය කර ගැනීමට හා ඒ තුළින් ඉදිරියට යාම සඳහා අවශ්‍ය වැඩසටහන් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම.

VIII. ආබාධ සහිත පුද්ගලයින් අතරින් විශේෂයෙන් දෘශ්‍යාබාධිත ජනතාව වෙනුවෙන් ජාත්‍යන්තර සුදු සැරයටි දින සැමරුම් වැඩසටහන ඇතුළු විවිධ වැඩසටහන් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම තුළින් දෘෂ්‍යාබාධිත ප්‍රජාව කෙරෙහි සමාජයේ විශේෂ අවධානයක් යොමු කරවීම.

IX. විවිධ සමාජමය ගැටළු හේතුවෙන් අසහනයට හා ආතතියට පත් දරුවන් හා පුද්ගලයන්, ඉන් මුදා ගැනීම උදෙසා උපදේශන වැඩසටහන් හා සේවාවන් පවත්වා ගෙන යාම.

## 6.2. 2018.01.01 – 2018.12.31 දක්වා ක්‍රියාත්මක කළ වැඩසටහන් හා ව්‍යාපෘති (ප්‍රාථමික කර්මාන්ත අංශය)

වැඩසටහන 1 - අපනයන කෘෂි බෝග පැළ දස කෝටියක් සිටුවීමේ දීප ව්‍යාප්ත වැඩසටහන

වසර 2025 වනවිට රටේ අපනයන ආදායම දෙගුණ කිරීම හෙවත් ඇමරිකානු ඩොලර් මිලියන 25 දක්වා ඉහළ නැංවීමේ ජාතික ඉලක්කය ජය ගැනීම සඳහා අවශ්‍ය මූලික පදනම සකස් කිරීම මෙම අමාත්‍යාංශයට පැවරී ඇති ප්‍රමුඛතම වගකීමක් වේ. ඉතා කෙටි කාලයක් තුළ මෙම ඉලක්කය කරා ළඟා විය යුතුව ඇති අතර ඒ සඳහා අපනයන කෘෂි අංශයේ ඉතා ශීඝ්‍ර වර්ධනයක් අත්කර ගත යුතුව ඇත. මේ සඳහා කෘෂි නිෂ්පාදනයන්හි අගයදාමයන් ශක්තිමත් කරමින් අගය එකතු කළ නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා පියවර ගැනීම එක් අතකින් සිදු කෙරෙන අතර අනෙක් අතින් නිෂ්පාදන ධාරිතාවය වර්ධනය කරගත යුතුව ඇත.

රටේ කෘෂි අපනයන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය නිෂ්පාදන ප්‍රභවය සකස් කර ගැනීම අරමුණු කර ගනිමින් නිෂ්පාදන ධාරිතාවය වර්ධනය කර ගැනීමේ එක් පියවරක් ලෙස දිවයින පුරා අපනයන ඉලක්ක කොට ගත් නිෂ්පාදන විභවයක් පවතින ආර්ථිකමය වටිනාකමක් ඇති අපනයන කෘෂි බෝග පැළ දස කෝටියක් රෝපණය කිරීමේ ජාතික වැඩසටහනක් අප අමාත්‍යාංශය මඟින් දැනටමත් ආරම්භ කර ඇති අතර මේ යටතේ 2016 වසරේ ගම්මිරිස්, කුරුඳු ඇතුළු අපනයන කෘෂි බෝග පැළ මිලියන 07 ක්ද, 2017 වසරේ පැළ මිලියන 13 ක්ද රෝපණය කර ඇත. 2018 වසරේ මෙම ඉලක්කය පැළ මිලියන 25 ක් වූ අතර වසර අවසන් වන විට එම ඉලක්කය කරා ළඟා වී ඇත. මේ අනුව පැළ මිලියන 45 ක් පමණ 2018 වසර අවසන් වන විට රෝපණය කොට අවසන් කර ඇති අතර ඉදිරි වර්ෂ දෙක තුළ තවත් පැළ මිලියන 55 ක් රෝපණය කරමින් දිවයින පුරා පැළ දස කෝටියක් සිටුවීමේ



ඉලක්කය සපුරා ගැනීමට අමාත්‍යාංශය සියළු පියවර ගෙන ඇත.

වැඩසටහන 2 - අපනයන ගම්මාන 5000 ක් පිහිටුවීමේ වැඩසටහන

අවම නිෂ්පාදන වියදමක් සහිතව අගය එකතු කිරීම ඉහළ නැංවීම උදෙසා අතරමැදියා ඉවත් කර සෘජුවම අපනයන ඉලක්ක කර ගනිමින් තෝරාගනු ලබන ප්‍රදේශය සඳහා සුවිශේෂී, අපනයන විභවයක් සහිත බෝග කාණ්ඩයක් හෝ සුවිශේෂී අපනයන නිෂ්පාදනයක් ඉලක්ක කොට ගත් අගයදාමයක් සංවර්ධනය කර සමස්ථ ගම්මානය අපනයනාභිමුඛ නිෂ්පාදන සිදු කෙරෙන ගම්මානයක් ලෙසින් සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ඒවා ජාත්‍යන්තර අගයදාමයන් සමඟ ඒකාබද්ධ කිරීමත්, ග්‍රාමීය නිෂ්පාදන සෘජුවම ජාත්‍යන්තර වෙළෙඳ පොළ වෙත යොමු කිරීමත්, කෘෂිකාර්මික අංශයෙන් ලැබෙන ආදායම 50% කින් වැඩි කිරීමත්, ග්‍රාමීය නිෂ්පාදකයන්ගේ ආර්ථිකය හා නිෂ්පාදනයන්හි ගුණාත්මක බව ඉහළ නැංවීමත් සඳහා අපනයන ගම්මාන 5000ක්

පිහිටුවීමට මෙම අමාත්‍යාංශය අපේක්ෂා කරන අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

2018 වසරේ ආරම්භ කරන ලද මෙම වැඩසටහන යටතේ දැනටමත් ගම්මාන 250ක් හඳුනාගෙන ඒ අතුරින් ගම්මාන 100ක් ස්ථාපිත කර ඒවායේ ගුණාංගමය සුවිශේෂීත්වය පදනම් කර ගනිමින් අපනයන ගම්මානයක් ලෙස සංවර්ධනය කිරීමේ කාර්යය ආරම්භ කර ඇත. ඒ අනුව ඒකකයක් ලෙස ගම්මානයක් හඳුන්වා දෙමින් එහි ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කිරීමත් එමඟින් සාමාජීය හා වෘත්තීමය සුරක්ෂිතතාවය ඇති කරමින් ආකෘතිමය සංකල්පයක් ඉදිරිපත් කිරීමටත් අපේක්ෂා කෙරේ.

වැඩසටහන 3 - කෘෂිකාර්මික අධි කලාප පිහිටුවීම

ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්තව පවතින අපනයන ඉලක්ක කොටගත් අගයදාමයන්හි අගය එකතු කිරීම හා සැකසීම එම ප්‍රදේශයන්හිම සිදු කරමින් ඍජුවම ජාත්‍යන්තර වෙළඳ පොළට පිවිසීමට අවකාශ සැලසීම අරමුණු කර ගෙන කෘෂිකාර්මික අධි කලාප පිහිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක වේ. ඒ යටතේ කලාප තුනක මූලික කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත. ගාල්ල-ඇල්පිටිය අධි කලාපය, අම්පාර-උහන අධි කලාපය හා මාතලේ-විල්ගමුව අධි කලාපය යන ඒවා මෙම කලාපයන් වන අතර, මෙහිදී කෘෂිකාර්මික පදනමක් සහිත ආයෝජකයන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් හා යටිතල පහසුකම් වැනි දිරිගැන්වීම් ලබා දීම, ආයෝජකයන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම මෙන්ම ප්‍රාදේශීය වශයෙන් මානව සම්පත් සංවර්ධනය, රැකියා උත්පාදනය හා ක්‍රමෝපායික සැලසුම් සහගතව ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා සහාය ලබා දීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා එක් එක් කලාපයට අදාළව සම්පූර්ණ දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි කෘෂි නිෂ්පාදන පදනම (බෝග වගාව) ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය භෞතික පසුබිම නිර්මාණය කෙරෙන අතර ඒ යටතේ දිස්ත්‍රික්කයේ පවත්නා කෘෂි පාරිසරික තත්ත්වයන්ට ගැලපෙන බෝග වගාවන් ප්‍රවර්ධනයට හා ව්‍යාප්තියට අවශ්‍ය පහසුකම් සම්පාදනය සිදු කෙරෙන අතර, තවදුරටත් දිස්ත්‍රික්කයේ හඳුනාගත් නිශ්චිත ප්‍රදේශයක් කේන්ද්‍ර කොට ගෙන ඉහත නිෂ්පාදන අපනයනය සඳහා සැකසුම් කිරීම පිණිස සැකසුම් කලාප (Processing zones) පිහිටුවමින් එම කලාප තුළ කර්මාන්ත ශාලා ආරම්භ කිරීමට ව්‍යාපාරික ප්‍රජාවට අවශ්‍ය ඉඩම් හා අනෙකුත් භෞතික පහසුකම් සම්පාදනය සිදු කෙරේ.

ඒ අනුව ආර්ථිකමය වශයෙන් එක් අපනයන කලාපයක අපේක්ෂිත රාජ්‍ය ආයෝජනය රුපියල් මිලියන 400ක් පමණ ද පෞද්ගලික රාජ්‍ය ඒකාබද්ධ ආයෝජනය අවම වශයෙන් රුපියල් මිලියන 1,500ක් පමණ ද වන අතර එක් කලාපයකින් රුපියල් මිලියන 10,000ක් හෙවත් රුපියල් බිලියන 10ක වාර්ෂික ආදායමක් ද සමස්ත අපනයන කලාප ක්‍රියාවලිය මඟින් රුපියල් බිලියන 30ක ආදායමක් ද අපේක්ෂා කෙරේ.

- ගාල්ල ඇල්පිටිය කෘෂි අධි කලාපය

ගාල්ල ඇල්පිටිය පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 72 ක ඉඩමක් හඳුනාගෙන කෘෂි අධි කලාපයේ මූලික කටයුතු වන මූලික මැණුම් කටයුතු, ගෘහ නිර්මාණාත්මක සැළසුම් සකස් කිරීම, තලමිතික සටහන් ලබා ගැනීම, පාරිසරික අධ්‍යයන වාර්තා පිළියෙළ කිරීම හා ආරක්ෂිත වැට ඉදි කිරීම ආදිය මේ වන විටත් නිම කර ඇත.





- අම්පාර කෘෂි අධි කලාපය

අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අක්කර 258ක් විශාල කෘෂිකාර්මික අධි කලාපය සඳහා වන මූලික මැනුම් කටයුතු හා තලමිතික සටහන් ලබා ගැනීම අවසන් කර ඇති අතර පාරිසරික බලපෑම් අධ්‍යයනය ද ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ද මේ වනවිට සිදු කෙරෙමින් පවතී. කලාපය වටා අලිවැටක් හා ආරක්ෂිත වැටක් ඉදි කිරීම, පොදු මාර්ග හා ගොඩනැගිලි ඉදි කිරීම, ජලය හා විදුලිය ලබා ගැනීම හා කර්මාන්ත ඉදි කිරීමට අවශ්‍ය භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සැළසුම් කර ඇත. 2019 වසර තුළ මෙම අධි කලාපයේ නිෂ්පාදන ආරම්භ කිරීමටද මේ වනවිට සියළු කටයුතු සූදානම් කර ඇත.

- මාතලේ කෘෂි අධි කලාපය

මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට නියමිත කෘෂිකාර්මික අධි කලාපයේ මූලික මැනුම් කටයුතු හා තලමිතික සටහන් ලබා ගැනීම අවසන් කර ඇති අතර පොදු මාර්ග සකස් කිරීම, ආරක්ෂිත වැට ඉදි කිරීම, පොදු ගොඩනැගිලි සකස් කිරීම හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන කිරීම සැලසුම් කර ඇත. මේ සඳහා වන පාරිසරික බලපෑම් අධ්‍යයන වාර්තාවද මේ වනවිට සකසමින් පවතී. 2019 වසර අවසන් භාගයේදී මෙම කලාපයේ කෘෂි නිෂ්පාදන කර්මාන්ත ශාලා ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

වැඩසටහන 4 - ධීවර අධි කලාප පිහිටුවීමේ වැඩසටහන

2025 වසර වනවිට අපගේ අපනයන ආදායම දෙගුණ කිරීම සඳහා වන ගමනේ තවත් එක් සුවිශේෂී පියවරක් ලෙස ධීවර අධි කලාප ස්ථාපනය කිරීමේ වැඩසටහන හැඳින්විය හැක. මේ මඟින් ධීවර නිෂ්පාදනයන්හි අගයදාමයන් දියුණු කිරීමත්, එමඟින් ධීවර නිෂ්පාදනයන්ට අගය එකතු කොට විදේශ වෙළඳ පොළ ඉලක්ක කරගත් ඉහළ වටිනාකමකින් යුත් ධීවර නිෂ්පාදන තරඟකාරී ලෙස ගෝලීය වෙළඳ පොළට ඉදිරිපත් කරමින් වැඩි විදේශීය විනිමය ප්‍රමාණයක් උපයා ගැනීමත්, අරමුණු කොට ඇත. මේ අනුව දැනටමත් මූලික කටයුතු ආරම්භ කර ඇති පුත්තලම හා කල්පිටිය කලපු ආශ්‍රිත ප්‍රදේශයන්හි වගා රාක්ක ස්ථාපනය කොට කාවටි බෙල්ලන් වගා කලාපයක් ලෙස දියුණු කිරීමටත්, මුහුදු කැකිරි කොටු 200ක් කිලිනොච්චිය, යාපනය හා මන්නාරම යන දිස්ත්‍රික්ක වල නොගැඹුරු මුහුදු ප්‍රදේශයන්හි ස්ථාපිත කිරීමටත් කටයුතු කර ඇත. අඛණ්ඩව හා ක්‍රමවත්ව කාවටි බෙල්ලන් රට තුළ නිෂ්පාදනය කිරීම සඳහා බීජාගාරයක් (Hatchery) කල්පිටිය ප්‍රදේශයේ ඉදි කිරීමටද, හලාවත ධීවර නැංගුරම් මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමට හා දීප ව්‍යාප්තව ඇති අනෙකුත් නැංගුරම් මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමටද, කරදිය

හා කලපු ධීවර ප්‍රවර්ධන කටයුතු සඳහා එන්ජින් සහිත ධීවර යාත්‍රා සහ දැල් උපකරණ ලබා දීමටද කටයුතු කරමින් ඇත.

ධීවර අගයදාම සංවර්ධනය කිරීම උදෙසා ලියාපදිංචි ධීවර සමිති ශක්තිමත් කිරීමේ මුල් අදියර ලෙස අම්පාර දිස්ත්‍රික්කය වෙත ලබා දුන් දුම් ගැසූ මත්ස්‍ය (smoked fish) සැකසුම් ඒකක අනෙකුත් ලියාපදිංචි ධීවර සමිති වලට ද ලබා දීමට පියවර ගෙන ඇත. අඛණ්ඩ සහ ක්‍රමවත් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා නවීන තාක්ෂණානුකූලව ජල පාදක මත්ස්‍ය බීජාගාර දිවයින පුරා ඇති මිරිදිය ජලාශ අරඹයා ස්ථාපනය කිරීමටද මුතු බෙල්ලන් වගාව දීප ව්‍යාප්තව ස්ථාපිත කිරීමේත්, ප්‍රචලිත කිරීමේත් අරමුණින් යුතුව මිරිදිය ජලාශ සඳහා මිරිදිය මුතු බෙල්ලන් හඳුන්වා දීමටද, මොරගහකන්ද ජලාශය සහ උප ජලාශ 15 ක් සඳහා ධීවර අගයදාම ප්‍රවර්ධනය වෙනුවෙන් මූලික අදියර ලෙස මිරිදිය මසුන් මිලියනයක් හඳුන්වාදී ඉදිරියේදී තවත් මිලියන 3ක් හඳුන්වා දීමටද මේ වනවිට පියවර ගෙන ඇත. යෝධ අඩු ඉස්සන් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ඉස්සන් පැටවු මිලියනයක් ලබා දීමටද ලියාපදිංචි ධීවර සමිති සඳහා ධීවර යාත්‍රා ලබා දීමට ද දැල් හා අනෙකුත් උපකරණද කාර්යාල පහසුකම් ලබා දීමට ද අපේක්ෂා කෙරේ. ධීවර ක්ෂේත්‍රයේ මෙම සංවර්ධන කටයුතු තුළින් වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 250ක විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීමට ඉලක්ක කොට ඇත.







වැඩසටහන 5 - ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ග්‍රාමශක්ති ව්‍යාපාරය යටතේ මෙම අමාත්‍යාංශ විෂය පථයට ගැනෙන වැඩසටහන් හා ව්‍යාපෘති රාශියක්ද මෙම වසරේ සිට ක්‍රියාවට නංවා ඇත. භෞතික හා මානව සම්පත් සැළකිල්ලට ගනිමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිෂ්පාදන විභවතාවයන් සහිත ග්‍රාම නිලධාරී වසම් හඳුනා ගනිමින් ග්‍රාමශක්ති ව්‍යාපාරය යටතේ වැඩසටහන් හා ව්‍යාපෘති රාශියක් අමාත්‍යාංශ ප්‍රතිපාදන යොදා ගෙන දීප ව්‍යාප්ත වශයෙන් ක්‍රියාත්මක කිරීමට ද සැලසුම් කර ඇත. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් හා ව්‍යාපෘති මඟින් ග්‍රාමීය වශයෙන් ස්වයං රැකියා අවස්ථා 5,000 ක් පමණ බිහිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2018 වසර අවසන් වන විට ග්‍රාම නිලධාරී වසම් 20ක නිෂ්පාදන විභවතාවයන් සංවර්ධනය උදෙසා ව්‍යාපෘති 20ක් ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 37.4ක ප්‍රතිපාදන නිදහස් කොට ඇත.

වැඩසටහන 6 - ටොම් ඊ ජේ සී අඹ වගා ව්‍යාපෘතිය

2016 වසරේ සිට ක්‍රියාත්මක වන මෙම වැඩසටහන ප්‍රාථමික කර්මාන්ත අංශයේ ප්‍රධානතම වැඩසටහනක් වේ. ගොවියාට වාර්ෂිකව රුපියල් 250,000ක ආදායමක් උත්පාදනය කර දීමේ බලාපොරොත්තුවෙන් යුතුව අඹ පැළ මිලියන 3ක් බෙදා දීමට

අපේක්ෂා කරනු ලබන අතර එයින් 2016 වසරේ අඹ පැළ 26,000ක්ද, 2017 වසරේ පැළ 280,000 ක්ද, 2018 වසරේ පැළ 830,000ක්ද, පර්ෂද වශයෙන් ගොවි කණ්ඩායම් වෙත ලබා දී ඇත. 2019 වර්ෂයේදී පැළ මිලියනයක් බෙදා දීමට හා වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 300 ක ආදායමක් උපයා ගැනීමට අපේක්ෂා කෙරේ.





වැඩසටහන 7 - කටු අනෝදා වගා ව්‍යාපෘතිය

සෞඛ්‍යමය වශයෙන් නිරෝගී දිවිපෙවෙතක් උදෙසා කටු අනෝදා සඳහා වන අතිශය ඉල්ලුම පදනම් කර ගෙන අපනයනය ඉලක්ක කරගත් බෝගයක් ලෙස ප්‍රවර්ධනය කිරීමත් , පවුල් ඒකකයක නිෂ්පාදන ආදායම ඉහළ නැංවීමත් අරමුණු කොටගෙන ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. මේ යටතේ පැළ 100,000ක් ප්‍රතිලාභීන් අතර බෙදා දීමට කටයුතු සැලසුම් කරමින් පවතී.



වැඩසටහන 8 - අපනයනාභිමුඛ අන්නාසි වගා අගයදාම ව්‍යාපෘතිය

ලොව අනෙකුත් රටවල් වලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අන්නාසි වල පවතින සුවිශේෂී රසය ද අන්නාසි වගාව සඳහා ශ්‍රී ලංකාවේ දේශගුණයේ පවතින යෝග්‍ය බව හා කෙටි කාලීනව ආදායම් ඉපයිය හැකි කෘෂිකාර්මික බෝගයක් ලෙස පවතින සුවිශේෂීත්වය පදනම් කර ගෙන දේශීය හා විදේශීය වෙළඳ පොළ තුළ තරඟකාරී ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය නිෂ්පාදනමය පසුබිම සැකසීමත්, රටට ලබා ගත හැකි විදේශ විනිමය ප්‍රමාණය ඉහළ නංවාලීමත් අරමුණු කර ගම්පහ, කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක වල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. 2016 වසරේදී ආරම්භ කොට සාර්ථකව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා අක්කර 25,000 ක අන්නාසි වගාවක්ද, ඒ සඳහා පැළ ලබා ගැනීම පිණිස තවාන් 750 ක්ද 2020 වන විට ස්ථාපනය කිරීමට අපේක්ෂා කරන අතර මෙම ව්‍යාපෘතිය මඟින් වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 150 ක පමණ අපනයන ආදායමක් ලබා ගැනීමට ඉලක්ක කර ඇත. තවද ඵලදායි නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා පටක රෝපණ අන්නාසි පැළ බිලියනයක් සැකසීමට අපේක්ෂිත අතර මේ

දක්වා පටක රෝපණ පැළ 100,000ක් බෙදා දී ඇති අතර 2019 වර්ෂයේදී ප්‍රතිලාභීන් 500ක් සඳහා අන්නාසි වගාව වෙනුවෙන් ආධාර සැපයීමට ද අපේක්ෂා කරනු ලැබේ.





වැඩසටහන 9 - කජු වගා ව්‍යාපෘතිය

අපනයනාභිමුඛ නිෂ්පාදනයක් ලෙස ප්‍රවර්ධනය කර 2020 වන විට අපනයන ආදායම 25%කින් පමණ වැඩි කිරීමේත්, අම්පාර දිස්ත්‍රික්කය තුළ කජු අධි කලාපයක් ඇති කිරීම තුළින් අම්පාර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමේත්, කජු නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් කජු මඟින් අගය දාමය වැඩි කළ නිෂ්පාදන විදේශ වෙළඳ පොළ වෙත වැඩි වශයෙන් ඉදිරිපත් කිරීමට යොමු කිරීමේත් අපේක්ෂාවෙන් යුතුව හා අම්පාර ප්‍රදේශයේ ඉදි කරමින් පවතින කෘෂි අධි කලාපය සඳහා අවශ්‍ය නිෂ්පාදන විභවය සකස් කර ගැනීමේ ක්‍රමෝපායක් ලෙසත් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ පළමු අදියරේ දී කෘෂිකර්ම ක්ෂේත්‍ර නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ අම්පාර ප්‍රදේශයේ ප්‍රතිලාභීන් 161ක් සඳහා බද්ධ කජු පැළ 5,000ක් මහ කන්නයේ වගා කිරීම සඳහා ලබා දීමට කටයුතු කිරීම හා කජු වගාව සඳහා විශාල විභවයක් ඇති මහඔය පදියතලාව ප්‍රදේශයන්හි තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා පැළ 25,000ක් ලබා දීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින අතර මේ දක්වා පැළ 11,000ක් බෙදා දී ඇත. මීට අමතරව ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙරේ.





වැඩසටහන 10 - මී මැසි පාලන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ මී පැණි ආනයනය අවම කරමින් නව අපනයන වෙළඳ පොළ ප්‍රභවයක් හඳුනාගැනීම හා ජෛව විවිධත්වය අතින් අතිශයින් සංවේදී හා සුවිශේෂී කලාපයක් ලෙස ශ්‍රී ලංකාවේ මී පැණි ලෝක වෙළෙඳ පොළ තුළ සන්නාමගත කිරීමත් නවීන ක්‍රමෝපායික තාක්ෂණික ශිල්ප ක්‍රම මඟින් අගය එකතු කළ නිෂ්පාදන දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත කිරීමත් ශ්‍රී ලංකාවේ පවතින මී පැණි ආශ්‍රිත නිෂ්පාදනයන්හි අවශ්‍යතා සඳහා වන මී පැණි හිඟයට පිළියමක් ලෙස හා ලාංකීය මී පැණි නිෂ්පාදකයින් හා වෙළඳ පොළ ආරක්ෂා කිරීමත්, දියුණු කිරීමත් අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. ඉදිරි වසරේදී මී

පැණි නිෂ්පාදකයින්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට ද අපේක්ෂා කරයි. සාර්ථකව පුහුණුව නිම කරන ලද නිෂ්පාදකයින්ට මී මැසි පෙට්ටි 7000 ක් මේ වන විට බෙදා දී ඇති අතර, මී මැසි ජනපද සොයා ගැනීම පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා දීමට ද, මේ වන විට ස්ථාපිත කර ඇති පොකුරු ගම්මාන 75 තව දුරටත් ව්‍යාප්ත කිරීමට ද මී පැණි හා සම්බන්ධ අගය එකතු කළ නිෂ්පාදනයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කොට එම නිෂ්පාදකයින් සඳහා අවශ්‍ය දිරි ගැන්වීම් ලබා දීමට ද නිෂ්පාදකයින්ගේ සමිති පිහිටුවීමට ද එකම සන්නාමයක් යටතේ දීප ව්‍යාප්තව මී පැණි නිෂ්පාදනය අලෙවි කිරීමට ද සැලසුම් කර ඇත. තවද මෙම ව්‍යාපෘතිය ශක්තිමත් කිරීමට අම්පාර ප්‍රදේශයේ මී මැසි පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.





වැඩසටහන 11 - බිම්මල් වගා ව්‍යාපෘතිය

නිර්මාංශමය ප්‍රෝටීන අඩංගු කොලෙස්ටරෝල් රහිත ආහාරයක් ලෙස ප්‍රචලිත බිම්මල් නැගෙනහිර හා අග්නිදිග ආසියාතික රටවලට අපනයනය කිරීමේ ඉහළ විභවතාවයක් පවතී. ඒ අනුව දේශීය බිම්මල් ඉල්ලුම සංතෘප්ත කරමින් නිෂ්පාදන වෙළඳ පොළ ඉලක්කයක් කරා බිම්මල් නිෂ්පාදනය යොමු කිරීමත් බිම්මල් වගාවේ නියැලී සිටින නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන වල ගුණාත්මකභාවය දියුණු කිරීමත් අරමුණු කරගෙන ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ බිම්මල් වගා ගෘහ සකස් කර ගැනීම සඳහා නිෂ්පාදකයින් 700 ක් සඳහා ආධාර ලබා දී ඇත. තවද දැනට නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරනු ලබන ප්‍රාථමික ශිල්පක්‍රම වෙනුවට නවීන ක්‍රමවේදයන් හඳුන්වා දී නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය තහවුරු කිරීමටත්, දැනට නිෂ්පාදනයන්හි සිදු වන පසු අස්වනු විනාශය හා වගා මළු විනාශ වීම අවම කිරීමටත්, ඉදිරියේදී නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින් ජල වාෂ්ප තුළින් ආර්ද්‍රතාවය පාලනය කරන ඒකක ලබා දීමටත්, ප්‍රතිලාභීන්ගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් නිෂ්පාදකයින්ගෙන් සමන්විත සමිති පිහිටුවීම හා ප්‍රතිලාභීන් වෙත බිම්මල් වගා මළු සැකසීමේ යන්ත්‍ර ලබා දීමටත් මහා පරිමාණ වගාකරුවන් හා බීජ නිෂ්පාදකයින් දිරිගැන්වීම හා ඔවුන් කුඩා පරිමාණ නිෂ්පාදකයින් සමඟ සම්බන්ධ කොට තත්ත්ව සහතික ලබා දෙමින් එකම සන්නාමයක් යටතේ වෙළෙඳ පොළ තුළ බෙදා හැරීමටත් 2019 වර්ෂයේදී ප්‍රතිලාභීන් 1,000ක් සඳහා බිම්මල් වගා ගෘහ සකස් කර ගැනීමට ආධාර ලබා දීමටත් සැලසුම් කර ඇත.







වැඩසටහන 12 - අපනයන කෘෂි බෝග පැළ තවාන් 1000 ක් සංවර්ධන කිරීම

නූතනයේදී කෘෂිකාර්මික බෝගයන්ගේ ගුණාත්මකභාවය ඒ සඳහා යොදාගනු ලබන රෝපණ ද්‍රව්‍යන්ගේ ගුණාත්මකභාව මත රඳා පවතී. ඒ අනුව ස්වාභාවික, දේශගුණික හා වෙනත් බාහිර උපද්‍රවයන් හේතුවෙන් පැළ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයට සිදුවන හානිය හා බලපෑම අවම කරමින් වසර පුරා අඛණ්ඩව ඉහළ ගුණාත්මකභාවයකින් යුක්තව පැළ හා රෝපණ ද්‍රව්‍ය ගොවීන් වෙත සැපයීම තහවුරු කිරීම උදෙසා 2018 අයවැය යෝජනා යටතේ පැළ තවාන් 1000 ක් සංවර්ධනය කිරීමට අප විසින් කටයුතු කරමින් පවතී. ඒ සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමත්, තාක්ෂණික ගුණත්වය ලබා දීම හරහා ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් යටතේ ආරක්ෂිත දැල් ගෘහ තුළ පැළ තවාන් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය දැල් ගෘහ තවාන්කරුවන් වෙත ලබා දීමටත්, මෙම තවාන් වල පැළ නිෂ්පාදනයට අවශ්‍ය පැල බඳුන් සඳහා නව මාධ්‍යයක් ලෙස සම්පීඩිත කොහු බඳුන් හඳුන්වා දීමටත්, නූතන ජල කළමනාකරණ පද්ධතීන් හඳුන්වා දීමටත්, මව් ශාක උද්‍යාන ක්‍රම හඳුන්වා දීමටත්, තවාන්වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා A, B හා C වශයෙන් නිර්ණායක සකස් කොට ද්විවාර්ෂිකව ඇගයීමේ ක්‍රමවේදයක් යටතේ තවාන් ශ්‍රේණි ගත කිරීමටත් කටයුතු කරමින් මෙම ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත. 2018 වසර අවසන් වනවිට තවාන් 17ක් A ශ්‍රේණියට උසස් කර ඇත.

වැඩසටහන 13 - අපනයන කෘෂි බෝග සැකසුම් යන්ත්‍ර නවීකරණ වැඩසටහන

විශේෂයෙන් යුරෝපා රටවල් ඇතුළු ගෝලීය වෙළඳ පොළ තුළ අපගේ අපනයන කෘෂි නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් සහතික කර ගැනීමේදී මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ අපගේ නිෂ්පාදනයන් තුළ යකඩ ඇතුළු ලෝහ වර්ග හා බාහිර අපද්‍රව්‍ය අඩංගු වන බවට ඉදිරිපත් වී ඇති චෝදනාවයි. අපගේ අපනයන කෘෂි නිෂ්පාදන සැකසුම් ක්‍රියාවලිය (Processing) සඳහා යකඩින් තැනූ යන්ත්‍ර සූත්‍ර භාවිතය මේ සඳහා හේතුවී ඇති බවට පර්යේෂණ මගින් තහවුරු කර ගැනීමත් සමඟ ඒ සඳහා පිළියමක් ලෙස යකඩ වෙනුවට සුදු යකඩ යොදා සකස් කළ සැකසුම් යන්ත්‍ර හඳුන්වා දීමට හා එම පැරණි යන්ත්‍රවල යකඩ කොටස් ඉවත් කර සුදු යකඩ කොටස් යොදා නවීකරණය කිරීම පිණිස සැකසුම්කරුවන් දිරි ගැන්වීම සඳහා අමාත්‍යාංශය විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා මූල්‍යාධාර මෙන්ම තාක්ෂණික සහායද සැකසුම්කරුවන් වෙත ලබා දීම සඳහා සැකසුම්කරුවන් ලියාපදිංචිය, යන්ත්‍ර නිෂ්පාදකයින් සමඟ පවත්නා යන්ත්‍ර නවීකරණයට අවශ්‍ය පියවර සාකච්ඡා කිරීම, නව යන්ත්‍ර නිපදවීමේදී යකඩ කොටස් භාවිතය තහනම් කිරීමට අවශ්‍ය නීති රෙගුලාසි සකස් කිරීම වැනි කාර්යයන් මේ වනවිටත් සිදු කරමින් පවතී. 2020 වන විට යකඩින් තැනූ සැකසුම් යන්ත්‍ර අපනයන කෘෂි බෝග සැකසුම් කර්මාන්තයෙන් සම්පූර්ණයෙන් ඉවත් කිරීමට සැලසුම් කර ඇත.

වැඩසටහන 14 - කුරුඳු සංවර්ධන වැඩසටහන

සිලෝන් සිනමන් (Ceylon Cinnamon) නමින් ලෝක ප්‍රකට ශ්‍රී ලංකාවේ කුරුඳු සඳහා ගෝලීය වෙළඳ පොළ තුළ ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර එම වෙළඳ පොළට කුරුඳු සපයන රටවල් අතර අද්විතීය ස්ථානයක් ශ්‍රී ලංකාවට හිමිවී ඇත. ලෝකයේ අනෙකුත් රටවලින් ගෝලීය වෙළඳ පොළට ඉදිරිපත් කෙරෙන කුරුඳු හා කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන සමඟ තරඟ කරමින් අපගේ අද්විතීය ස්ථානය තවදුරටත් රැක ගැනීම උදෙසා කුරුඳු ආශ්‍රිතව අගය එකතු කළ නව නිෂ්පාදන හඳුන්වා දීමටත්, කුරුඳු වල ඇති ඖෂධීය හා සෞඛ්‍යමය ගුණාංග හා වටිනාකම පිළිබඳව පර්යේෂණ ආශ්‍රයෙන් නව සොයා ගැනීම් හා එම තොරතුරු ප්‍රකාශයට පත් කිරීමත්, කුරුඳු නිෂ්පාදන සඳහා ප්‍රමිතීන් හඳුන්වා දීම මගින් ඒවාට ඉහළ පිළිගැනීමක් සහතික කිරීමත් අත්‍යවශ්‍ය කරුණු බවට පත්ව ඇත. ඒ අනුව මෙම ක්‍රියාවලිය ජාතික විද්‍යා පදනම සමඟ එක්ව මේ වනවිට ආරම්භ කොට ඇති අතර ජාතික විද්‍යා පදනම හා රජයේ විශ්වවිද්‍යාල පහක් සමඟ සහයෝගයෙන් කුරුඳු ආශ්‍රිත පර්යේෂණ පහක කටයුතු සිදු කරමින් පවතී. මීට අමතරව කුරුඳු කර්මාන්තයේ සංවර්ධනයට විශාල බාධාවක්ව පවතින කුරුඳු තලන්නන්ගේ හිඟයට පිළියම් සෙවීම පිණිස කොස්ගොඩ කුරුඳු පුහුණු පාසල වැඩිදියුණු කිරීමටත්, තරුණ පරපුර කුරුඳු තැලීම ඇතුළුව සැකසුම් කර්මාන්තයට ආකර්ශනය කර ගැනීම උදෙසා කුරුඳු සැකසුම්කරුවන් වෙත ජාතික වෘත්තීය සහතික (NVQ) මට්ටමේ පුහුණු පාඨමාලා ආරම්භ කොට වෘත්තීය පිළිගැනීමක් ඇති කිරීමටත් අවශ්‍ය පියවර මේ වනවිටත් ගෙන තිබේ. මෙම සහතිකය ලබා දීමේ ප්‍රථම පියවර ලෙස කුරුඳු සැකසුම්කරුවන් උදෙසා පෙර ඇගයුම් සහතික පත්‍රයක් (RPL) ලබා දීමට කටයුතු කර ඇති අතර ඒ යටතේ 782 කට මෙම RPL සහතික ලබා දී ඇත. ඒ අනුව 10,000කට NVQ සහතික ලබා දීමට සැලසුම් කර ඇත.




වැඩසටහන 15 - ඌව පළාත් සංවර්ධන කටයුතු

මෙම වැඩසටහන යටතේ ඌව පළාතේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ හා සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීම උදෙසා බිඳුණුවැව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය නවීකරණයට යොමු කරමින් සංවර්ධනය කිරීමටත්, බොරලන්ද සත්ත්ව ගොවිපල නවීකරණය කිරීමටත් කටයුතු කර ඇත. ඒ අනුව ඌව පළාතේ හා අනෙකුත් ආසන්න දිස්ත්‍රික්කයන්හි කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැලී සිටින සියළුම පාර්ශවකරුවන් සඳහා නවීන කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබා ගත හැකි පරිදි බිඳුණුවැව සේවා සංස්කරණ ආයතනය සංවර්ධනය කිරීම හා ප්‍රදේශයේ බීජ අල නිෂ්පාදකයින් සඳහා අවශ්‍ය මූලික බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය අරමුණු කරගෙන ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කාර්යයන් රාශියක් සිදු කෙරෙන අතර ආදර්ශ කෘෂි බෝග වගාවන් සඳහා ආරක්ෂිත ගෘහ ඉදිකිරීම, ජල සම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීම පිණිස ළිඳ, පොකුණ, පොම්පාගාරය හා ජල නල පද්ධතිය සකස් කිරීම, බීජ අර්තාපල් ගබඩා කිරීමට ශීතාගාරයක් ඉදි කිරීම, පටක රෝපණ රසායනාගාරය

නවීකරණය කිරීම, ආදර්ශ හරිතාගාර තුනක් සඳහා ඇණවුම් කිරීම යනාදී කාර්යයන් රාශියක් ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව සිදු කෙරේ.





මීට අමතරව ඌව පළාතේ කිරි ගොවීන් සඳහා අවශ්‍ය උසස් තත්ත්වයේ කිරි ගවයින් අභිජනනය කර ගොවීන්ට සහන මිලකට ලබා දීම අරමුණු කරගෙන බොරලන්ද සත්ත්ව ගොවිපළ සංවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කෙරෙන අතර, ඒ යටතේ උසස් වර්ගයේ ආනයනික කිරි දෙනුන් 100 ක් 2017 වර්ෂයේදී ලබා දී ඇත. මෙම ගවයින් සඳහා අවශ්‍ය නවීන පහසුකම් වලින් සමන්විත ගව ගාලක්, අක්කර 20 ක තෘණ වගාවක්, සයිලේජ් බංකර ඉදි කිරීම, ජෙනරේටරයක්, ට්‍රැක්ටරයක්, තෘණ කැබලි කරන යන්ත්‍රයක් හා මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් සැපයීම, ජලය ලබා ගැනීම සඳහා කුඩා වැවක් තැනීම හා ජලනල සකස් කිරීම ආදී කාර්යයන් රැසක් මේ වනවිට අවසන් කර ඇති අතර ඉදිරියේදී නවීන තාක්ෂණයෙන් සමන්විත කිරි එකතු කිරීමේ ඒකකය ඉදිකිරීම, තෘණ වගාව තවදුරටත් ව්‍යාප්ත කිරීම හා තෘණ වගාවන් තුළ අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉදිකිරීම හා තෘණ වගාව සඳහා ජල සම්පාදනය කිරීමටද සැලසුම් කර ඇත. මෙම පහසුකම් වැඩි දියුණු කිරීම තුළින් ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් ඒ මඟින් උසස් ආරයේ ගවයින් අභිජනනය කර ප්‍රදේශයේ කිරි ගොවීන්ට අවශ්‍ය කිරි දෙනුන් සහනදායී පදනමින් සපයා දීමටත් එමගින් රටේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට දායකත්වය ලබා දීමටත් අපේක්ෂා කෙරේ.





වැඩසටහන 16 - එළවළු හා පලතුරු සැකසුම් මධ්‍යස්ථාන 10 ක් ඉදිකිරීම

ප්‍රදේශයේ ගොවීන්ගේ නිෂ්පාදන අපනයන වෙළඳ පොළට හා මෙරට සුපිරි වෙළඳසල් ජාලයට ගැළපෙන සේ සකස් කර බෙදා හැරීමට අවශ්‍ය පහසුකම් ඇති සැකසුම් මධ්‍යස්ථාන ඉදිකිරීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මේ යටතේ ස්ථාපනය කෙරෙන ප්‍රථම අපනයන සැකසුම් මධ්‍යස්ථානය අනුරාධපුර දිස්ත්‍රික්කයේ නාච්චදූව ප්‍රදේශයේ ආරම්භ කර ඇති අතර දැනට එහි ඉදි කිරීම් කටයුතු 95% ක් අවසන් කොට ශීතාගාරය සඳහා සූර්යය බල ශක්ති ඒකකය ප්‍රසම්පාදනය කරමින් පවතී. අනෙකුත් මධ්‍යස්ථාන බදුල්ල(ඌව පරණගම), අම්පාර(උහන), යාපනය, පුත්තලම(කල්පිටිය), නුවරඑළිය, රත්නපුර හා මොණරාගල දිස්ත්‍රික්කයන්හි පිහිටුවීමට අපේක්ෂා කෙරේ. එළවළු හා පළතුරු ගොවීන් නිරන්තරයෙන් මුහුණ දෙන මිල උච්ඡාවචනයන්ට මුහුණ

දීමේ ගැටළුවට විසඳුම් ලබා දීමත්, ප්‍රමිතියෙන් යුත් නිෂ්පාදන ඉදිරිපත් කිරීම තුළින් දේශීය හා විදේශීය වශයෙන් ස්ථාවර වෙළඳ පොළක් ලබා ගැනීම සහතික කර දීමත් මෙමඟින් සිදු කෙරෙන අතර ඒ තුළින් ගොවීන්ට හා නිෂ්පාදකයන්ට ඉහළ ආදායමක් ලබා ගැනීමටත් අවස්ථාව උදා කර දීම මෙහි ප්‍රධානතම අරමුණයි.

වැඩසටහන 17 - කෘෂි සේවා සැපයුම් මධ්‍යස්ථාන පිහිටුවීම (Farm Shed)

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පවතින ශ්‍රම හිඟයට පිළියමක් ලෙසත් කෘෂි කර්මාන්තයෙන් ඈත් වන තරුණ ජවය කෘෂිකර්මාන්තය වෙත නැවත ආකර්ශනය කර ගැනීමත්, නවීන තාක්ෂණය ගමට ගෙන යැමත් මඟින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඵලදායීතාවය ඉහළ නැංවීම අරමුණු කොට ගෙන එක් ගමකට කෘෂි සේවා සපයන එක් ව්‍යවසායකයකු බිහි කිරීම ඉලක්ක කොට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර එවැනි ඒකක 375 ක් ස්ථාපනය කිරීමේ කටයුතු දැනට සිදුකර අවසන්ව ඇත. ඉදිරි වර්ෂයේදී තවත් මෙවැනි කෘෂි සේවා මධ්‍යස්ථාන 200ක් ස්ථාපිත කර ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීමට ද අපේක්ෂා කරනු ලැබේ. මෙවැනි එක් මධ්‍යස්ථානයක් සඳහා අතු කපන යන්ත්‍රයක්, වලවල් හාරන යන්ත්‍රයක්, තෙල් ඉසින යන්ත්‍රයක් හා බිම් සකසන යන්ත්‍රයක් යනාදී වශයෙන් උපකරණ කට්ටලයක් එක් ව්‍යවසායකයෙකු වෙත ලබා දෙන අතර මෙම කට්ටලය යොදා ගනිමින් ප්‍රදේශයේ ගොවීන්ගේ පවත්නා වගාවන් නඩත්තුව හා නව වගාවන් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සේවා පහසුකම් සපයාදීම මඟින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ නැංවීම තුළින් රටට ලැබෙන ආදායම ඉහළ නැංවීම මෙහි අපේක්ෂාවයි.

වැඩසටහන 18 - ආදායම් වර්ධක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

නැගෙනහිර පළාත ප්‍රමුඛ කොට ගෙන දිවයින පුරා විසිරී සිටින අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම වෙනුවෙන් විවිධ ආදායම් වර්ධක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීමද අමාත්‍යාංශය වෙත පවරන ලද අතර ඒ අනුව දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි හඳුනා ගත් සුළු හා මධ්‍ය පරිමාණ ආදායම් වර්ධක වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. ඒ යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක බතික් කර්මාන්තයේ නියැළි ජනතාවගේ ආදායම් තත්ත්වය වැඩි දියුණු කිරීමේ පියවරක් ලෙස බතික් කර්මාන්තය පිළිබඳ විධිමත් පුහුණුවක් ප්‍රතිලාභීන් 600 කට පමණ ලබා දීම හා ඔවුනට සිය කර්මාන්තය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මූලික ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කර ඇත. එමෙන්ම ප්‍රතිලාභීන් 644 දෙනෙකු සඳහා අත්යන්ත්‍ර පේෂකර්ම පුහුණු වැඩසටහනක් පැවැත්වීම තුළින් ඔවුනට ස්වයං රැකියාවක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය උපකරණ පහසුකම් හා අනෙකුත් ද්‍රව්‍ය ලබා දීමද සිදුකරන ලද අතර, මූලික ප්‍රාග්ධනය සපයා ගැනීමට අපහසු අඩු අදායම්ලාභී ස්වයං රැකියා කරනු ලබන අඞ්ඩාලච්චේන ප්‍රදේශයේ කාන්තාවන් 17 ක් උදෙසා මහන මැෂින් ලබා දීම ද මෙම වැඩසටහන් යටතේ සිදු කර ඇත.

එමෙන්ම වලං හා මැටි කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන වැඩසටහන් හා කොහු ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත දිරිමත් කිරීමේ අරමුණින් යුතුව කොහු ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදකයින් උදෙසා ප්‍රතිපාදන ලබා දීම ද සිදු කරන ලද අතර නැගෙනහිර පළාත ප්‍රමුඛ කොටගත් මෙම ව්‍යාපෘතීන් ඉදිරි වර්ෂයේදී අනෙකුත් පළාත් දක්වා ව්‍යාප්ත කිරීමටද මෙම අමාත්‍යාංශයේ අපේක්ෂා කෙරේ.

වැඩසටහන 19 - ප්‍රචාරක හා අත්දැකීම් හුවමාරු වැඩසටහන්

මේ යටතේ දේශීය විදේශීය හා වෙළඳ ප්‍රදර්ශන හා සල්පිල් සඳහා සහභාගී වීමත්, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා අත්දැකීම් හුවමාරු වැඩසටහන් සඳහා නිලධාරීන් මෙන්ම අනෙකුත් පාර්ශවකරුවන් සහභාගී කරවීමත්, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් ඔස්සේ අමාත්‍යාංශ කාර්යභාරය පිළිබඳව පුළුල් ප්‍රචාරයක් ලබා දීමට පියවර ගැනීමත් අඛණ්ඩව සිදුවේ.

## 6.3. 2018.01.01 – 2018.12.31 දක්වා ක්‍රියාත්මක කළ වැඩසටහන් හා ව්‍යාපෘති (සමාජ සුබසාධන අංශය)

වැඩසටහන 1 - ආබාධ සහිත ප්‍රජාව උදෙසා වැඩසටහන්

මේ යටතේ විශේෂයෙන් ආබාධ සහිත පුද්ගලයින්ගේ සුබසාධනය මෙන්ම ඔවුන්ගේ ආර්ථිකමය සුරක්ෂිතතාවය තහවුරු කිරීම පිණිස වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට වැඩි අවධානයක් යොමු කර ඇත. ඒ අනුව ආබාධ සහිත පුද්ගලයන් සඳහා නව තාක්ෂණ ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් පවතින වෙළඳ පොළට සරිලන පරිදි වෘත්තීමය ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම උදෙසා වෘත්තීය පුහුණු ආයතන හා ස්වේච්ඡා සංවිධාන හරහා වෘත්තීය පුහුණු අවස්ථා වැඩිදියුණු කිරීමටත්, නිෂ්පාදන සඳහා නවීන තාක්ෂණය උපයෝගී කොට ගෙන පාරිභෝගික ආකර්ශණය දිනාගැනීම සඳහා "දිරිය" වෙළඳ සන්නාමය යටතේ ගුණාත්මකව වෙළඳපළට හඳුන්වා දීමටත් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.




"දිරිය" වෙළඳ සන්නාමය යටතේ ගුණාත්මක භාණ්ඩ වෙළඳ පොළට හඳුන්වා දීම.

එමෙන්ම ඔවුන්ගේ සමාජ සුබසාධන කටයුතු වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමත්, ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්තීන් සකස් කොට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යාන්ත්‍රණ සකස් කිරීමත් කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කර ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හඳුනාගනු ලබන ආබාධ සහිත දරුවන් කෙරෙහිද මෙහිදී විශේෂ අවධානයක් යොමු කර ඇත. ඔවුන්ගේ අධ්‍යාපනයට හා විශේෂ දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය විශේෂ ක්‍රියාකාරකම් විනෝදාත්මක පරිසරයක් තුළ සංවිධානය කරමින් මේ යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන අතර එම දරුවන් සඳහා විධිමත් මාර්ගෝපදේශකත්වය ලබා දීම හා භාරකරුවන් අහිමි බුද්ධි ඌනතා ළමුන් සඳහා රැකවරණ මධ්‍යස්ථාන පළාත් මට්ටමින් පිහිටුවීම හා පුළුල් කිරීමත්, ඒවායේ යටිතල පහසුකම් ඇති කිරීමත් මෙම වැඩසටහන් යටතේ සිදු කෙරේ.





විශේෂ අවශ්‍යතා සහිත දරුවන් අන්තර්කරණය හා විශේෂ අධ්‍යාපනයට යොමු කිරීම

ආබාධ සහිත පුද්ගලයින්ගේ සංස්කෘතික හා කලා කුසලතා ඔප් නැංවීම සඳහා වන විවිධ වැඩසටහන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් සංවිධානය කෙරෙන අතර "සිත් රූ" ජාතික සංස්කෘතික කලා ප්‍රසංගය මේ අතරින් සුවිශේෂී ස්ථානයක් හිමි කර ගනී. එය ආබාධ සහිත පුද්ගලයින් අතරින් විශේෂයෙන්ම ආබාධ සහිත තරුණ පරපුරේ ආකර්ශනයට හා ඇගයීමට ලක්ව ඇති අතර එමඟින් ඔවුන්ගේ සුවිශේෂී කලා හා සංස්කෘතික හැකියාවන් වැඩි දියුණු කර ගැනීමට මෙන් සමාජයට එළි දැක්වීමටද හැකියාව ලැබී ඇත.





"සිත් රූ" ජාතික සංස්කෘතික කලා ප්‍රසංගය 2018 - නෙළුම් පොකුණ රඟහල

ආබාධ සහිත පුද්ගලයින් හට ක්‍රීඩාවේ සම අවස්ථා හිමිකරදීම සඳහා ජාතික මලල ක්‍රීඩා උළෙල නියෝජනයට අවස්ථාව සලසාදීමටද, ආබාධිත ප්‍රජාවගේ ස්වශක්ති සංවිධාන බලගැන්වීම සහ විවිධ දක්ෂතා ඇති සාමාජිකයින් ජාතික මට්ටමින් ඇගයීම සඳහා ස්වශක්ති අභිමානී ජාතික සම්මාන ප්‍රදානෝත්සවය සංවිධානය කිරීමටද අප අමාත්‍යාංශය මඟින් සුවිශේෂී ලැදියාවකින් යුතුව කටයුතු කරයි.





ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන මලල ක්‍රීඩා උත්සවය - 2018

මේ අනුව ආබාධ සහිත තැනැත්තන්ගේ සුබසාධනය හා දරිද්‍රතාවය අවම කිරීම සඳහා විවිධ වැඩසටහන් මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කෙරේ. මසකට රු.3000/- බැගින් වූ මාසික ජීවනාධාරයක් ලබා දීම, හදවත්, දණහිස්, උකුල් ඇට හා අක්ෂි ශල්‍යකර්ම, රෝහල්වල නොමැති ඖෂධ ලබා ගැනීම, සායනවලට යාමට සහ ඒමට ගමන් වියදම් යනාදිය සඳහා එක් වරක් පමණක් උපරිම රු.20,000/-ක ආධාර මුදලක් ලබා දීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා ස්වයං රැකියාවක නිරත වීමට රු.25,000/-ක ආධාර මුදලක් ලබා දීම, පාසල් දරුවන් සඳහා පාසල් උපකරණ මිළ දී ගැනීමට රු. 10,000/- ක උපරිමයකට යටත් ආධාරයක් ලබා දීම, මූලය හඳුනා නොගත් වකුගඩු රෝගයට (CKDu) ගොදුරු වූ අඩු ආදායම්ලාභීන් සඳහා මාසිකව රු. 5,000/-ක දීමනාවක් ලබා දීම, වකුගඩු රෝගයෙන් දෙමව්පියන් අහිමි වූ දරුවන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා ආධාරක උපකරණ ලබා දීම, ආබාධ සහිත තැනැත්තන් රැක බලාගන්නා නිවාස/ආයතන සඳහා දිරිගැන්වීමක් ලබා දීම වැනි සුබසාධන වැඩසටහන් රාශියක් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කෙරේ. තවද මත් නිවාරණ හා පුනරුත්ථාපන ව්‍යාපෘතිය මඟින් මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කොට වෘත්තීය පුහුණුව ලබා දීම හා ඔවුන් සමාජගත කිරීමත් මෙම වැඩසටහන් අතර තවත් සුවිශේෂී එකකි. සාර්ථකව පුහුණුව නිම කරන ආබාධ සහිත අභ්‍යාසලාභීන් සඳහා ස්වයං රැකියා මෙවලම් කට්ටල ලබා දීම හා පෞද්ගලික ව්‍යාපාරික ආයතනවල රැකියා අවස්ථා හඳුන්වා දීමත්, වෘත්තීය පුහුණුව සඳහා වැඩිපිරිසක් ඇතුළත් කර ගැනීම සඳහා සියළුම පළාත්වල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමටත් පියවර ගෙන ඇත.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ආබාධිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය වෙත 2018 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය සහ වියදම පහත පරිදි වේ.

| | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි) |
|---|---:|---:|
| ප්‍රාග්ධන | 64.4 | 59.89 |
| පුනරාවර්තන | 2,484.98 | 2,469.13 |
| වෙනත් | 18.7 | 19.66 |




මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් සඳහා මත් නිවාරණ හා පුනරුත්ථාපන වැඩසටහන්

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල මඟින් දෘශ්‍යාබාධිත ප්‍රජාව සඳහා අක්ෂි කාච, සුදු සැරයටි, අධ්‍යාපන ආධාර ලබා දීම හා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන දෘශ්‍යාබාධිත දරුවන් සඳහා ඩේසි රෙකෝඩර් යන්ත්‍ර සහ බ්‍රේල් යන්ත්‍ර ලබා දීමත් සිදුකරනු ලබයි. මේ සියළු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ අමාත්‍යාංශයේ ප්‍රධාන ඉලක්කය වන්නේ ආබාධ සහිත ප්‍රජාවගේ සුබසාධනය හා ඔවුන්ගේ අනාගත සුරක්ෂිතතාවය සහතික කිරීමයි. මේ අනුව අබාධ සහිත පුද්ගලයන් සඳහා වන මහ ලේකම් කාර්යාලය මඟින් ජාත්‍යන්තර සුදු

සැරයටි දිනය 400කගේ සහභාගීත්වයෙන් 2018.10.15 දින බත්තරමුල්ල සුහුරුපාය පරිශ්‍රයේදී පවත්වන ලද අතර ජාතික ආබාධිත දිනය දෙසැම්බර් මස 3 වන දින දෙහිඅත්තකණ්ඩියේදී පවත්වන ලදී.




ජාත්‍යන්තර සුදු සැරයටි දින සැමරුම 2018

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත 2018 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය සහ වියදම පහත පරිදි වේ.

| | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 154.88 | 142.54 |
| පුනරාවර්තන | 552.68 | 521.04 |

වැඩසටහන 2 - වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් වැඩසටහන්

රටේ සමස්ථ ජනගහනයෙන් මිලියන 2.5 ක් පමණ වන වැඩිහිටි පුද්ගලයින්ගේ සුබසාධනය හා අනාගත සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කරමින් එකී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා අමාත්‍යාංශය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් සිටී. ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් වැඩිහිටි සමිති පිහිටුවා එමඟින් වැඩිහිටියන් හුදෙකලාභාවයට පත් වීම අවම කිරීම, වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම, සියළු වැඩිහිටි නිවාස ප්‍රමිතියට අනුව සකස් කරවීමට කටයුතු කරවීම, වැඩිහිටියන් වෙනුවෙන් ජීවනෝපාය මාර්ග ඇති කිරීම මඟින් ඔවුන් යැපුම් මානසිකත්වයෙන් මුදා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම, පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මඟින් දැනුවත්භාවය වර්ධනය කිරීම, වැඩිහිටි අවශ්‍යතා හඳුනා ගැනීම හා ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කිරීම, වැඩිහිටියන්ට අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම, දරුවන්ගේ නොසැළකීම් වලට ලක් වන දෙමාපියන් වෙනුවෙන් සාධාරණය ඉටු කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නඩත්තු මණ්ඩලය ඔස්සේ ගැනීම හා අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙනුවෙන් මාසික දීමනා ලබා දීම වැනි විශාල කාර්යභාරයක් අප විසින් සිදු කරනු ලබයි.

2019 වසරේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වැඩසටහන් අතර වැඩිහිටි නිවාස 256 ක් ප්‍රමිතිගත කිරීම හා ලියාපදිංචි කිරීම, දැනට පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසයන්හි නව ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් වෙනුවෙන් සිදුකර ඇති ඉල්ලීම් අනුව ප්‍රතිපාදන ලබා දීම, වැඩිහිටි නිවාස මූලික කර ගනිමින් සෞඛ්‍ය තත්ත්වය නගාසිටුවීම පාදක කරගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වෛද්‍ය සායන 12,000ක් පැවැත්වීම හා ඉදිරියේදී අක්ෂි කාච හා ශ්‍රවණ උපකරණ 2,000 ක් ලබා දීම, වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන 175 ක් සඳහා ආධාර ලබා දීම, වැඩිහිටියන් තම නිවස තුළම ජීවත්වීම සඳහා

අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීම හා වැඩිහිටියන් සඳහා ව්‍යායාම පුහුණු වැඩසටහන් පැවැත්වීම යනාදී වැඩසටහන් වේ.

ආබාධිත ප්‍රජාවට දෛනිකව මුහුණ දීමට සිදුවන ගැටළු අවම කරගැනීම සඳහා වූ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා ඒවායේ යටිතල පහසුකම් සංවර්ධනයට (ජල පහසුකම්, විදුලිබල පහසුකම්, ජල මෙට්ට, වායු මෙට්ට, සනීපාරක්ෂක හා ප්‍රවේශ පහසුකම්) අවශ්‍ය සෘජු ප්‍රතිපාදන ලබා දී එම ප්‍රජාව සවිබල ගැන්වීම උදෙසා ක්‍රියාකාරී වැඩසටහන් රාශියක්ද සිදු කෙරෙමින් පවතී. මෙ යටතේ ඉදිරි වසරේදී ග්‍රාමීය වැඩිහිටි කමිටු 14,000 ක් සවිබල ගැන්වීම සඳහා කටයුතු කර ඇති අතර ඊට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පවතින ආබාධ සහිත ප්‍රජාවගේ ස්වශක්ති සංවිධාන බලගැන්වීම සහ විවිධ දක්ෂතා ඇති සාමාජිකයින් ජාතික මට්ටමින් ඇගයීම සඳහා ස්වශක්ති අභිමානී ජාතික සම්මාන ප්‍රදානය කිරීමද මෙ යටතේ සිදු කෙරේ. ඒ අනුව ස්වශක්ති අභිමානී ජාතික සම්මාන ප්‍රදානෝත්සවය 2018 වසරේදීත් නෙළුම්පොකුණ රඟහලේදී සාර්ථකව පවත්වන ලදී




ස්වශක්ති අභිමානී ජාතික සම්මාන ප්‍රදානෝත්සවය - 2018 - නෙළුම් පොකුණ රඟහල

මීට අමතරව වැඩිහිටි මහ ලේකම් කාර්යාලය මඟින් ජාත්‍යන්තර වැඩිහිටි දිනය 3000කගේ සහභාගීත්වයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ පවත්වන ලද අතර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ එක්ව ජාතික ස්වේච්ඡා සේවකයන් ඇගයීමට ලක් කරන ලදී.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය වෙත 2018 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය සහ වියදම පහත පරිදි වේ.

| | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 7.00 | 1.58 |
| පුනරාවර්තන | 150.00 | 129.47 |
| වෙනත් (රු.2000/- මාසික දීමනාව) | 10,000.00 | 9,590.03 |

වැඩසටහන 3 - උපදේශන සේවාවන්

පවත්නා සමාජ ආර්ථික පරිසරය හා තාක්ෂණික ලෝකය තුළ මානසික ආතතිය හා පීඩනය යටතේ කටයුතු කරන සමාජයේ සෑම ස්ථරයකම පාහේ විශේෂ උපදේශන අවශ්‍යතා සහිත කණ්ඩායම ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. මෙම කණ්ඩායම් සඳහා ප්‍රමිතිගත උපදේශන සේවාවක් සැපයීම කාලීන අවශ්‍යතාවයක් වන අතර ඒ සඳහා අවශ්‍ය නෛතික රාමුව සකස් කිරීම හා 24 පැය පුරා ක්‍රියාත්මක වන ජංගම දුරකථන උපදේශන සේවාව විධිමත් ක්‍රමවේදයක් සහිතව ප්‍රතිනිර්මාණය කිරීම, උපදේශන සේවාව ප්‍රවර්ධනය සඳහා ප්‍රචාරණ කටයුතු සිදු කිරීම, උපදේශන නිලධාරීන්ගේ නිපුණතාවන් සංවර්ධනය

කිරීම, ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් උපදේශන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම, ප්‍රජාව මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරුවීම වැළැක්වීම සඳහා කණ්ඩායම් උපදේශන වැඩසටහන් පැවැත්වීම, සිත්සරණ උපදේශන මධ්‍යස්ථාන ඉදිකිරීම වැනි වැඩසටහන් රාශියක් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. මේ අතර පසුගිය වසර කිහිපය තුළ විවිධ ව්‍යසනයන්ට ගොදුරු වූ ප්‍රජාව සඳහා උපදේශන සායන හා වැඩසටහන් පැවැත්වීමත්, රාජ්‍ය නිලධාරීන් සඳහා " සුබෝධ්‍යා" උපදේශන වැඩසටහන් පැවැත්වීමත්, තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ විවාහ පූර්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, පාසල් දරුවන් හා ගුරුවරුන් උදෙසා පෞරුෂ සංවර්ධන හා නායකත්ව කුසලතා වැඩසටහන් හා කණ්ඩායම් ක්‍රියාකාරකම් පැවැත්වීමත්, " වෘත්තීය ජීවිතය තුළ මානසික සෞඛ්‍ය" යන මැයෙන් ආයතන ගත නිලධාරීන් දැනුවත් කිරීමත්, මෙම වැඩසටහන් පිළිබඳ ප්‍රචාරයක් ලබා දීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමත් සිදුකර ඇත.

ජාත්‍යන්තර මානසික සෞඛ්‍ය සතියට සමගාමීව උපදේශන ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයන් අතර උපදේශන සේවාව නියාමනය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා මූලිකත්වය ගැනීම හා නව ප්‍රවණතා පිළිබඳ කතිකාවතක් ඇති කිරීමට හැකිවීමද දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් තනි පුද්ගල උපදේශන සේවා සැපයීම තුළින් සේවාලාභීන් මානසිකව සවිබලගැන්වීමට හැකිවීමද අප ලද ජයග්‍රහණයන් වන අතර, මානසික රෝග අවම කිරීමට  මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් 6,547 ක් පවත්වා එමඟින් ප්‍රතිලාභීන් 318,768 ක් දැනුවත් කිරීමට හැකිවීමද අපගේ අනිකුත් ජයග්‍රහණයන් අතර වේ. එමෙන්ම උපදේශන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කර සේවාලාභීන් සඳහා ගුණාත්මක උපදේශන සේවා සැපයීම උදෙසා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය කිරීමට හැකිවීමද, උපදේශන විෂය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ප්‍රවර්ධනය කිරීමට හැකිවීමද මේ වන විට මෙම අමාත්‍යාංශය මඟින් අත්කර ගත් වෙනත් සමාජ ආර්ථික ප්‍රතිලාභයන් වේ.

උක්ත වැඩසටහන් සඳහා උපදේශන අංශය වෙත 2018 වර්ෂයේ රු.මි.25 ක ප්‍රතිපාදන වෙන් වූ අතර 2018.12.31 වන විට වියදම රු.මි.14.488 ක් වේ.

මීට අමතරව ප්‍රාථමික කර්මාන්ත ප්‍රතිපත්තිය එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල (UNFPA) හරහා සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර මෙම සියළු වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ඔස්සේ අප අමාත්‍යාංශයේ අවසන් පරමාර්ථය වන අපනයනයෙන් සුරක්ෂිත හෙටක් රටට නිර්මාණය කර දීමත්, විශේෂ අවශ්‍යතා සහිත ජන කොටස් හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා සුරක්ෂිත අනාගතයක් නිර්මාණය කර දීමත් යන අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීමට හැකිවනු ඇති බව අපගේ ඒකායන විශ්වාසයයි.

07

# අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව



# අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## 7.1 හැඳින්වීම

ඈත අතීතයේ සිටම ශ්‍රී ලංකාව කුළු බඩු සම්බන්ධයෙන් කීර්තියක් අත්කරගෙන තිබුණ ද, එම කර්මාන්තයට ජාතික මට්ටමෙන් අවධානය යොමු කරන ලද්දේ 1971 ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය තුලිනි. ඉන් පසුව 1972 අමාත්‍ය මණ්ඩල සංදේශයකට අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධව සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබීය. 1975 දී දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට පත් කරන ලදි. ඒ දක්වා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වූ ආන්තික තේ ඉඩම්වල කුළුබඩු බෝග වගා කිරීමේ කටයුත්ත වෙනුවට ලෝක ආහාර සංවිධානය (WFP) හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් අරඹන ලද බෝග විවිධාංගීකරණ සංවර්ධන ව්‍යාපෘතිවල කාර්යභාරයෙන් කොටසක් දෙපාර්තමේන්තුව වෙත පැවරීමත් සමඟම අපනයනය පාදක කර ගත් කුළු බඩු හා ආශ්‍රිත බෝග සංවර්ධනයේ නියමුවා බවට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පත් විය.

1992 අංක 46 දරණ පාර්ලිමේන්තු පනත මඟින් දෙපාර්තමේන්තුවෙහි එවකට පැවති නාමය වෙනස් කොට එය "අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" වශයෙන් නම් කරන ලද අතර එමගින් කුළුබඩු මෙන්ම සෙසු කෘෂිකර්ම නිෂ්පාදන අපනයනයට අදාල නෛතික බලතල ද පැවරිණ. එතැන් පටන් ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සියල්ලක්ම මෙම දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවනු ලබයි.

ඒ අනුව කුළුබඩු ක්ෂේත්‍රයට ප්‍රවීනයන් වෙමින් එම ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු හා ව්‍යාප්තිය දිවයින පුරා ජාලයක් ස්ථාපිත කරමින් ක්ෂේත්‍රයේ අදාළ පාර්ශවකරුවන්ට පහසුකම් සලසා දීම දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබයි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලික අවධානය අපනයන ඉලක්ක කර ගත් පහත බෝග කාණ්ඩ සඳහා යොමු කර ඇත. කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි, සාදික්කා, එනසාල් ඉඟුරු හා කහ කුළුබඩු බෝග ලෙස ද කෝපි, කොකෝවා, වැනිලා පානීය බෝග ලෙස ද බුලත් සහ පුවක් උත්තේජක බෝග ලෙසද දෙපාර්තමේන්තුවේ අවධානය යොමුව ඇත. ඒ සඳහා අත්‍යාවශ්‍ය වන තාක්ෂණික දැනුම, නව නිපැයුම් හා ඉහළ අස්වැන්නක් ලබා දෙන ප්‍රභේද හඳුන්වා දීම ප්‍රධානතම වගකීම වන අතර අපනයන කෘෂි භෝග ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා පර්යේෂණ සංවර්ධන කටයුතු හා ව්‍යාප්ති සේවා සැපයීම අඛණ්ඩව සිදු කරනු ලබයි.

## 7.2 දැක්ම

කුළුබඩු හා නිෂ්පාදන අපනයනයෙන් විශිෂ්ඨත්වය

## 7.3 මෙහෙවර

වැඩි විදේශ විනිමයක් ඉපයීමත්, අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නිරත සියළු පාර්ශවකරුවන්ගේ තිරසාර ආර්ථික හා සමාජීය සංවර්ධනයත් පෙරදැරි කර ගනිමින්, පරිසරය සුරකෙන අයුරින් අපනයන කෘෂි බෝග නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක

ප්‍රවර්ධනයක් ඇති කිරිමට අවශ්‍ය වන්නා වූ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරිම හා ක්‍රියාත්මක කිරිම.

## 7.4 අරමුණු

අපනයන පරිමාව ඉහළ නංවා නිෂ්පාදිතයන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරිම මගින් වැඩි විනිමය ආදායමක් ලබා ගත හැකි වන පරිදි අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රය සංවර්ධනය කිරිම.

## 7.5 උපාය මාර්ග

1. කාබනික වගා දිරිගැන්වීම තුළින් ලෝක වෙලඳපලේ කාබනික බෝග සඳහා පවතින වෙළඳපල
   තවදුරටත් ඉහළ දැමීමට පියවර ගැනිම.
2. ඵලදායිතාවයෙන් ඉහළ නව බෝග ප්‍රභේද ක්ෂේත්‍රයට හඳුන්වා දීම තුළින් අස්වැන්න ඉහළ දැමීමට
   පියවර ගැනීම.
3. අහිතකර කෘමි හා රෝග පාලනය තුළින් වගා ඵලදායිතාව ඉහළ නැංවීමට පර්යේෂණ ක්‍රියාත්මක
   කිරිම.
4. ක්ෂේත්‍රය තුළ අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වා දීමට හා එම නිෂ්පාදන දිරිගැන්වීමට පියවර
   ගැනීම.
5. අපනයන කෘෂි බෝග වගාව රට තුළ තවදුරටත් ප්‍රචලිත කිරිම සඳහා නව ප්‍රවේශ භාවිතා කිරිම.

## 7.6 2018 වර්ෂය තුළ අත්කරගත් නිමැවුම් (2018.01.01 – 2018.12.31 දක්වා)

### 7.6.1. සංවර්ධන වැඩසටහන

| ව්‍යපෘතිය | වැඩසටහන | නිමවුම |
|---|---|---|
| 1 .අපනයන බෝග සංවර්ධන වැඩසටහන | 1.1.අභ්‍යන්තර පැළ තවාන් සංවර්ධනය | 1.1.1.2018 වාර්ෂික අපනයන කෘෂි බෝග පැළ නිෂ්පාදනය පැළ මිලියන 31 කි. |
| | | 1.1.2.වාර්ෂික පැළ නිෂ්පාදන ධාරිතාව ඉහළ යෑම. මධ්‍යම පැළ තවාන් 3ක කාර්යක්ෂම ජල සැපයුමක් ස්ථාපිත වීම. පැළ තවාන් ජල අවශ්‍යතාවය සහතික වීම. |
| | 1.2. නව වගා වැඩසටහන | 1.3.1. කුරුඳු, ගම්මිරිස්, පැඟිරි,කෝපි හෙක්ටයාර් 1,016.98 ක අළුතින් වගා බිම් ඇති වීම. |
| | | 1.3.2. සාදික්කා, කරාබු, කොකෝවා, එනසාල් හෙක්ටයාර් |

| | | |
|---|---|---|
| | | 52.8 ක අළුතින් වගා බිම් ඇති වීම. |
| | | 1.3.3. පුවක් පැළ 328,252 ක අළුතින් වගා බිම් ඇති වීම. |
| 2. ඵලදායිතා සංවර්ධන වැඩසටහන | 2.1. ධනසවිය ගෙවතු වගා වැඩසටහන | 2.1.1. ගෙවතු 123,486 ක අපනයන බෝග පැළ 11,820,069 ක් වගා කිරිම. |
| | 2.2. පවතින අපනයන බෝග වගාවන්හි ඵලදායිතාවය ඉහළ නැංවීම | 2.2.1. හෙක්ටයාර් 376.2 ක වගාවන්හි පාළු සිටුවීම මඟින් අපනයන වගා භූමි වල ඵලදාව උපරිම වීම. |
| | 2.3. ජල කළමණාකරණ පද්ධති ස්ථාපිත කිරිම | 2.3.1. කාර්යක්ෂම ජල කළමණාකරන ආදර්ශ ව්‍යාපෘති 25ක් ස්ථාපිත වීම. |
| | 2.4. ගොවි සායන පැවැත්වීම | 2.4.1. දිස්ත්‍රික්ක 15ක අපනයන බෝග වගා කළමණාකරනය පිළිබඳ ගොවි ප්‍රජාව දැනුවත් වීම. |
| 3. අපනයන කෘෂි බෝග නිෂ්පාදන සඳහා අගය එකතු කිරිමේ වැඩසටහන | 3.1.අපනයන කෘෂි බෝග සාමාන්‍ය වගා භූමි කාබනික වගා භූමි බවට පරිවර්තනය කිරිම. ආයෝජන අධාර ලබා දීම. | 3.1.1. හෙක්ටයාර් 346.6 ක වපසරිය කාබනික අපනයන බෝග වගාවට පරිවර්තනය කිරිම. |
| | 3. කාබනික අපනයන බෝග වගා ගම්මාන ප්‍රචලිත කිරිම | 3.2.1. කාබනික බෝග වගාව සිදුකරන ප්‍රජා මුල සංවිධාන 29 ක් ස්ථාපිත විම.<br>3.2.2. කාබනික ගම්මාන 08 ක් සඳහා අන්තර්ජාතික කාබනික සහතික ලබා දිම.<br>3.2.3. කාබනික බෝග නිෂ්පාදන සඳහා වෙළදපළ සම්බන්ධිකරණය සිදුකිරිම. |
| | 3.3. පුහුණු වැඩසටහන් | 3.3.1. කාබනික බෝග වගාව පිළිබඳ ජනතාව අතර පෙළඹවීමක් ඇති කිරිම. |
| | 3.4.උචිත තාක්ෂණය යොදා ගනිමින් අපනයන කෘෂි බෝග නිෂ්පාදන වල ගුණාත්මය දියුණු කිරිම. | 3.4.1. සුදුසු තාක්ෂණ භාවිතයෙන් උපරිම අස්වැන්නක් ලබා ගැනිම සහ උසස් ප්‍රමිතියෙන් යුතු අපනයන බෝග නිෂ්පාදන ඇති වීම. ( සැකසුම් මධ්‍යස්ථාන 27ක් සහ අපනයන බෝග නිෂ්පාදන සකස් කිරිමේ යන්ත්‍ර 25ක් ) |
| | 3.5 .අපනයන බෝග වගාවට යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ නිෂ්පාදන ක්‍රියාවලියට යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP ) හඳුන්වාදීමේ වැඩසටහන | 3.5. 1.යහපත් කෘෂිකාර්මික පුරුදු හා යහපත් නිෂ්පාදන පුරුදු (පාර්ශවකරුවන් අතර) ස්ථාපිත විම. උසස් ප්‍රමිතියෙන් යුතු හා පරිසර හිතකාමි කෘෂිකාර්මික ක්‍රමයන් ස්ථාපිත වීම. ඒ තුළින් උසස් ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක |

| | | |
|---|---|---|
| | | අපනයන නිෂ්පාදන අපනයන වෙළඳපළට යොමු කිරීම. |
| 4. දැනුවත් කිරීම් හා සංවර්ධන වැඩසටහන් | 4.1. කුළුබඩු උද්‍යාන ප්‍රවර්ධන වැඩසටහන<br>4.2. මාධ්‍ය වැඩසටහන | දෙස් විදෙස් සංචාරකයින්ට සහ ක්ෂේත්‍රය ගැන උනන්දුවන්නන්ට ප්‍රායෝගික දැනුමක් කාර්යක්ෂමව ලබාගැනීමට හැකි වීම. |
| 5. පුහුණු වැඩසටහන් | 5.1 ගොවි පුහුණු වැඩසටහන්<br><br>5.2 සේවා සංස්කරණ පුහුණු ආයතනය - මාතලේ | ගොවින්ගේ සහ සියලු පාර්ශවකරුවන්ගේ දැනුම සහ ධාරිතා සංවර්ධනය තුළින් කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් වැඩිකිරීම. |

## 7.6.2 පර්යේෂණ වැඩසටහන

| ව්‍යපෘතිය | වැඩසටහන | නිමවුම |
|---|---|---|
| 1.පර්යේෂණ මධ්‍යස්ථාන හා ඒ ආශ්‍රිත ආයතන වල යටිතල පහසුකම් සංවර්ධනය හා උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම | 1.1 ගොඩනැගිලි අළුත්වැඩියාව හා ඉදිකිරීම<br>1.2 උපකරණ මිලදීගැනීම හා අළුත්වැඩියාව (කාර්යාලීය උපකරණ හා රසායනාගාර උපකරණ)<br>1.3 වාහන අළුත්වැඩියාව | පර්යේෂණ කටයුතුවලට අදාල යටිතල පහසුකම් අවශ්‍යතා සම්පූර්ණ වීම. |
| 2.කාර්ය මණ්ඩල පුහුණු කිරීම | 2.1 කාලීන දැනුම අවශ්‍යතා අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම | කාර්ය මණ්ඩලයේ කුසලතා සංවර්ධනය කිරීම |
| 3. අපනයන කෘෂි බෝගවලට අදාල පර්යේෂණ සිදුකිරීම | 3.1. අපනයන කෘෂි බෝගවල වපසරිය වැඩිකිරීම සඳහා පර්යේෂණ 07 ක් පවත්වා ගෙන යාම (දේශගුණික කාලගුණික විපර්යාස සඳහා ඔරොත්තුදෙන අපනයන කෘෂි බෝග ප්‍රභේද හඳුනාගැනීම)<br><br>3.2. රෝග හා පළිබෝධ මර්ධනය කිරීමේ පර්යේෂණ 25 ක් පවත්වාගෙන යාම<br><br>3.3. නිෂ්පාදන වියදම අඩුකිරීමේ පර්යේෂණ 09 ක් | 1. අපනයන කෘෂි බෝග වගාකිරීමේ වපසරිය ඉහළ යාම<br><br>2. අපනයන කෘෂි බෝග වල රෝග හා පළිබෝධ පාලනය<br><br>3. අපනයන බෝග වගාකිරීම සඳහා වැයවන නිෂ්පාදන වියදම |

| | | |
|---|---|---|
| | පවත්වාගෙන යාම | අඩුවීම හා ඵලදායීතාව ඉහලයාම |
| | 3.4. අපනයන බෝගවල අගය වැඩිකල නිෂ්පාදන පිළිබඳ පර්යේෂණ 15 ක් පවත්වාගෙන යාම | 4. අපනයන බෝගවල අගය වැඩිකළ නිෂ්පාදන එකතුවීම |
| | 3.5. අපනයන කෘෂිබෝග වල නිෂ්පාදනය වැඩිකිරීමේ පර්යේෂණ 62 ක් පවත්වාගෙන යාම | 5. අපනයන කෘෂි බෝගවල නිෂ්පාදන ධාරිතාවය වැඩිවීම |
| | 3.6. අපනයන කෘෂිබෝග වල ගුණාත්මය වැඩිකිරීමේ පර්යේෂණ 20 ක් පවත්වාගෙන යාම | 6. අපනයන කෘෂිබෝගවල ගුණාත්මය වැඩිවීම |
| | 3.7. අපනයන කෘෂිබෝග වල සමාජ ආර්ථික හා වෙළඳපළ පිළිබඳ පර්යේෂණ 02 ක් පවත්වාගෙන යාම | 7. අපනයන කෘෂිබෝග වෙළඳපල හැසිරීම පිළිබඳ තොරතුරු සමාජගත කිරීම |
| | 3.8.. විභවයක් සහිත නව බෝග 34 ක් පිළිබඳ පර්යේෂණ පවත්වාගෙන යාම | 8. ප්‍රධාන අපනයන කෘෂි බෝග වලට අමතරව නව විභවයක් සහිත අපනයන බෝග කෘෂි වගා ක්ෂේත්‍රයට එකතුවීම |

## 7.7 අපේක්ෂිත සමාජ ආර්ථික ප්‍රතිඵලය

- අපනයන බෝග වගාව හා සම්බන්ධ වූ වගා කරුවන්ගේ සෘජු හා වක්‍ර ව්‍යවසායකයින්ගේ හා ගෘහ ඒකක වල ආදායම ඉහළ යාම . ඒ මගින් ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ යාම හා සාර්ව ආර්ථික ප්‍රතිඵල ජනනය වීම. (ආදායම් විෂමතා අවම වීම ප්‍රාදේශීය විෂමතා අවම වීම, සේවා නියුක්තිය ඉහළ යාම යනාදි වශයෙන්)
- අපනයන ආදායම ඉහළ යාම හේතුවෙන් දේශිය ආර්ථිකය ශක්තිමත් වීම. ( ජාතික ආදායම ඉහළ යාම, වෙළඳ පරතරය අඩු වීම)
- අන්තර් ජාතික වෙළඳාම තුළ ශ්‍රී ලංකාවේ වෙළඳපල කොටස වර්ධනය වීම.
- ආහාර සුරක්ෂිතතාව රට තුළ සහතික වීම.

## 7.8 අනුමත වාර්ෂික අයවැය - 2018

| ප්‍රාග්ධන (රු.මි) | පුනරාවර්තන (රු.මි) |
|---|---|
| 555.5 | 623.965 |

## 7.9 2018.01.01 සිට 2018.12.31 දක්වා වියදම

| මූලාශ්‍ර ප්‍රභවය | ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 555.5 | 488.194 |
| පුනරාවර්ථන | 623.965 | 621.415 |
| එකතුව | 1179.465 | 1109.609 |

## 7.10 ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑ අභියෝග

- වෙළඳ ගිවිසුම් සංශෝධනය .
- ප්‍රතිපාදන සීමිත වීම.
- ලෝක වෙළඳපොළ ඉල්ලුම, සැපයුම මිල වෙනස් වීම.
- අනපේක්ෂිත අයහපත් දේශගුණික විපර්යාස.
- අළුතින් හඳුන්වාදුන් වැඩසටහන් සඳහා විශේෂයෙන්ම කාබනික වගා වැඩසටහන සහ ප්‍රමිති සහතික ලබාදීමේ වැඩසටහන් වලට ගොවීන් නැඹුරු කර ගැනිම සඳහා වැඩි කාලයක් ගත වීම.

## 7.11 ලබාගත් සමස්ථ ජයග්‍රහණ

- ඇස්තමේන්තුගත අපනයන කෘෂි බෝග වපසරිය - හෙක්ටයාර් 119,814
- අපනයන පරිමාව – මෙ.ටො. 60,000
- අපනයන ඉපැයුම් – රු.මිලි. 71,970
- අපනයන කෘෂි ආදායම සඳහා දායකත්වය - 12.2%
- දළ දේශීය නිෂ්පාදිතය සඳහා දායකත්වය - 0.3%
- සම්බන්ධිත පවුල් සංඛ්‍යාව –රු. මිලි. 0.9

## 7.12 2018.01.01 සිට 2018.12.31 දක්වා ක්‍රියාත්මක කළ සංවර්ධන හා පර්යේෂණ වැඩසටහන්වල තොරතුරු

### 7.12.1 සංවර්ධන වැඩසටහන

| වැඩසටහන - අංක 01 | බෝග සංවර්ධන වැඩසටහන |
|---|---|
| ස්ථාන | බදුල්ල, කොළඹ, කළුතර, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, නුවර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, රත්නපුර, අම්පාර, පොළොන්නරුව සහ අනුරාධපුර |
| ඉලක්කගත කණ්ඩායම | අපනයන බෝග වගා කරන්නන් |
| ආරම්භ කළ දිනය | 2018.01.01 |
| ප්‍රතිඵල | අපනයන රෝපණ ද්‍රව්‍ය උසස් ප්‍රමිතියෙන් යුතුව ගොවීන්ට සැපයීමට හැකිවීම, අපනයන කෘෂි බෝග වගාව ප්‍රචලිත විම, සුළු අපනයන බෝග අපනයන ආදායම ඉහළ යෑම, අපනයන බෝග වගාකරුවන්ගේ ඒක පුද්ගල ආදායම ඉහළ යෑම. |

| වැඩසටහන - අංක 02 | ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන |
|---|---|
| ස්ථාන | බදුල්ල, කොළඹ, කළුතර, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, නුවර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, රත්නපුර, අම්පාර, පොළොන්නරුව සහ අනුරාධපුර |
| ඉලක්කගත කණ්ඩායම | අපනයන බෝග වගා කරන්නන් |
| ආරම්භ කළ දිනය | 2018.01.01 |
| ප්‍රතිඵල | අපනයන බෝග වගා ඉඩම් වල ඵලදායිතාවය ඉහළ යාම, ගෘහ ඒකක වල අපනයන බෝග අවශ්‍යතා සඳහා වන වියදම් පහළ යෑම, ගෘහ ආදායම ඉහල යෑම, කාන්තාවන් සවිබලගැන්වීම. |

| වැඩසටහන - අංක 03 | අපනයන කෘෂි බෝග නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ වැඩසටහන |
|---|---|
| ස්ථාන | බදුල්ල, කොළඹ, කළුතර, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, නුවර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, රත්නපුර, අම්පාර, පොළොන්නරුව සහ අනුරාධපුර |
| ඉලක්කගත කණ්ඩායම | අපනයන බෝග වගා කරන්නන් හා අපනයන බෝග ආශ්‍රිත නිෂ්පාදකයින් |
| ආරම්භ කළ දිනය | 2018.01.01 |
| ප්‍රතිඵල | කාබනික අපනයන බෝග සඳහා පවතින ඉහළ යන ඉල්ලුමට ගැලපෙන අයුරින් වෙළඳපොළ වාසි ලබා ගැනීම, රසායනික පොහොර හා කෘෂිරසායන භාවිතය අවම වීම තුලින් පරිසර හානිය අවම කර ගත හැකිවීම, අස්වනු සැකසීමේදී නවීන තාක්ෂණ භාවිතය තුළින් අස්වැන්නෙහි උපරිම ආර්ථික වාසි ලබාගැනීමට හැකිවීම. |

| වැඩසටහන - අංක 04 | දැනුවත් කිරීම් හා මාධ්‍ය වැඩසටහන් |
|---|---|
| ස්ථාන | දිස්ත්‍රික්ක 24 |
| ඉලක්කගත කණ්ඩායම | අපනයන බෝග වගා කරන්නන් |
| ආරම්භ කළ දිනය | 2018.01.01 |
| ප්‍රතිඵල | දේශිය හා විදේශිය අපනයන වෙළඳපළ පුළුල් වීම, අපනයන බෝග වගාව සඳහා ගොවීන්ගේ නැම්යාව ඉහළ යෑම සහ අපනයන ආදායම ඉහළ යාම. |

| වැඩසටහන - අංක 05 | පුහුණු වැඩසටහන් |
|---|---|
| ස්ථාන | දිස්ත්‍රික්ක 24 |
| ඉලක්කගත කණ්ඩායම | අපනයන බෝග වගා කරන්නන් |
| ආරම්භ කළ දිනය | 2018.01.01 |
| ප්‍රතිඵල | ගොවීන්ගේ සහ සියලු පාර්ශවකරුවන්ගේ දැනුම සහ ධාරිතා සංවර්ධනය තුළින් කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් ඇතිවීම. |

## 7.12.2 පර්යේෂණ වැඩසටහන

| වැඩසටහන - අංක 01 | පර්යේෂණ මධ්‍යස්ථාන හා ඒ ආශ්‍රිත ආයතන වල යටිතල පහසුකම් සංවර්ධනය හා උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම |
|---|---|
| ස්ථාන | බදුල්ල, කොළඹ, කළුතර, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, නුවර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, රත්නපුර, අම්පාර, පොළොන්නරුව සහ අනුරාධපුර |
| ඉලක්කගත කණ්ඩායම | පර්යේෂණ කටයුතු වල නියැලී සිටින හා ඒ ආශ්‍රිත කාර්යය මණ්ඩලය |
| ආරම්භ කළ දිනය | 2018.01.01 |
| ප්‍රතිඵල | පර්යේෂණ කටයුතුවල ඵලදායීතාවය හා කාර්යක්ෂමතාව ඉහල යාම |

| වැඩසටහන - අංක 02 | කාර්යය මණ්ඩල පුහුණු කිරීම |
|---|---|
| ස්ථාන | බදුල්ල, කොළඹ, කළුතර, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, නුවර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, රත්නපුර, අම්පාර, පොළොන්නරුව සහ අනුරාධපුර |
| ඉලක්කගත කණ්ඩායම | පර්යේෂණ කටයුතු වල නියැලී සිටින හා ඒ ආශ්‍රිත කාර්යය මණ්ඩලය |
| ආරම්භ කළ දිනය | 2018.01.01 |
| ප්‍රතිඵල | කාර්යය මණ්ඩලයේ කුසලතා සංවර්ධනය කිරීම |

| වැඩසටහන - අංක 03 | අපනයන කෘෂි බෝග වගාවට අදාල පර්යේෂණ සිදුකිරීම |
|---|---|
| ස්ථාන | බදුල්ල, කොළඹ, කළුතර, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, නුවර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, රත්නපුර, අම්පාර, පොළොන්නරුව සහ අනුරාධපුර |
| ඉලක්කගත කණ්ඩායම | _ |
| ආරම්භ කළ දිනය | 2018.01.01 |
| ප්‍රතිඵල | අපනයන බෝග වගා කිරිමේ නැඹුරුව ඉහළ යාම, දේශගුණික හා කාලගුණික විපර්යාස වලට සමගාමීව අපනයන බෝග වගාව අඛණ්ඩව සිදු වීම, අපනයන බෝග වගා ඉඩම් වල ඵලදායිතාව ඉහළ යාම , කෘමි උවදුරු හා රෝග වලට සාර්ථකව මුහුණ දීමට හැකියාව ඇති වීම, අපනයන බෝග වගා අස්වැන්න ඉහල යාම, අගය එකතු කළ අපනයන බෝග සදහා ඉහළ ඉල්ලුම හා වෙළඳපල කොටස වැඩි වීම සහ අපනයන බෝග විවිධාංගීකරණය. 2021 දී අපනයන ආදායම ඩොලර් මිලියන 1000 ක ඉලක්කය කරා ලගාවීම. |

08

# කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය

# කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය

## අගයදාම සංවර්ධන වැඩසටහන

කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතියේ අගයදාම සංවර්ධන වැඩසටහන ලෝක බැංකු අරමුදල් යටතේ ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය මඟින් ක්‍රියාවට නැංවෙන අතර වාණිජ හා අපනයනය පාදක කරගත් කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා අගයදාම සංවර්ධනය හා අගය එකතු කිරීම අරමුණු කර ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානතම අරමුණු අතර කෘෂිකාර්මික ඵලදායිත්වය වර්ධනය කිරීමට සහායවීම, වෙළඳපල අවස්ථා වර්ධනය කිරීම හා ව්‍යාපෘති ප්‍රදේශවල සුළු පර්මාණ ගොවීන්ගේ සහ කෘෂි ව්‍යාපාරවල අගය එකතු කිරීම වර්ධනය කිරීම වන අතර උපාය මාර්ගික අරමුණු ඉහළ අගයන් එකතු කළ නිෂ්පාදන සහ වඩා හොඳ වෙළඳපල සබඳතා සඳහා අගයදාම සංවර්ධනය කිරීම සහ ආදායම් ඉපයීම වේ. දැනට ක්‍රියාත්මක හා අභිනවයෙන් පිහිටුවනු ලැබූ කෘෂි නිෂ්පාදන සංවිධානය හා කෘෂි ව්‍යාපාර වලට සහාය දැක්වීමට අපේක්ෂා කෙරේ. පස් වසරක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලය තුල විවෘත යෝජනා කැඳවීම මඟින් දේශීයව හඳුනාගෙන ඇති උප ව්‍යාපෘති සඳහා සුදුසු ප්‍රදානයන් වලින් මූල්‍ය පහසුකම් ලබා දීමට සැලසුම් කර ඇත.

නවීකරණයට අත්වැලක් සපයමින් රාජ්‍ය හා පෞද්ගලික සහයෝගීතා පාදක කර ගනිමින් කෘෂිකාර්මික අගයදාම සංවර්ධන සංකල්පය මත ව්‍යාපෘති සැලැස්ම සකස් කර ඇත.  සමස්ත කෘෂිකාර්මික අගයදාම වලට සහාය දැක්වීමේ ප්‍රවේශය ගොවියාගේ සිට දේශීය හෝ ජාත්‍යන්තර පාරිභෝගිකයා දක්වා අගයදාමය ඔස්සේ අගය එකතු තිරීම මඟින් කෘෂිකාර්මික අංශ වර්ධනය කිරීමේ සාර්ථක සංවර්ධන මෙවලමකි. මෙම සිරස් සහ සමන්ධය හුදකලාව පැවතිය නොහැකි බවට ව්‍යාපෘතියේ අවධානය යොමු වී ඇති අතර වාණිජ හා අපනයන පාදක කරගත් කෘෂි ව්‍යාපාරය හා වටිනාකම් එකතු කිරීම ප්‍රවර්ධනය කිරීමේ අදහසින් ජාලයේ තිරස් සම්බන්ධක අංග සැලකිල්ලට ලක් කර ඇත.

ව්‍යාපෘතියේ මුළු වටිනාකම රු. බිලියන 16 කි. එයින් රුපියල් බිලියන 9 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය හා ලෝක බැංකුව විසින් ලබා දෙනු ලබයි.

2017 දී සිදු කළ ප්‍රථම යෝජනා ඉල්ලීම සඳහා ව්‍යාපාරික සංකල්ප පත්‍රිකා 1262 ක් ලැබුණි. ඉන් 502 ක් තෝරා ගත් අතර එයින් 84 දෙනෙකු, ජලජීවි පර්ෂද වැඩසටහන්  හා වගා මූලික කර්මාන්ත වලට  සම්බන්ධිත පුද්ගලයන් ඇතුළුව ප්‍රදාන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ඇත. සංකල්ප පත්‍රිකා දෙවන වර විවෘත කිරීම 2018 දී සිදු වූ අතර, ඉදිරිපත් වූ මුළු පිරිස වන 287 කි. ඔවුන් අතරින් 140 දෙනෙකු වෙනත් අවශ්‍යතා සැපිරීම මත හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ප්‍රදාන ලබා ගැනීමට සුදුස්සන් ලෙස හඳුනා ගෙන ඇත.  ආශ්‍රිත උප ක්ෂේත්‍ර වල නිරත ව්‍යාපාරික ස්ථාන වල ඇති සමානතා හා සමජාතිත්ව ස්වභාවය හේතුකොටගෙන, ඉස්සන් හා විසිතුරු මාළු බෝකරන ව්‍යවසායකයන් සඳහා රු. බිලියන 100 කට අධික සමස්ත ඇස්තමේන්තුගත ආයෝජන ක්‍රියාත්මක කිරීම සඳහා ද ව්‍යාපෘති 790 ක් හඳුනාගෙන ඇත.

අවශ්‍ය පූර්ව කොන්දේසි සැපිරීමෙන් අනතුරුව යෝජකයන් 81 දෙනෙකු ප්‍රදාන ගිවිසුම්වලට ඇතුළත් විය. ප්‍රදාන වල ප්‍රථම වාරික කොටස යෝජකයන් 16 දෙනෙකුට ලබා දුන් අතර 2018 දෙසැම්බර් 31 වන විට තවත් යෝජකයන් 5 දෙනෙකුට දෙවන වාරිකය ලබා ගත්හ.

2018 වසර තුළ යෝජකයන් 81 දෙනෙකුට මාසිකව ප්‍රදාන ලබා දුන් අතර ඒ තුල ජුනි මස රු. මිලියන 11 කුත් ජුලි මස රු. මිලියන 4.5 කුත් අගෝස්තු මස රු. මිලියන 18.7 කුත් සැප්තැම්බර් මස රු.මි.17.5 කුත්, ඔක්තෝම්බර් මස රු. මිලියන 57.2 කුත් නොවැම්බර් මස රු. මිලියන 76.6 කුත් හා දෙසැම්බර් මස රු. මිලියන 161.1 ක ලෙස ලබා දුන් මුදල් ප්‍රදාන අඩංගු විය.

සමස්තයක් ලෙස 2018 වසර තුළ රු. මිලියන 244.6 මුළු මුදලක් මුදා හැර ඇති අතර, රාශිභූත වියදම රු. මිලියන 697 ක් පමණ විය. ඒ අනුව, 2018 තුළ ආසන්න වශයෙන් 34% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගත් අතර ආරම්භයේ සිට සමස්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද කාලය තුල 36% ක රාශිභූතවීමක් සිදු කර ඇත.

මෙම ප්‍රදාන භාවිතා කිරීම තුලින් තම ව්‍යාපාර නවීකරණයට ලක් කිරීමට හා වැඩිදියුණු කිරීමට වඩා වැඩි ඉඩ හසරක් ලැබීමටත්, කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් විදේශීය විනිමය ඉපයීම් වර්ධනය කිරීමටත් කෘෂිකාර්මික අගයදාම තුළ සමාජ බලපෑම වර්ධනය කරන අතරතුර ඊට දායක වෙමින් රටේ සමස්ත ආර්ථික වර්ධනයක් ඇති කිරීමට මෙම ප්‍රදාන ලැබූ පුද්ගලයින්ට වඩාත් හොඳ අවස්ථාවන් ලැබී ඇතැයි අපේක්ෂා කෙරේ.

09

# සමාජ සේවා දෙපාර්තමේන්තුව

# සමාජ සේවා දෙපාර්තමේන්තුව

## 9.1 හැඳින්වීම

ශ්‍රීමත් අයිවර් ජෙනිංන්ස් මහතාගේ මූලිකත්වයෙන් 1944 වර්ෂයේ පත්කරන ලද සමාජ සේවා කොමිෂන් සභාවේ නිර්දේශ මත 1948 පෙබරවාරි 01 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද අතර වත්මනෙහි සමාජ සේවා විෂයභාර අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කරනු ලබයි.

දෙපාර්තමේන්තු මෙහෙයට අනුගත වෙමින් 2018 වර්ෂයට ලැබී ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හඳුනාගත් විවිධ වැඩසටහන් සැලසුම් සහගතව බිම් මට්ටමේ සිට ජාතික තලය දක්වා ක්‍රියාත්මක කොට ඇත. විශේෂයෙන් ආබාධ සහිත තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද සුබසාධන වැඩසටහන් තුළ සාර්ථක ප්‍රගතියක් අත්කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත. ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම, සමාජගත කිරීම හරහා ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන තුළ ඉතා සාර්ථක ප්‍රගතියක් ලබා ගැනීමට මෙම වර්ෂයේ හැකි විය.

ආබාධිත ප්‍රජාව සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසහටන (CBR) මගින් 96.06 % ක ප්‍රගතියක් අත්කර ගැනීමට 2018 වර්ෂයේ හැකිවිය. විධිමත් ක්‍රමවේදයන් අනුව සැලසුම් සහගතව දිස්ත්‍රික් හා කොට්ඨාශ මට්ටමින් ආබාධිත ප්‍රජාව සඳහා අවශ්‍ය සේවා ලබාදීමට මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සියළුම ක්ෂේත්‍ර නිලධාරින් සෘජුවම සම්බන්ධ වී සංවිධානාත්මකව සැලසුම් සහගතව ඇප කැප වී කටයුතු කිරීම මෙම වැඩසටහනේ විශේෂත්වයයි. මෙම වැඩසටහනේ කොටසක් ලෙස ක්‍රියාත්මක වන රෝහල් පද්ධතිය සම්බන්ධ ආබාධිත ප්‍රජාව සඳහා කරන ලද වැඩසහටන් තුළ සාර්ථක ප්‍රගතියක් අත්කරගෙන ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. දෙපාර්තමේන්තු කාර්ය සාධනයට ඇතුළත් නොවන විශාල වැඩ කොටසක් බිම්මට්ටමේ සිටින සියළුම ක්ෂේත්‍ර නිලධාරින් ඉටුකරන බව අභිමානයෙන් යුතුව මෙහිදී සඳහන් කළ යුතුය.

ආබාධ සහිත ප්‍රජාව සඳහා 2018 වර්ෂයේ සැලසුම් කරන ලද ජාතික මට්ටමේ වැඩසටහන් හතරක් ඉතා සර්ථකව පැවැත්වීමට හැකිවිය. මෙම වැඩසටහන් තුළින් අභ්‍යාසලාභීන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩලය, දෙමාපියන් හා සෙසු සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය අවබෝධය, සුහදතාව හා විශ්වසනීයත්වය ඇති කිරිම අපේක්ෂා කෙරේ. විශේෂයෙන් උතුරු නැගෙනහිර ආබාධිත තරුණ තරුණියන්ගේ සුබසාධනය සඳහා කිලිනොච්චිය සහ මඩකලපුව නව ඉදිකිරීම් වල අවසන් අදියර වෙත ළඟා වීමට හැකි වී ඇත.

මුල් ළමාවියේදීම ළමුන්ට ඇතිවන කායික හා මානසික ගැටළු අවමකිරීම සඳහා කල් ඇතිව මැදිහත්වී අවශ්‍ය සේවා පහසුකම් සැපයීමට කොළඹ කේන්ද්‍රිය කරගෙන ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය මහරගම පිහිටුවා ඇත. එම මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තුළ සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගැනීමට මෙම වර්ෂයේ හැකිවිය. මෙම වැඩසටහන මගින් සැපයෙන සේවා පුළුල් කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ කොට්ටාව නගරයේ ඉදිකරමින් පවතින ළමා මර්ගෝපදේශ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි 50% ක පමණ වැඩ කටයුතු අවසන් කිරීමට මෙම වර්ෂයේ හැකි විය. දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කොට ඇති ප්‍රධානතම වැඩසටහන් වන මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම, මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම, සමාජගත කිරීම හා මත් නිවාරණ වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම තුළ සැලකිය යුතු මට්ටමක ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවිය. සේවා සපයන නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව, සේවා අභිප්‍රේරණය හා ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා දේශීය විදේශීය වැඩමුළු, සම්මන්ත්‍රණ හා පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම සිදුකොට ඇත.

සමස්තයක් වශයෙන් ගත් කල 2018 වසරෙහි අවාසි සහගත හා පීඩාවන්ට පත් ප්‍රජාව සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තුළ 93.77% ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි වූ බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. 2018 වර්ෂය සඳහා ඉදිරිපත් කළ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රුපියල් 552,780,000ක් වෙන් වූ අතර, සේවා අවශ්‍යතාවන් සපුරාගැනීම සඳහා රුපියල් 521,040,446ක් වියදම් කොට ඇත. මූලධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් 154,880,000ක් වෙන් වූ අතර මෙම වර්ෂය තුළදී අදාළ කාර්යයන් සඳහා රුපියල් 142,539,506ක් වැය විය.

## 9.2 දැක්ම

2030 වන විට ආන්තිකරණයට හා අවාසි සහගත තත්ත්වයන්ට පත් ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සමානාත්මතාවය සපිරි සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ පුරෝගාමියා වීම

## 9.3 මෙහෙවර

ඉලක්ක ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබලගැන්වීම තුළින් සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තීයවේදීමය මැදිහත්වීම මඟින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායීව පර්යේෂණ පැවැත්වීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම

## 9.4 අරමුණු

I. වයස අවු.16 - 35 අතර ආබාධ සහිත තරුණ තරුණියන් 500 දෙනෙකුගේ වෘත්තීමය ක්‍රියාකාරකම් හා බාහිර ක්‍රියාකාරකම් සවිබල ගැන්වීම.
II. භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති ළමුන්100ක් සඳහා නේවාසික රැකවරණය ලබාදීම.
III. වයස අවුරුදු 0 -18 අතර විවිධ ආබාධවලින් පෙළෙන ළමුන් 100 දෙනෙකුගේ ආබාධිත තත්ත්වය අවම කිරීම සඳහා කල්තියා මැදිහත්වීම.
IV. ආබාධ සහිත ප්‍රජාව දෛනික ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම හා බලගැන්වීම .
V. සංඥා භාෂාව පිළිගැනීම හා ප්‍රවර්ධනය.
VI. ආබාධ සහිත තැනැත්තන්ට සේවා සපයන ස්වේච්ඡා සංවිධාන බල ගැන්වීම.
VII. මතට ඇබ්බැහිවූවන් 300ක් නේවාසික පුනරුත්ථාපනය වෘත්තීය කිරීම , පුහුණුව ලබාදීම හා සමාජගත කිරීම.
VIII. විවිධ කාලීන සමාජ ගැටළුවලට ගොදුරු වූ පුද්ගලයින් සඳහා නිවැරදි මාර්ගෝපදේශකත්වය ලබාදීම .
IX. සේවා සපයන නිලධාරීන් කුසලතා ,දැනුම හා ආකල්ප උසස් තත්ත්වයට ගෙන ඒම.
X. ශ්‍රව්‍යාබාධිත වූවන් 500 දෙනෙකු සඳහා ශ්‍රව්‍යාබාධිත හැඳුනුම් පත් ලබා දීම.

## 9.5 2018 වර්ෂය තුළ අත්කරගත් නිමැවුම

I. පුවක්පිටියේ කාන්තා රැකවරණ මධ්‍යස්ථානය ආරම්භ කිරීම.
II. 2018.09.25 ආබාධ සහිත වූ වන්ගේ ජාතික මළල ක්‍රීඩා උළෙල සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පැවැත්වීම.
III. 2018.09.06 ආබාධ සහිත වූවන්ගේ සිත් රූ සංස්කෘතික ප්‍රසංගය සඳහා දිස්ත්‍රික් මට්ටමින් කණ්ඩායම් තරඟ පැවැත්වීම.
IV. සේවා සපයන නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප උසස් තත්ත්වයට ගෙන ඒම සඳහා විෂය සමගාමී පුහුණු හා වෘත්තීය සංවර්ධන පුහුණු පැවැත්වීම.

V. ආබාධ සහිත තරුණ තරුණියන්ගේ ක්‍රිඩා හා අළුත් අවුරුදු උළෙල 2017.04.28 බත්තරමුල්ල ජී.එච් . බුද්ධදාස ක්‍රීඩාංගනයේ දී පැවැත්වීම.

VI. කිලිනොච්චිය හා මඩකලපුව ආබාධ සහිත තරුණ ප්‍රජාව වෙනුවෙන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන කටයුතු ආරම්භ කිරීම.

VII. කොට්ටාව ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීම.

## 9.6 අනුමත වාර්ෂික අයවැය - 2018

| ප්‍රාග්ධන (රු.මි) | පුනරාවර්තන (රු.මි) |
|---|---|
| 154.88 | 552.78 |

## 9.7 2018.01.01 - 2018.12.31 දක්වා වියදම

| | ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන (රු.මි) | 154.88 | 142.54 |
| පුනරාවර්තන (රු.මි) | 552.78 | 521.04 |
| එකතුව | 707.66 | 663.58 |

## 9.8 2018.01.01 - 2018.12.31 දක්වා ක්‍රියාත්මක කල ව්‍යාපෘති/ ක්‍රියාකාරකම්වල තොරතුරු

| | |
|---|---|
| වැඩසටහන - අංක 01 | ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩ සටහන (සී. බී. ආර්.) |
| ක්‍රියාකාරකම් | 1.ආබාධ සහිත වූවන් සඳහා සෘජු ප්‍රතිපාදන ලබා දීම හා පසුහාර කටයුතු සිදු කිරීම<br>2.කොමඩ්, ජලය, විදුලි බල පහසුකම් හා ප්‍රවේශ පහසුකම් ලබා දීම.<br>3.ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.<br>4.රාජ්‍ය හා රාජ්‍ය නොවන වෙනත් සංවිධාන සමඟ ඒකාබද්ධවී සේවා අවශ්‍යතා ලබා ගැනීමට පහසුකම් ඇති කිරීම.<br>5.ආබාධිත ළමුන් සඳහා පවත්වාගෙන යනු ලබන කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීම. |
| ස්ථාන | දිස්ත්‍රික්ක 25 |
| ඉලක්ක කණ්ඩායම | දිවයිනේ ජීවත්වන සියලුම ආබාධිත ප්‍රජාව |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| 2018.12.31 දක්වා වියදම | රු. මි. 14.503 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 02 | ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම , පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීම |
| ක්‍රියාකාරකම් | 1.ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම.<br>2.විධිමත් පරිදි පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් සඳහා සහතික පත් ලබා දීම හා සමාජ ගත කිරීම.<br>3.ස්වයංරැකියා සඳහා මෙවලම් කට්ටල ලබා හා දීම විවෘත වෙළඳපොල අංශයේ රැකියා අවස්ථා හඳුන්වාදීම |
| ස්ථාන | ▪ සීදුව වෘත්තීය පුහුණු ආයතනය - ගම්පහ දිස්ත්‍රික්කය<br>▪ රාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - ගම්පහ දිස්ත්‍රික්කය<br>▪ අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය - ගම්පහ දිස්ත්‍රික්කය<br>▪ වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය - මහනුවර දිස්ත්‍රික්කය<br>▪ කැටවල වෘත්තීය පුහුණු ආයතනය - මහනුවර දිස්ත්‍රික්කය<br>▪ තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය- හම්බන්තොට දිස්ත්‍රික්කය<br>▪ කලවාන වෘත්තීය පුහුණු ආයතනය - රත්නපුර දිස්ත්‍රික්කය<br>▪ මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය - පුත්තලම දිස්ත්‍රික්කය |
| ඉලක්ක කණ්ඩායම | වයස අවු.16-35 අතර වෘත්තීය පුහුණුවට සුදුසු අබාධ සහිත තරුණ තරුණියන් |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| 2018.12.31 දක්වා වියදම | රු. මි. 50.78 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 03 | ළමා මාර්ගෝපදේශ වැඩසටහන |
| ක්‍රියාකාරකම් | 1.ළමා ආබාධ කල් ඇතිව හඳුනාගෙන ඒ සඳහා මැදිහත්වීමේ වඩාත් ඵලදායී ක්‍රමවේදයන් හඳුන්වා දීම.<br>2.ආබාධ සහිත දරුවන්ට සේවා සැපයීම සම්බන්ධව විවිධ ක්ෂේත්‍රවලට අදාළ සේවා ජාලය ශක්තිමත් කිරීම<br>3.විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මුල් ළමාවිය අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම.<br>4.දෙමාපියන්ගේ හා පවුලේ සාමාජිකයන්ගේ මානසික තත්වය වඩාත් යහපත් තත්වයට ගෙන එම සඳහා උපදේශන සේවා පවත්වාගෙන යාම.<br>5.ව්‍යාපෘතිය වෙනත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කිරීම. |
| ස්ථාන | පතිරගොඩ, වෙල පාර, නාවින්න - මහරගම ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය |
| ඉලක්ක කණ්ඩායම | වයස අවු. 0 – 18 දක්වා |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| 2018.12.31 දක්වා වියදම | රු. මි. 3.25 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 04 | දෙමව්පියන් සහ භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන් සඳහා රැකවරණය ලබා දීම |
| ක්‍රියාකාරකම් | 1. බුද්ධි ඌණතා ඇති ළමුන් 100 ක් සඳහා රැකවරණය සැපයීම.<br>2.ඔවුන් නිසා පවුල්වල සාමාජිකයින් අතර ඇතිවන කායික හා මානසික ගැටළු අවම කිරීම.<br>3.පවුලේ සෙසු සාමාජිකයින්ගේ ආර්ථික, අධ්‍යාපන හා සංස්කෘතික දියුණුව සඳහා මැදිහත් වීම. |

| | |
|---|---|
| ස්ථාන | අවිස්සාවේල්ල පුවක්පිටිය ජයවිරු සෙවන ළමා නිවාසය |
| ඉලක්ක කණ්ඩායම | භාරකරුවන් අහිමි බුද්ධි ඌනතා ඇති පිරිමි ළමුන් |
| ප්‍රතිඵලය | බුද්ධි ඌණතා ළමුන් සඳහා 74 ක් සඳහා රැකවරණය ලබා දීම |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| 2018.12.31 දක්වා වියදම | රු. මි. 5.31 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 05 | දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල |
| ක්‍රියාකාරකම් | 1. ස්වයං රැකියා කරගෙන යාම සඳහා ආධාර සැපයීම.<br>2. ක්‍රීඩා කටයුතු පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීමට ආධාර සැපයීම.<br>3. අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා ආධාර සැපයීම.<br>4. දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන්ට ශිෂ්‍යාධාර ලබාදීම.<br>5. උසස් පෙළ හදාරන දෘශ්‍යාබාධිත සිසුන් සඳහා මුදල් ආධාර සැපයීම.<br>6. අඩු ආදායම්ලාභීන්ට නොමිලයේ අක්ෂිකාච ලබා දීම.<br>7. සුබසාධන කටයුතු පවත්වාගෙන යාම.<br>8. දෘශ්‍යාබාධිත කාන්තා සුබසාධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.<br>9. පරිපාලන කටයුතු පවත්වාගෙන යාම.<br>10. විභාග ගාස්තු ගෙවීම.<br>11. අවශ්‍යතා මත අරමුදලේ පරමාර්ථයන් ඉටු කිරීම සඳහා විවිධ වියදම් දැරීම.<br>12. වලතාවය හා දිසානතිය පුහුණු ලබාදීම සඳහා උපදේශන දීමනා ගෙවීම |
| ස්ථාන | සමාජ සේවා දෙපාර්තමේන්තුව |
| ඉලක්ක කණ්ඩායම | දෘශ්‍යාබාධිත පුද්ගලයින් |
| ප්‍රතිඵලය | අන්ධජන සේවා මණ්ඩලය උපදේශකවරුන් 07 ක් සඳහා හා පුහුණුලාභීන් 16ක් සඳහා ගෙවීම් කිරීම, ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත උපාධිධාරි මණ්ඩලය දෘශ්‍යාබාධිත ගුරුවරුන් 60 ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළුව, කථන ග්‍රන්ථ 45 ක් සැකසීම, උසස් පෙළ සිසුන් 22 ක් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම (මාසිකව රු. 2000/- බැගින්), විශ්වවිද්‍යාල සිසුන් 101ක් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම(මාසිකව රු. 1000/- බැගින්), දෑස් නොපෙනන දෙමාපියන්ගේ දෑස් පෙනෙන එක් දරුවෙකුට මාසිකව රු.500/- බැගින් දරුවන් 208ක් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම, අ.පො.ස. (සා.පෙළ) දෘශ්‍යාබාධිත සිසුන් 87 ක් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම (මාසිකව රු. 750/- බැගින්), කාලය සඟරාව (බ්‍රේල් ) 90 ක් සකස් කර බෙදාහැරිම සඳහා මාසිකව රු.13500/- ආධාර ගෙවීම, දෘශ්‍යාබාධිත වූවන් 350ක් සහභාගිත්වයෙන් සුදුසැරයටි දින සැමරුම් උත්සවය පැවැත්වීම, විශ්ව විද්‍යාල දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයන් 25 ක් සඳහා රු.26,000/- වටිනා E10 daisy Recorder ලබාදීම, |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| 2018.12.31 දක්වා වියදම | රු. මි. 7.33 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 06 | ආබාධ සහිත දරු දැරියන්ගේ ජාතික සංස්කෘතික කලා ප්‍රසංගය - සිත් රූ - 2018 හා ජාතික මළල ක්‍රීඩා උළෙල - 2018 |
| ක්‍රියාකාරකම් | 1.දිස්ත්‍රික් මට්ටමින් තරඟ පැවැත්වීම<br>2.ආබාධිත දරු දැරියන්ගේ කලා හා ක්‍රීඩා තරඟ |
| ස්ථාන | දිස්ත්‍රික්ක 25 |
| ඉලක්ක කණ්ඩායම | දිවයිනේ ජීවත්වන සියළුම ආබාධිත ප්‍රජාව |
| ප්‍රතිඵලය | ආබාධිත තරුණ තරුණියන් සවිබල ගැන්වීම |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| 2018.12.31 දක්වා වියදම | රු. මි. 14.54 |

| | |
|---|---|
| වැඩසටහන - අංක 07 | මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීමේ ව්‍යාපෘතිය |
| ක්‍රියාකාරකම් | 1.මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම ,වෘත්තීය හැකියාවන් වැඩි දියුණු කිරීම හා සමාජ ගත කිරීම.<br>2.මත් ද්‍රව්‍ය ඇබ්බැහි වීම නිසා ඔවුන්ගේ පවුල් පරිසරය තුළ හටගෙන ඇති ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම.<br>3.මත් ද්‍රව්‍ය භාවිතය නිසා බිඳවැටුණු රැකියාවන් හා අධ්‍යාපනය කටයුතු යථා තත්වයට ගෙන ඒම සඳහා අදාල පාර්ශවයන් සමග සම්බන්ධතා ගොඩනැගීම.<br>4.අවදානම් කණ්ඩායම් සඳහා මත් ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |
| ස්ථාන | අවිස්සාවේල්ල, පුවක්පිටිය, නොර්ත් අම්බලම් වත්ත, ජයවිරු සමාධි නිවහන |
| ඉලක්ක කණ්ඩායම | මතට ඇබ්බැහි වූවන් 100 ක් පුනරුත්ථාපනය සඳහා ඇතුළත් කර ගැනීම |
| ප්‍රතිඵලය | අභ්‍යාසලාභීන් 302ක් පුනරුත්ථාපනය වී සමාජගත කර ඇත |
| කාල සීමාව | 2018.01.01 – 2018.12.31 |
| 2018.12.31 දක්වා වියදම | රු. මි. 2.97 |